යම් නිර්ධනසත්වකෙණෙක් ඇද්ද; තෙසඤ්ච, ඔවුන්ටද; ධනං, ධ
ස්තුව; අනුප්පදජ්ජෙය්‍යාසි, ප්‍රදානය කරව; තාත, (පින්වත්) පුත්‍රය;
තෙ විජිතෙ, තාගේ (අණපවත්නා) නුවරෙහි; මදප්පමාදපටිවි
රතා, නවප්‍රකාරමානාහංකාරයෙන් හා පඤ්චකාමගුණයෙන් වැ
ළැක්කාවූ; ඛන්තිසොරච්චෙ, (අධිවාසන) ක්‍ෂාන්තිසුරතභාවයෙ
හි; නිවිට්ඨා, පිහිටියාවූ; යෙ සමණබ්‍රාහමණා, යම් ශ්‍රමණබ්‍රාහ්ම
ණ කෙණෙක්; එකං අත්තානං, එකම ආත්මයක්; දමෙන්ති, (ඉ
න්ද්‍රිය දමනාදි වශයෙන්) දමනය කෙරෙද්ද; එකං අත්තානං,
එකම ආත්මයක්; සමෙන්ති, (අලොභ අද්වේෂාදිය පැවැත්වී
මෙන් සමනය කෙරෙද්ද; එකං අත්තානං, එකම ආත්මයක්;

පරිනිබ්බාපෙන්ති, (ක්ලේශපරිනිර්වාපණයෙන්) නිර්වාපණය කෝරෙද්ද; තෙ, ඒ (ශ්‍රමණ බ්‍රාහ්මණයින් කරා;) කාලෙන කාලං, කලින් කල; උපසංකමිත්වා, එළඹ; භන්තෙ, ස්වාමීන්වහන්ස; කිං කුසලං?, (ඉෂ්ටවිපාකවූ) කුසල්නම් කවරේද?; කිං අකුසලං?, (අනිෂ්ටවිපාකවූ) අකුසල්නම් කවරේද?; කිං සාවජ්ජං?, සාවද්‍ය නම් කවරේද?;කිං අනවජ්ජං?, නිරවද්‍යනම් කවරේද?;කිං සෙවිතබ්බං?, කුමක් සෙවනය(භජනය පර්‍යුපාසනය)කටයුතුද?; කිං න සෙවිතබ්බං?, කුමක් සෙවනාදිය නො කටයුතුද?; මෙ, මා විසින්; කිං කයිරමානං, කුමක් කරණු ලබන්නේ; දීඝරත්තං, බොහෝකාලක්; අහිතාය, අවැඩ පිණිස; දුක්ඛාය, දුක්පිණිස; අස්ස, වන්නේද; මෙ, මා විසින්; කිංවාපන, කුමක්හෝ; කයිරමානං, කරණුලබන්නේ; හිතාය සුඛාය, හිතසැප පිණිස; අස්සාති, වන්නේදැයි කියා; පරිපුච්ඡෙය්‍යාසි, විචාරන්නෙහිය; පරිපඤ්හෙය්‍යාසි, ප්‍රශ්නකරන්නෙහිය; ඉති, මෙසේ; තෙසං සුත්වා, ඔවුන්ගේ වචනය අසා; යං අකුසලං, (අනිෂ්ටවිපාකවූ)යම් අකුශලයක් ඇද්ද; තං, ඒ(අකුශලය;) අභිනිවජ්ජෙය්‍යාසි, (ගිනිසෙයින් ආශිවිෂසෙයින්) දුරුකරව; යං කුසලං, (ඉෂ්ටවිපාකවූ තුෂ්ටිප්‍රදානයකරණ) යම් කුශලයක් ඇද්ද; තං, ඒ(කුශලධර්මය); සමාදාය, (ගෙළෙහි පලඳනාවූ මුතුහරක්මෙන්ද මුදුන්මල්කඩක් සෙයින්ද) මනාකොටගෙණ; වත්තෙය්‍යාසි, පවත්නුව (හෙවත්) සමාදන්ව පවත්නුව; තාත, පිතෘදුක්ඛය පූනනය කරණහෙයින් පුත්‍රය; ඉදං බො, මෙය වනාහි; අරියං චක්කවත්තිවත්තං,(උත්තමයන් විසින් හැසිරිය යුතු)ආර්‍ය්‍යචක්‍රවර්ත්තිවතැයි කියා (පුත්‍රයාට ප්‍රගුණකරවූයේය).

(ඇතුළුජනයාහා බලසෙනගට පවත්වනලද සක්විතිවත්ය රජයම් පැමිණි ක්ෂත්‍රියරජුන් කෙරෙහි පවත්වනලද සක්විතිවතෙක; රාජ්‍යයට නොපැමිණි අනුයුක්ත ක්ෂත්‍රියයන් කෙරෙහි පවත්වන සක්විතිවතෙක, මහණබමුණන්කෙරෙහි පවත්වනලද සක්විතිවතෙක,නිගමජනපදයන්කෙරෙහි පවත්වනලද සක්විතිවතෙක, මෘගපක්ෂීන් කෙරෙහි පවත්වනලද සක්විතිවතෙක පව්කරන්නවුන් වැළැක්වීම සක්විතිවතෙක; දුප්පතුන්ට වස්තුදීම සක්විතිවතෙක; මහණබමුණන්ට ශ්‍රමණපරිෂ්කාරදීම සක්විතිවතෙක; ඔවුන් කරා එළඹ කුසල් අකුසල් විචාරා බණඇසීම සක්විති වතෙක; මේ දශවිධ චක්‍රවර්ත්තිවත්නම් වන්නේය; ගෘහපතීන් හා පක්ෂීන් වෙන්වෙන් කොට ගත්කල්හි ද්වාදශප්‍රකාර චක්‍රවර්ත්තිවත් නම් වන්නේයි).

ජිතබ්බෙ, (ජිතක්ලේශාද්‍යරීයෙන්) මහණෙනි, මුඛාවසිතෙතා, රාජ්‍යයෙන් ඔටුනු පැළැන්දාවූ; ඛත්තියො, (ක්ෂේත්‍රාධිපතිහෙයින්)ක්ෂත්‍රිය නම්වූ; රාජා,(සතරසංග්‍රහවස්තුවෙන් ජනරඤ්ජන

කාරණහෙයින්)ක්ෂත්‍රියරජතෙම; එවං දෙවාති ඛො, එසේය දෙව
යන්වහන්සැයි කියා; රාජිසිස්ස පටිස්සුත්වා, රාජ ඍෂීන්ගේ වචනය
පිළිගෙණ; අරියෙ චක්කවත්තිවත්තෙ, ආර්‍ය්‍යවූ (දශවිධ) චක්‍රවර්ත්ති
වතෙහි; පවත්තති, පැවැත්තේය; තදහුපොසථෙ පණ්ණරසෙ, එද
වස්පෞර්ණමාසීපොහෝයෙහි; සීසං නහාතස්ස, සුවඳ පැන් සො
ළොස් කලයකින් ශීර්ෂස්නානයකොට; උපරිපාසාදවරගතස්ස, (ස
ර්වසම්පත්තීන් ප්‍රසාදකරවූ) ප්‍රාසාදයාගේ මතුමහල්තලයට පැමි
ණ; උපොසථිකස්ස, පොහොය අෂ්ටාඞ්ගශීලය සමාදන්වූ; තස්ස,
ඒ(ක්ෂත්‍රියවංශොද්භූතවූරජහට;) සහස්සාරං, (ඉන්ද්‍රනීලමාණික්‍ය
මය) දහසක් අරින් යුක්තවූ; සනාභිකං සනෙමිකං, නාභිනිම්වල
ලු සහිතවූ; සබ්බාකාරපරිපූරං, (එහෙයින්) සර්වාකාරයෙන් පරිපූ
ර්ණවූ; දිබ්බං චක්කරතනං, දිව්‍යමයවූ චක්‍රරත්නය; පාතුරහොසි,
ප්‍රාදුර්භූතවූයේය; දිස්වා, ඒ දැක; මුද්ධාවසිත්තස්ස, මූර්ධාවෂික්තවූ; ඛ
ත්තියස්ස රඤ්ඤො, ක්ෂත්‍රියරජහට; එතදහොසි, මෙසේ සිතක් ප
හළවූයේය;තදහුපොසථෙ පණ්ණරසෙ,එදවස්පෞර්ණමාසී(චන්ද්‍ර
කාන්තියෙන් යුක්තවූ)පොහෝයෙහි,සීසං නහාතස්ස, ශීර්ෂස්නාන
යකොට; උපොසථිකස්ස, උපෝසථාෂ්ටාඞ්ගශීලොපලක්ෂිතවූ; උ
පරිපාසාදවරගතස්ස, ප්‍රාසාදවරප්‍රාප්තවූ; මුද්ධාවසිත්තස්ස, මූර්ධාවෂි
ක්තවූ; ඛත්තියස්ස, ක්ෂත්‍රියවංශොද්භූතවූ; යස්ස රඤ්ඤො, යම් ර
ජක්හට;සහස්සාරං, සහස්‍රාරොපෙතවූ; සනෙමිකං, නෙම්‍යුපලක්ෂි
තවූ; සනාභිකං, නාභිසමන්වාගතවූ; සබ්බාකාරපරිපූරං, සර්වා
කාරයෙන් පරිපූර්ණවූ; දිබ්බං චක්කරතනං, දිව්‍යචක්‍රරත්නය; පා
තු භවති, පහළ වේද; සො රාජා, ඒ (චක්‍රරත්නොපලක්ෂිතවූ)රජ
තෙම; චක්කවත්ති හොතීති, චක්‍රවර්ත්ති රජ වන්නේයයි; මෙ, මා
විසින්; එතං සුතං ඛො පන, අසනලද්දේමය; අහං, මම; (එකාන්
තයෙන්) චක්කවත්තිරාජා අස්සං ඛොහි, චක්‍රවර්ත්තිරජවෙම්මයයි
කියා (ඒ රජහට නිශ්චිතවූ සිතක් පහළවූයේය;) අථ ඛො, ඉක්
ඛිත්තෙන්; භික්ඛවෙ, (සංසාරෙභයං ඉක්ඛති. යන අර්ථයෙන්
සංසාරභය නිරීක්ෂණය කරන්නාවූ)මහණෙනි; මුද්ධාවසිත්තො, මූ
ර්ධාවෂික්තවූ; ඛත්තියො රාජා, (රාජවංශොද්භූතවූ) ක්ෂත්‍රියරජතෙ
ම; උට්ඨායාසනා, හුන් ආසනයෙන් නැගිට ගෙණ (චක්‍රරත්නය ස
මීපයට ගොස්;)එකංසං උත්තරාසඞ්ගං කරිත්වා,(ලක්ෂසුවහසක් ව
ටනා දිව්‍යසළුවක්) එකාංශකොට (බහා පොරවා;) වාමෙන හත්ථෙ
න, කල්පවෘක්ෂයෙන් පහළ සුවර්ණාවරොහයක් වැනිවූ)වාමහස්ත
යෙන්; භිංකාරං ගහෙත්වා, (හස්තිසොණ්ඩයක් හා සමානපුණාලි
යෙන් උපලක්ෂිතවූ) සුවර්ණභඞ්ගාරය (උස්කොට) ගෙණ; දක්ඛි
ණෙන හත්ථෙන, දක්ෂිණහස්තයෙන්; භවං චක්කරතනං, පින්
වත් චක්‍රරත්නය; පවත්තතු, (මාගේ ආඥාචක්‍රය කොදෙව් දෙදහ

සක් පිරිවරණලද සතරමහත් ඕපයෙහි) පවත්වව; භවං චක්කර
තනං,පින්වත්වූ චක්‍රරත්නය; අභිවිජිනාතුති,(සතරමහත් දිවයින
වාසීන්) ජයගෙණ දෙවයි කියා; චක්කරතනං අබ්භුක්කිරි, චක්‍ර
රත්නයට පැන් වැඩූයේය; අථඛො, ඉක්බිත්තෙන්; භික්ඛවෙ, මහ
ණෙනි; චතුරඞ්ගිනියාසෙනාය සද්ධිං, චතුරඞ්ගිනිසෙනාව හා
සමග; චක්කවත්තිරාජා, චක්‍රවර්තිරජ; අන්වදෙව, අනුබන්ධනයම
කෙරෙයි; තං චක්කරතනං, ඒ චක්‍රරත්නය; පුරත්ථිමං දිසං,(පැන්
වැඩූ කෙණෙහි අහසට පැනනැගී) පූර්වදිශාවෙහි; පවත්ති, (සිව්
රඟසෙනගින් යුක්තවූ චක්‍රවර්තිරජ්ජුරුවන් හා සමග) පැවැත්
තේය.

(පැන්වැඩූ මාත්‍රයෙන්ම චක්‍රරත්නය ආකාශයට පැනනැගී ප
වත්නේය; යම් රජක්හට චක්‍රරත්නයාගේ මෙවැනි ප්‍රවෘත්ති
යක් ඇත්නම් ඒ රජතෙමේ හැමකල්හිම චක්‍රවර්තිනම් වෙයි;
චක්‍රරත්නය ආකාශයට පැනනැගී කල්හි ඒ චක්‍රරත්නය අනුබන්ධ
නය කෙරෙමින් චක්‍රවර්තිරජතෙමේ ප්‍රවරයානාරූඪව අහසට
පැනනැගෙන්නේය, ඉක්බිත්තෙන් ඒ චක්‍රවර්තිරජහට සේසත්
චාමර මුතුකුඩ ආදිය ගන්නාලද අත්ඇති පිරිවරජනයෝ තමත
මන්ගේ නානාප්‍රකාර රත්කවචාදියෙන් සන්නාහ සන්නද්ධව සෑ
රහෙනලද විචිත්‍රාභරණප්‍රභාසමූහයෙන් දිලියෙමින් නගනලද ජ
යකුන්තපතාකාදියෙන් අලඞ්කෘත කොට තමතමන්ගේ බල
සමූහයා සමග යුවරජසෙනාපතීන් පටන් හැමදෙනාම ආකාශය
ට පැනනැගී රජ්ජුරුවන් පිරිවරන්නාහුය රාජඅමාත්‍යයෝ වනාහි
මහාජනයාට සංග්‍රහ පිණිස අපගේ රජහට චක්‍රරත්නයක් පහළ
වූයේය; තමතමන්ට සුදුසු සුදුසු පරිද්දෙන් ආභරණ පලඳනාව
ලින් සැරහී රැසි වේවයි කියා නගර වීථිවල බෙර ලවන්නාහ මහා
ජනයෝ වනාහි ප්‍රකෘතියෙන්ම චක්‍රරත්නයාගේ මධුරශබ්දශ්‍ර
වණයෙන්ම තමතමන්ගේ සියලු කටයුතු හැර සුවඳදුම් සුවඳසු
ණු සුවඳමල් ආදිය ගෙණ රැස්ව සියල්ලෝම සුළඟින් ගසා ආකා
ශයට ගෙණියන රළුපතරසමූහයක් සෙයින් අහසට පැනනැගී
චක්‍රවර්තිරජ්ජුරුවන් පිරිවරා ගණිති ඔවුන් අතුරෙන් යමෙක් ය
මෙක්හට වනාහි රජහා සමග යනු කැමැතිසිත උපදීද ඒඒ තෙමේ
ආකාශයට පැනනැගෙන්නේම වෙයි මෙසේ දෙලොස් යොදු
නෙක පැතිර සිටින පිරිස් වෙයි ඔවුන් අතුරෙන් එකම පුරුෂයකු
දු රෙගියෙක් වත් කිලුටු වස්ත්‍ර ඇත්තෙක් වත් නොම ඇත්තේය,
චක්‍රවර්තිරජ වනාහි බ්‍රහ්මපිරිසක් හා සමාන පවිත්‍රපිරිස් ඇති
වෙයි ආකාශයෙන් යන්නාවූ ඉන්ද්‍රනීලමාණික්‍යතලයෙහි විප්‍ර
කීර්ණ රත්නසමූහයක් හා සමාන වන්නේය චක්‍රරත්නය වනාහි
වෘක්ෂාග්‍රයන්ගේ මතුමත්තෙහි ඉතා උස්නොව ගගනතලප්‍රදේශ
යෙන් යන්නේය යම්සේ සුපුෂ්පිතපලුපලලවයන් සැපසේ ගත

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

හැකි වෙද්ද යම්සේ බිම සිටිනහු මේ රජය මේ යුවරජය; මේ මහා
සෙනෙවියයි කියා සැලකරන්නට හැකි වෙද්ද එපමණ උසින් ච
ක්‍රරත්නය පවත්නේය යමෙක් යමෙක් ඉඳුම් සිටුම් සැතපීම් සක්
මන් කිරීම් යන සතර ඉරියව්වෙන් යනු කැමැති වේද ඒ ඒ තෙමේ
කැමැති ඉරියව්වකින් ආකාශයෙන් යන්නේය යම් යම් කෙණෙක්
යම් යම් කර්මාන්තයක් කෙරෙමින් යනු කැමැති වෙද්ද ඔහු තමත
මන්ට කැමැති කැමැති කර්මාන්ත කෙරෙමින් යෙති මෙසේ චක්‍රව
ර්ත්ති පිරිස් ගෙණ එම චක්‍රරත්නය වාම පාර්ශ්වයෙන් මහමෙර හැ
ර මහාසමුද්‍රයට මත්තෙන් සත්දහසක් පමණ යොදුන්ඇති පූර්ව්වි
දෙහයට යන්නේය පුළුලින් දොළොස්යොදුනෙක වටින් සතිස්
යොදුනෙක පැතිර පවත්නාවූ පිරිස් රැස්වීමට සමවූ සුලභමධු
රාහාරපානවගෝපකරණයෙන් සම්පූර්ණවූ මනොඥ සාන්ද්‍රච්ඡා
යාසම්පන්නවූ මනාසමතලභූමියෙන් රමණීයවූ භූමිප්‍රදෙශයා
ගේ මත්තෙහි චක්‍රරත්නය අකුරක් ගැසුවාක්මෙන් අහස්හි පිහි
ටන්නේය, ඒ සංඥවෙන් මහජනයෝ ආකාශයෙන් බැස කැමැති
සේ ශිර්ෂස්නානභොජනාදි සියලු කෘත්‍යයන් කෙරෙමින් වාසය
කෙරෙති එහෙයින් "යස්මිං ඛො පන භික්ඛවෙ" යනාදි පාලිය ව
දැළසේක )

භික්ඛවෙ, මහණෙනි; යස්මිං පදෙසෙ ඛො පන, (කුසුමාමො
ද මුදිතමක්‍ෂුසිච්තමධුකරනිකරනිරන්තරප්‍රවරමෘදුපුලිනතලාභි
රම්‍යවූ) යම් ප්‍රදෙශයෙක්හි වනාහි, චක්කරතනං, බාලාර්කමණ්ඩ
ලයක්මෙන් බොරජනාවූ චක්‍රරත්නය; පතිට්ඨාසි; (යථොක්ත
ක්‍රමයෙන් ආකාශයේ) පිහිටුනේ වේද; තත්‍ථ, (මනොඥ ඡායා
සම්පන්නමුදුපුලිනතලාදීන් රමණීයවූ) ඒ භූමිභාගයෙහි; චතුර
ඞ්ගිනියාසෙනාය සද්ධිං, චතුරඞ්ගිනී සෙනාවහා සමග; චක්කව
ත්ති රාජා; පෘථිවිතලප්‍රදීපායමානවූ චක්‍රවර්ත්තිරජතෙම; වාසං උප
ගච්ඡති, වාසයටපැමිණියේය.

මෙසේ චක්‍රවර්ත්තිරජ වාසොපගතකල්හි පූර්ව්විදෙහ නම්
දිවයින අනෙකප්‍රකාර රජදරුවෝ මේ අන්‍යකෙණෙකුත්ගේ
ආඥවයයි අසාත් බලසමූහයා රැස්කොට යුධයට නොසැරහෙන්
නාහුය චක්‍රරත්නයාගේ ආනුභාවයෙන්ම චක්‍රවර්ත්තිරජහට හැ
මසතුරෝම දමනය වන්නාහ එහෙයින් සියලුම රජදරුවෝ තම
තමන්ගේ රාජශ්‍රීසම්පත්තියට සෑහෙන්නාවූ පඬුරුගෙණ චක්‍රව
ර්ත්ති රජ්ජුරුවන්කරා එළඹ තමතමන්ගේ කිරුළුමාණික්‍යරශ්මි
යෙන් සක්විතිරජ්ජුරුවන්ගේ පාපිසුම් පිරිසිදුකරමින් "එහි ඛො
මහාරාජ" යනාදි වචනයෙන් ඒ චක්‍රවර්ත්තිරජ්ජුරුවන්ට යාච්ඤා ක
රන්නාහ, එහෙයින් "සෙ ඛො පන භික්ඛවෙ පුරත්ථිමාය දිසාය"
යනාදි පාලිය පටන් ගෙණ වදාළසේක—භික්ඛවෙ, මහණෙනි;

පුරත්ථිමාය දිසාය, පූර්වදිශාවෙහි; යෙ පටිරාජානො, යම්බඳු අන්‍ය රජදරුකෙණෙක් ඇද්ද; තෙ ඛො පන, ඔහු වනාහි; චක්කවත්තිං රාජානං උපසංකමිත්වා, චක්‍රවර්තිරජ්ජුරුවන් කරා එළඹ; එවමාහංසු, මෙසේ දන්වූවාහුය; මහාරාජ, මහරජ්ජුරුවන්වහන්ස; එහි ඛො, මෙසේ වැඩවදාළමැනව; මහාරාජ, මහරජ්ජුරුවන්වහන්ස; සාගතං, නුඹවහන්සේගේ ගමන ඉතා යහපත් වන්නේය; මහාරාජ, (සකලජනමනුජරාජකුඤ්ජරසන්දොහමෘගෙන්ද්‍රාය මානවූ) මහරජ්ජුරුවන්වහන්ස; සකමෙත, (කොදෙව් දෙදහසකින් පිරිවරණලද සතරමහද්වීපය ඇතුළුවූ වටින් සතිස් ලක්ෂදශදහස්නුන්සිය පණස්යොදුන් චක්‍රවාටාභ්‍යන්තරය) නුඹවහන්සේ සන්තකය; මහාරාජ, (රාජකුඤ්ජරප්‍රවරමෘගෙන්ද්‍රායමානවූ) මහරජ්ජුරුවන්වහන්ස; අනුසාස ඉති, අපට අනුශාසනා කරවදාළමැනවැයි; (මෙසේ රජ්ජුරුවන්ට සැලකළාහුය;) චක්කවත්තිරාජා, (මට මෙනම් පඬුරුදෙව අනිකක්හුගේ කෙත්වත් අරම් ආදියක් පැහැර ගෙණ අනිකක්හට දෙවයි යනාදිවශයෙන් ජේදනභේදනඅනුශාසනාවක් නැතිව තමන්ගේ දශරාජ ධර්මයට සුදුසු අනුශාසනා කරන්නාවූ) චක්‍රවර්තිමහරජතෙම; එවමාහ, (ප්‍රේමණීයකර්ණාමෘත ස්වරයෙන් "පාණො නහන්තබ්බො" යනාදීන් අවවාදවශයෙන්) මෙසේ කියන්නේය; පාණො, (තීව්‍රදුස්සහ කටුකතර දුඃඛවිපාක ප්‍රදානයෙන් යුක්තවූ) ප්‍රාණඝාතය; නහන්තබ්බො, නොකටයුත්තේය; (හෙවත් තමා උපමාකොට)සතුන් නොමැරිය යුත්තේය;] අදින්නං, අදත්තාදානය(හෙවත් පරසන්තකහිරණ්‍යසුවර්ණාදිවස්තුව;) නාදාතබ්බං, (සොරකම්කිරීම් වශයෙන්) නොගත යුත්තේය; කාමෙසු, (රූපශබ්දගන්ධරසස්පර්ශය යන පඤ්චවිධ) කාම කොට්ඨාසයෙහි; මිච්ඡා,(වරදවා පිළිපැදීමයයි කියනලද) මිථ්‍යාප්‍රතිපත්තිතොමෝ; නචරිතබ්බා,(ආදීනව අනිෂ්ටවිපාකවශයෙන් දුන)නොහැසිරියයුත්තීය; මුසා,(වාක්විසංවාදනාභිප්‍රායෙන් බොරුකියන්නාහුගේ පරවිසංවාදනය කරණ කායවාක්ප්‍රයොගයෙන්) නැත්තාවූ චෙතනාව; නභාසිතබ්බා, නොකියයුත්තීය (හෙවත් පෘථිවිප්‍රදලනයකොට අපායනාක්වන බොරු නොකිය යුත්තීය;) මජ්ජං, (උම්මත්තකනිර්ලජ්ජාදි දුඃඛසොකවිරූපවිපාකාදිය ජනනය කරන්නාවූ) සුරාපානය; න පාතබ්බං, (පිපාසාඅහංකාරය පිණිස) පානය නොකටයුත්තේය; යථාභුත්තඤ්ච, අනුභවකළ යුත්තක්; භුඤ්ජථාති, අනුභවකරවයි කියා අවවාදවශයෙන් කියන්නේය.

(කිමෙක්ද? සියල්ලෝම වනාහි චක්‍රවර්තිරජ්ජුරුවන්ගේ අවවාදය ගන්නාහු දැයි යතහොත් සර්වඥයන්ගේ පවා අවවාදය

සියල්ලෝම නොගන්නාහුය එහෙයින් යම් පණ්ඩිතරජදරුකෙණෙක් ඇද්ද ඔහු වනාහි සක්විතිරජහුගේ අවවාදගන්නාහුය සෙස්සෝ වනාහි ඒ චක්‍රවර්තිරජ්ජුරුවන්ට අනුවපවත්නාහුය එහෙයින් බෘහදුරක බෘහදුවජ්‍රනවරණාරවින්දවනෙන්දුපශොභිත සර්ව සත්වයන්ට අත්‍යන්තොපකාරිවූ ත්‍රිලෝගුරුබුද්ධරජානන්වහන්සේ "යෙ ඛො පන භික්ඛවෙ පුරත්ථිමාය දිසාය පටිරාජානො" යනාදි පාලිය වදාළසේක.)

භික්ඛවෙ, මහණෙනි; පුරත්ථිමාය දිසාය, ප්‍රාචීනදිශාභාගයෙහි; යෙ පටිරාජානො, (නොයෙක් දහස්ගණන්) යම් පරශත්‍රුරජකෙණෙක් ඇද්ද; තෙ ඛො පන, ඔහු වනාහි; චක්කවත්තිස්ස රඤ්ඤො, (සර්වභෞමෙන්ද්‍රවූ) චක්‍රවර්තිරජහට; අනුයුත්තා අහෙසුං, අනුව පැවැත්තාහුය.

(ඉක්බිත්තෙන් ඒ චක්‍රරත්නය මෙසේ පූර්වවිදෙහවාසීන්ට අවවාදදුන්කල්හි උදෑසන්හි අනුභවකරණලද ආහාරඇති සක්විති බලපිරිස් හා සමග චක්‍රවර්තිරජහා අහස්තලයට නැගී පූර්වසමුද්‍රයට බස්නේය යම් ආකාරයකින් චක්‍රරත්නය මහාසමුද්‍රජලයට හමුව බස්නේද ඒඒ ආකාරයෙන් දිවබෙහෙත් ගඳ ආඝ්‍රාණයකොට පෙණය හකුලුවනලද නාගරාජයකුු මෙන් හකුලුවනලද රළපතර ඇත්තේ සමුද්‍රජලයට බසිමින් සතරගවුවක් පමණ යට ගොස් ඇතුළු සමුද්‍රය වෛඩූර්‍යමාණික්‍ය ප්‍රාකාරයක්මෙන් පිහිටන්නේය එකෙණෙහිම සක්විතිරජහුගේ පුණ්‍යශ්‍රීසම්පත්තිදකිනු කැමැත්තාක්හුමෙන් මහසමුද්‍රතලයෙහි විප්‍රකීර්ණවූ නන්විසිතුරුරත්නයෝ එයින් පැනනැගී ඒ පෙදෙස පිරෙන්නාහ එකල්හි ඒ සක්විතිරජහුගේ පිරිස්නාන් විසිතුරු රත්නයෙන් පිරුණවූ මහාසමුද්‍රතලය දැක රුචිවූ පරිද්දෙන් රත්නයන් ඔඩකු පොදි ආදියට ගණිති කැමැතිසේ රත්නයන් ගන්නාලද පිරිස්ඇතිකල්හි පිරිස් පසුකොට සක්විතිරජ මැදිකොට චක්‍රරත්නය ඉදිරියෙන් අහසට පැනනැගී කල්හි ඒ සමුද්‍රජලය චක්‍රරත්නයෙන් වෙන්වූබව නොඉවසා ගත හැක්කාක්මෙන් නිම්මධූලකෙළවර ගැසී උස්ව පැනනැගෙන්නේය මෙසේ චක්‍රවර්තිරජ පූර්වසමුද්‍රය කෙළවරකොට ඇති පූර්වවිදෙහය ජයකොට දකුණු සමුද්‍රය කෙළවරකොට ඇති දසදහසක් යොදුන් ජම්බුද්වීපය විජයකරණුකැමැතිව චක්‍රරත්නයෙන් දක්වනලද මගින් දකුණු සමුද්‍රාභිමුඛව යථොක්ත ක්‍රමයෙන් යන්නේය එහෙයින් ත්‍රිභුවනතලප්‍රදීපායමාණවූ ත්‍රිලෝගුරුබුද්ධරජානන් වහන්සේ "අථ ඛො තං භික්ඛවෙ චක්කරතනං පුරත්ථිමං සමුද්දං අජ්ඣොගහෙත්වා පච්චුත්තරිත්වා දක්ඛිණං දිසං පවත්තති" යනාදීන් පාලිය වදාළසේක.)

අථ ඛො, ඉක්බිත්තෙන්; භික්ඛවෙ, මහණෙනි; චතුරඞ්ගිනියා

සේනාය සද්ධිං, (හස්තිසේනාවය අශ්වසේනාවය රථසේනා
වය පාබලසේනාවයයි කියනලද) චතුරඞ්ගිනීසේනාවහා ස
මග; චක්කවත්තිරාජා, චක්‍රවර්ත්ති රජතෙම; අනුදෙව, අනු
බන්ධනයකොට; තං චක්කරතනං, (සක්වළ විජයකරදෙන්නා
වූ) ඒ චක්‍රරත්නය; පුරත්ථිමං සමුද්දං, පූර්වසමුද්‍රයට; අජ්ඣො
ගහෙත්වා, බැස; පච්චුත්තරිත්වා, එයින් අහසට පැනනැගී; දක්ඛි
ණං දිසං, දක්‍ෂිණදිශාවෙහි; (හෙවත් දසදහසක්යොදුන් දඹ
දිව;) පවත්තති, (චක්‍රමණ්ඩලාකාරයෙන්) පැවැත්තේය; භික්ඛ
වෙ, (ධර්මප්‍රතිග්‍රාහකවූ) මහණෙනි; යස්මිං පදෙසෙ ඛො පන,
(මෘදුපුලිනතලශෛත්‍ය ඡායාසම්පන්නවූ) යම් ප්‍රදේශයෙක්හි
වනාහි; චක්කරතනං, චක්‍රරත්නය; පතිට්ඨාසි, පිහිටත්තේද; ත
ත්ථ, එහි; චතුරඞ්ගිනියා සේනාය සද්ධිං, සිව්රඟ සෙනඟහා සම
ග; චක්කවත්තිරාජා, සක්විතිරජතෙම; වාසං උපගඤ්ඡි, වාසය
ට පැමිණියේය; භික්ඛවෙ, මහණෙනි; දක්ඛිණාය දිසාය, ද
ක්‍ෂිණදිශාවෙහි; යෙ පටිරාජානො, යම් පරශත්‍රු රජකෙණෙක්
ඇද්ද; තෙ ඛො පන, ඔවුන් වනාහි; චක්කවත්තිං රාජානං උපසං
කමිත්වා, (නිත්‍යඵලපුෂ්පයෙන් හරිතවෘක්‍ෂයක් කර කීරකොකිල
ශාරිකාදී පක්‍ෂිසමූහයාවිසින් එලඹියයුතු වේද එමෙන්) චක්‍ර
වර්ත්තිරජ්ජුරුවන්කරා එලඹ; මහාරාජ, මහාරාජෝත්තමයානන්
වහන්ස; එහි ඛො, මෙසේ වැඩවදාළමැනව; මහාරාජ, (මෘදුපුලින
චරණකමලොපලක්‍ෂිතවූ) මහරජ්ජුරුවන්වහන්ස; සාගතං, නු
ඹවහන්සේගේ ගමනක්‍රියාව අපට ප්‍රිය වන්නේය; මහාරාජ, මහා
රාජෝත්තමයානන්වහන්ස; සකං තෙ, (මනුෂ්‍යයන් සහිත පෘථිවි
ය) නුඹවහන්සේ සන්තකය; මහාරාජ, විජමනුජරාජෝත්තමයා
නන්වහන්ස; අනුසාස ඉති, අපට අනුශාසනාකර වදාළමැනවැයි
කියා; එවමාහංසු, මෙසේ යාඥාකළාහුය; චක්කවත්තිරාජා, (විජම
නුජරාජබෘන්දශ්වරවූ) චක්‍රවර්ත්තිරජතෙම; එවමාහ, මේ වක්‍ෂ්‍යමා
න ක්‍රමයෙන් අනුශාසනා කරන්නේය; පාණො න හන්තබ්බො, (නි
රයසංවත්තනික කෲරකටුකවිපාකඝොරවේදනාසන්ධජනනය
කරන්නාවූ) ප්‍රාණඝාතය නොකට යුත්තේය; අදින්නං නාදාතබ්බං,
(ඉහාත්මභාවයෙහි දෙනිස්කර්මකාරණාහා පරලොකයෙහි තීව්‍රබෙ
දදුඃඛවිපාකජනනය කරන්නාවූ) පරසන්තකහිරණ්‍යසුවර්ණා
දිවස්තුව නොගත යුත්තේය; කාමෙසු මිච්ඡා නචරිතබ්බා, (ක්‍රක
චකණ්ටසංදංශොහාද්‍යනෙකප්‍රකාරදුඃඛවිපාකජනනය කරන්නා
වූ) කාමමිථ්‍යාචාරය නොකටයුත්තේය; මුසා න භාසිතබ්බා, (හෘද
යෙහි කිසිගුණලයක් නැත්තාවූ චෙතියරජහු මෙන් අපායභාක්
වන) මුසාවාදය නොකියයුත්තේය, මජ්ජං න පාතබ්බං, (තාම්‍රලො
හකොනමත්තනිලීලජ්ජාදි නෙකප්‍රකාරආදීනවයෙන් යුක්තවූ)

මද්‍යපානය නොකටයුත්තේය; යථාභූතඤ්ච, අනුභව කළයුත්තක්; භුඤ්ජථාති, අනුභව කරවයි කියා (යථොක්තක්‍රමයෙන් අනුශාසනා කෙළේය;) භික්ඛවෙ, මහණෙනි; දක්ඛිණාය දිසාය, දකුණුදිශාවෙහි; යෙ පටිරාජානො, යම් ප්‍රතිරාජකෙනෙක් ඇද්ද; තෙ බො පන, ඔහු වනාහි; චක්කවත්තිස්ස රඤ්ඤො, සක්විතිරජහට; අනුයුත්තා අහෙසුං, අනුකූලවූවාහුය.

අථ බො, ඉක්බිත්තෙන්; භික්ඛවෙ, මහණෙනි; චතුරඞ්ගිනියා සෙනාය සද්ධිං, සිව්රඟසෙනඟහා සමඟ; චක්කවත්තිරාජා, සක්විතිරජහු; අන්වදෙව, ලුහුබදවමින්; තං චක්කරතනං, ඒ සක්රුවන; දක්ඛිණං සමුද්දං, දකුණු සමුදුරට; අජ්ඣොගාහෙත්වා, බැස; පච්චුත්තරිත්වා, එයින් නැගී; පච්ඡිමං දිසං, පැදුම්දිගෙහි; පවත්ති, පැවැත්තේය; භික්ඛවෙ, මහණෙනි; යස්මිං පදෙසෙ බො පන, යම් පෙදෙසෙක වනාහි; චක්කරතනං, සක්රුවන; පතිට්ඨාසි, පිහිටන්නේද; තත්ථ, එතැන්හි; චතුරඞ්ගිනියා සෙනාය සද්ධිං, සිව්රඟසෙනඟහා සමඟ; චක්කවත්තිරාජා, සක්විතිරජ; වාසං උපගඤ්ඡි, වාසයට පැමිණියේය; භික්ඛවෙ, මහණෙනි; පච්ඡිමාය දිසාය, පැදුම්දිග; යෙ පටිරාජානො, යම් ප්‍රතිරාජකෙනෙක් ඇද්ද; තෙ බො පන, ඒ රජහු වනාහි; චක්කවත්තිං රාජානං උපසංකමිත්වා, සක්විතිරජකරා එළඹ; මහාරාජ, නරෙන්ද්‍රයානන්වහන්ස; එහි බො, මෙසේ වැඩියමැනව; මහාරාජ, රාජාධිරාජොත්තමයානන්වහන්ස; සාගතං, නුඹවහන්සේගේ ගමනක්‍රියාව මැනව; මහාරාජ, මහීන්ද්‍රයානන්වහන්ස; සකං තෙ, (සක්වළ) නුඹවහන්සේ සන්තකය; මහාරාජ, මනුජෙන්ද්‍රොත්තමයානන්වහන්ස; අනුසාස ඉති, අනුශාසනාකරවදාළමැනවැයි කියා; එවමාහංසු, මෙසේ ආයාචනා කළාහුය; චක්කවත්ති රාජා, සක්විති රජතෙම; එවමාහ, මෙසේ අවවාද දුන්නේය; පාණො න හන්තබ්බො, පණිවා නොකටයුතුය; අදින්නං නාදාතබ්බං, අයිනාදනින් දුරුවිය යුත්තේය; කාමෙසු මිච්ඡා න චරිතබ්බා, කාමමිථ්‍යාචාරය නොකටයුත්තීය; මුසා න භාසිතබ්බා, මුසාවායෙන් දුරුවියයුත්තීය; මජ්ජං න පාතබ්බං, මද්‍යපානය නොකටයුත්තේය; යථාභුත්තඤ්ච, අනුභව කටයුත්තක්; භුඤ්ජථාති, අනුභවකරවයි කියා; අනුශාසනා කෙළේය.

භික්ඛවෙ, (ප්‍රතිපත්තිසම්ප්‍රදානයට සුදුසුවූ) මහණෙනි; පච්ඡිමාය දිසාය, (සද්දහසක් යොදුන් අපරගොයානයෙන් යුක්තවූ) පශ්චිමදිශාවෙහි; යෙ බො පන පටිරාජානො, යම්බඳු අන්‍යරජකෙනෙක් ඇද්ද; තෙ, ඔහු, රඤ්ඤො චක්කවත්තිස්ස, (රාජවංශ ප්‍රදීපායමානවූ) චක්‍රවර්තිරජහට; අනුයුත්තා අහෙසුං,(අනුශාසනාවට) අනුරූප වූවාහුය.

අථ බො, ඉක්බිත්තෙන්; භික්ඛවෙ, මහණෙනි; තං චක්කරතනං,

ගේ චක්‍රරත්නය; පච්ඡිමං සමුද්දං, පශ්චිමසාගරජලයට; අ
ජ්ඣෝගාහෙත්වා, යොදනක් පමණ ජලප්‍රදලනය කොට ගොස්;
පච්චුත්තරිත්වා, (නානාරත්නප්‍රදානය කරවා) එයින්නැගී; චතු
රඞ්ගිනියාසෙනාය සද්ධිං, සිව්රඟසෙනගහා සමග; චක්කවත්ති
රාජා, චක්‍රවර්තිරජ්ජුරු; අනුගෙව, ලුහුබඳවමින්; උත්තරං දිසං,
(කොදෙව් පන්සියයකින් පිරිවරණලද අටදහසක්යොදුන් උතු
රුකුරුදිපයයි කියන ලද උතුරුකුරුදිශාවෙහි; පවත්ති, (චන්ද
බිම්බප්‍රතිබිම්බාකාරයෙන්) ප්‍රවෘත්තිතවූයේය; භික්ඛවෙ, මහ
ණෙනි, යස්මිං පදෙසෙ ඛො පන, (මෘදුසුලිනතලාභිරමණීය
වූ) යම් ප්‍රදෙශයෙක්හි වනාහි, චක්කරතනං, චක්‍රරත්නය, පති
ට්ඨාසි, (ගදදුම්මල්පහන් පිදියහැකිවූ ආකාශස්ථානයෙහි චන්ද්‍රම
ණ්ඩලානුකාරයෙන්) පිහිටාද; තත්‍ර, ඒ (චක්‍රරත්නයෙන් උපල
ක්ෂිතදිග්පුලුලින් දෑලොස්යොදනෙකහා වටින් සතිස්යොදනෙ
කින් යුක්තවූ) භූමිප්‍රදෙශයෙහි; චතුරඞ්ගිනියාසෙනාය සද්ධිං, (එ
පමණ භූමියෙහි හැසිරියයුතුවූ) සිව්රඟසෙනගහාසමග; චක්කව
ත්තිරාජා, චක්‍රවර්තිරජතෙම;වාසං උපගඤ්ඡි, වාසයට පැමිණියේ
ය; භික්ඛවෙ, මහණෙනි; උත්තරාය දිසාය, උතුරුදිශාවෙහි; යෙ
පටිරාජානො, යම් පරශත්‍රුරජකෙණෙක්ඇද්ද; තෙ ඛො පන, ඒ
රජදරුවෝ වනාහි; රාජානං චක්කවත්තිං උපසංකමිත්වා,චක්‍රවර්ති
රජ්ජුරුවන් කරා එළඹ; එවමාහංසු, මෙසේ යාඥකලාහුය; මහාරා
ජ, මහාරාජෝත්තමයානන්වහන්ස; එහි ඛො, මෙසේ වැඩවදාළ
මැනව;මහාරාජ,(ක්ෂීරසාගරෙතත්‍රවඩතරඞ්ගප්‍රශ්‍රුතකීර්තිනිනා
දෙපලක්ෂිතවූ) මහරජ්ජුරුවන්වහන්ස; සාගතං, නුඹවහන්සේ
ගේ ගමන ඉතා යහපත් වන්නේය; මහාරාජ, මහාපුරුෂයානන්
වහන්ස; සකනෙත, (මේ සියල්ලම) නුඹවහන්සේ සන්තකය; ම
හාරාජ,(අභිශ්‍රීකමලපුගලොපසොභිත ලක්ෂිතවූ)මහරජ්ජුරුවන්ව
හන්ස;අනුසාස ඉති, අනුශාසනාකර වදාළමැනවැයි කියා(පූර්වෝ
ක්තක්‍රමයෙන් යාඥකළාහුය;) චක්කවත්තිරාජා, (ජෙද්‍යභෙද්‍යාදී අ
නුශාසනාවන් නැත්තාවූ)චක්‍රවර්තිරජතෙම; එවමාහ, මෙසේ(ව
ක්ෂ්‍යමානක්‍රමයෙන්) අනුශාසනා කෙළේය; පාණො නහන්ත
බ්බො, ප්‍රාණඝාත නොකටයුත්තේය; අදින්නං නාදාතබ්බං, මෙර
මා සන්තක වස්තුව නොගතයුත්තේය; කාමෙසු මිච්ඡා නචරිත
බ්බා, කාමයෙහි වරදවා නහමක් පිළිපැද්දයුත්තීය; මුසා න භා
සිතබ්බා, මුසාවාද නොකියයුත්තීය, මජ්ජං න පාතබ්බං, මද්‍යපාන
නොකට යුත්තේය;යථාභුත්තඤ්ච, අනුභවකට යුත්තක්ද; භුඤ්ජ
ථානි, අනුභව කරවයි කියා (අනුශාසනා කෙළේය;) භික්ඛවෙ,
මහණෙනි; උත්තරායදිසාය, උතුරු දිශාවෙහි; යෙ පටිරාජානො,

සම් බඳු ප්‍රතිරූපකෙනෙක්ඇද්ද; තෙ බො පන, ඔහු වනාහි; චක්කවත්තිස්ස රඤ්ඤො, චක්‍රවර්තිරජහට; අනුච්ඡන්නා අහෙසුං, අනුරූප වූවාහුය.

(මෙපමණකින් වනාහි චක්‍රවර්තිරජ්ජුරුවන් විසින් සතරමහත් දිවයිනෙහි ආධිපත්‍යයට පැමිණෙන ලද්දේය මෙසේ කරණ ලද විජයඇති ඒ චක්‍රවර්තිරජතෙම තමන්ගේ රාජ්‍යශ්‍රීසම්පත් දක්නාපිණිස පිරිසහා බාලාර්කමණ්ඩලයක්මෙන් අහස්තලයට පැනනැගී විකසිතපද්මොත්පලපුණ්ඩරීකවනයෙන් විජිතුවූ සතරමහවිලක්මෙන් පන්සියයක් පන්සියයක් කොදෙව් පිරිවරණ ලද සතරමහවිපය බලා චක්‍රරත්නය විසින් දක්වනලද මාර්ග යෙන් පිළිවෙළින් තමන්ගේ රාජධානියට නැවත වඩනේය ඉක්බිත්තෙන් චක්‍රරත්නය ඇතුළු වහසල හොබවමින් ගඳදුම්මල් ආදිය මනාකොට පිදියහැකි අහස්තලයෙන් චන්ද්‍රමණ්ඩලයක්මෙන් පිහිටන්නේය මෙසේ චක්‍රරත්නය අන්තඃපුරයෙහි පිහිටිකල්හි ඇතුළු නුවර පන්දම් පහන් ආදියෙන් එළිය කිරීමක් නැත්තේය චක්‍රරත්නයාගේ ආලොකයෙන්ම රාත්‍ර්‍යන්ධකාරවිධමනය වන්නේය යම් කෙනෙක් අන්ධකාරයෙන් ප්‍රයොජන ඇත්තාහුද ඔවුන්ට අන්ධකාරවන්නේය එහෙයින් නා ගුරුළු නර දෙව්බඹුන්ගේ කිරුළුමත්තෙහි කෙළනා පාපියුම් දෙකක්ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ "අථ ඛො තං භික්ඛවෙ චක්කරතනං සමුද්දපරියන්තං පඨවිං අභිවිජිනිත්වා" යනාදි පාළිය වදාළසේක.

අථඛො, ඉක්බිත්තෙන්; භික්ඛවෙ, මහණෙනි; තං චක්කරතනං, ඒ චක්‍රරත්නය; සමුද්දපරියන්තං, චතුස්සාගරපර්‍ය්‍යන්තවූ; පඨවිං, පෘථිවිය; අභිවිජිනිත්වා, දිග්විජය කොට; තං එව රාජධානිං, ස්වකීයරාජධානියටම; පච්චාගන්ත්වා, නැවත අවුත්; චක්කවත්තිස්ස රඤ්ඤො, චක්‍රවර්තිරජහුගේ; අන්තොපුරද්වාරෙ, ඇතුළු වහසල්දොර; අත්ථකරණපමුඛෙ, යුක්තිවිචාරණප්‍රමුඛයෙහි; රඤ්ඤො චක්කවත්තිස්ස, චක්‍රවර්තිරජහුගේ; අන්තොපුරං, අන්තඃපුරය; උපසොභයමානං, (චන්ද්‍රකාන්තියක්වැනි) ආලොකයෙන් හොබවමින්; අක්ඛාහතං මඤ්ඤෙ, අකුරක් ගැසුවාක්මෙන්, අට්ඨාසි, (කස්තූරිකපුරුජබාදු සඳුන්සුවඳපිනිදියආදි පූජෝපකරණයන් මනාකොට පිදියහැකි වේද එබඳු උසඇති ආකාශතලයෙන් චන්ද්‍රමණ්ඩලයක්මෙන්) පිහිටියේය—භික්ඛවෙ, මහණෙනි, දුතියොපි ඛො චක්කවත්තිරාජා, දෙවෙනි චක්‍රවර්තිරජද; භික්ඛවෙ, මහණෙනි; තතියොපි ඛො චක්කවත්තිරාජා, තුන්වැනිවූ චක්‍රවර්ති රජද; භික්ඛවෙ, මහණෙනි; චතුත්ථොපි ඛො චක්කවත්තිරාජා, සතරවැනිව උපන් චක්‍රවර්ති රජද; භික්ඛවෙ,

මහණෙනි; පඤ්චමොපි ඛො චක්කවත්තිරාජා, පස්වැනිව උපන් චක්‍රවර්තිරජද; භික්ඛවෙ, මහණෙනි; ඡට්ඨොපි ඛො චක්කවත්තිරාජා, සවෙනිවර උපන් චක්‍රවර්තිරජද; භික්ඛවෙ, මහණෙනි; සත්තමොපි ඛො චක්කවත්තිරාජා, සත්වැනිවර උපන් චක්‍රවර්තිරජද; බහූනං වස්සානං, බොහෝ වර්ෂයන්ගේ; බහූනං වස්සසතානං, බොහෝ සියගණන් වර්ෂයන්ගේ; බහූනං වස්සසහස්සානං, බොහෝ දහස්ගණන් වර්ෂයන්ගේ; අච්චයෙන, අතික්‍රාන්තවීමෙන්; අඤ්ඤතරං පුරිසං, එක්තරා පුරුෂයෙක්හට; ආමන්තෙසි, ආමන්ත්‍රණය කෙළේය; අම්භො පුරිස, එම්බා පුරුෂය; ත්වං, තෝ; යදා ඛො, යම් කාලෙක්හි වනාහි; ඔසක්කිතං, පසුබස්නාලද්දාවූ; ඨානාචුතං, ස්ථානයෙන් චුතවෙනලද්දාවූ; දිබ්බං චක්කරතනං, දිව්‍යචක්‍රරත්නය; පස්සෙය්‍යාසි, දක්නෙහි වීනම්; අථ, එකල්හි; මෙ, මට; ආරොචෙය්‍යාසීති, දන්වවයි කියා ආමන්ත්‍රණය කෙළේය; භික්ඛවෙ, මහණෙනි, සො පුරිසො, ඒ පුරුෂතෙම; එවං දෙවාති ඛො, එසේය දෙවයන්වහන්සැයි කියා; චක්කවත්තිස්ස රඤ්ඤො, චක්‍රවර්තිරජහට; පච්චස්සොසි, ප්‍රතිවචනදුන්නේය; භික්ඛවෙ, මහණෙනි, සො පුරිසො, ඒ පුරුෂතෙම; බහූනං වස්සානං, බොහෝ සංවත්සරයන්ගේ; බහූනං වස්සසතානං, සියගණන් බොහෝ සංවත්සරයන්ගේ; බහූනං වස්සසහස්සානං, බොහෝ වර්ෂසහස්‍රයන්ගේ; අච්චයෙන, අතික්‍රාන්තවීමෙන්; ඔසක්කිතං, පසුබස්නාලද්දාවූ; ඨානාචුතං, ස්ථානයෙන් චුතවෙනලද්දාවූ; දිබ්බං චක්කරතනං, දිව්‍යචක්‍රරත්නය; අද්දසා ඛො, දර්ශනය කෙළේය; දිස්වා, නිරීක්ෂණය කොට(අනතුරුව;)චක්කවත්තිරාජා, චක්‍රවර්තිරජතෙම; යෙන, යම් දිශාභාගයෙක්හිද; තෙන, ඒ දිශාභාගයෙන්; උපසංකමි, උපසංක්‍රමණක්‍රියාව කෙළේය; උපසංකමිත්වා, චක්‍රවර්තිරජ්පුරුවන් කරා එළඹ, යග්ඝෙ දෙව, (යග්ඝෙ යනු නිපාතමාත්‍රයෙක;) දෙවයන්වහන්ස; ජානෙය්‍යාසි, දැනවදාළමැනව; තෙ දිබ්බං චක්කරතනං, නුඹවහන්සේගේ දිව්‍යචක්‍රරත්නය; ඔසක්කිතං, පසුබස්නාලද්දේය; ඨානාචුතන්ති, ස්ථානයෙන් චුතවනලද්දේයයි යන; එතං, මේ වචනය; චක්කවත්තිං රාජානං, චක්‍රවර්තිරජහට; අවොච, සැලකෙළේය-අථ ඛො, ඉක්බිත්තෙන්; භික්ඛවෙ, මහණෙනි; චක්කවත්තිරාජා, චක්‍රවර්තිරජතෙම; ජෙට්ඨපුත්තං කුමාරං, ජ්‍යෙෂ්ඨපුත්‍රවූ කුමාරයා; ආමන්තාපෙත්වා, ළඟට කැඳවා; එතං, මේ වක්ෂ්‍යමානක්‍රමයෙන්; අවොච, කියේය; තාත කුමාර, පින්වත් කුමාරය; මෙ, මාගේ; දිබ්බං චක්කරතනං කිර, දිව්‍යචක්‍රරත්නය වනාහි; ඔසක්කිතං, (නෙමිමණ්ඩලමතුයෙහි බඳනාලද සූත්‍රයෙන්) ඉවත්වෙනලද්දේය; ඨානාචුතං, (යට නිම්වලල්ලෙහි බඳනාලද සූත්‍රයෙන්) චුතවෙන

ලද්දේය; චක්කවත්තිස්ස යස්ස රඤ්ඤො, යම් බඳුවූ චක්‍රවර්ති
රජක්හුගේ; දිබ්බං චක්කරතනං, (චොරජනාදීයෙන්) දිව්‍යනම්
ලද චක්‍රරත්නය; ඔසක්කති, කරතලැසලකුණෙන් බස්නේද;
ඨානා චවති, කරණලද ස්ථානයෙන් චුතව අන්‍යස්ථානයකට
පැමිණේද; ඉදානි, මේ වර්තමානකාලයෙහි; තෙන රඤ්ඤා,
ඒ රජහුවිසින්; චිරං, බොහෝ දවසක්; න ජීවිතබ්බං හානින්,
ජීවත්වීම නොවන්නේයයි; මෙ, මාවිසින්; සුතං ඛො පන, (නුඹව
නැත්තන්ගෙන්) අසනලද්දේයයි කියේය; මෙ, මාවිසින්; මානු
සකා කාමා, මානුසිකවූ පඤ්චකාමයෝද; භුත්තා ඛො පන, අ
නුභව කරණලද්දාහුය; දිබ්බෙ කාමෙ, (දිව්‍යඞ්ගනාවන්හා අනුභ
ව කරණලද) දිව්‍යකාමයන්, පරියෙසිතුං, පරීක්ෂාකරන්නට; සම
යො, කල්වන්නේය; තාත කුමාර, පින්වත් කුමරුව; එහි, ලගාවෙ
ව; ත්වං, තෝ; සමුද්දපරියන්තං, චතුස්සාගරය කෙළවරකොට
ඇත්තාවූ; ඉමං පඨවිං, මේ පෘථිවිය; පටිපජ්ජ, (ජේදනභේදන නො
කොට) පිළිපදුව; අහං ඛො පන, මම වනාහි; කෙසමස්සුං ඔහා
රෙත්වා, දැළිරැවුලු කපා හැර; කාසායානි වත්ථානි, කසාරඤ්ජි
තවස්ත්‍රයන්; අච්ඡාදෙත්වා, ආච්ඡාදනය කොට; අගාරස්මා, (කෙල
ශසහිත කසලගොඩක්වැනි) ගිහිගෙයින් නික්ම, අනගාරියං,(කෘ
ෂිවණික් ගොතම්මානතයන් නැතිහෙයින්) අනගාරියයි කිය
නලද ප්‍රව්‍රජ්‍යාවට; පබ්බජිස්සාමීති, පැමිණෙන්නෙම් කියා (පුත්‍රාම
න්ත්‍රණය කෙළේයි)—අථ ඛො, ඉක්බිත්තෙන්; භික්ඛවෙ, මහණෙ
නි; චක්කවත්තිරාජා, චක්‍රවර්තිරජතෙම; ජෙට්ඨපුත්තං කුමාරං,
ජ්‍යෙෂ්ඨපුත්‍රවූ කුමාරයා; සාධුකං, මනාකොට; රජ්ජෙ, රාජ්‍යයෙහි;
සමනුසාසිත්වා, මනාකොට අනුශාසනාවශයෙන් පිහිටුවා; කෙස
මස්සුං ඔහාරෙත්වා; හිසකෙස් රැවුල් කපා හැර; කාසායානි වත්ථා
නි, කාසායපීතවස්ත්‍රයන්; අච්ඡාදෙත්වා, ආච්ඡාදනය කොට; අගා
රස්මා, ගිහිගෙයින් නික්ම; අනගාරියං, අනගාරියයි සඞ්ඛ්‍යාතවූ ප්‍රව්‍ර
ජ්‍යාවට; පබ්බජි, පැමිණියේය; භික්ඛවෙ,(භග්නක්ලෙශාදීයෙන්)
මහණෙනි, රාජිසිම්හි, රාජඍෂීහු; සත්තාහපබ්බජිතෙ ඛො පන,
පැවිදිව සත්දවසක් අතික්‍රාන්තවූකල්හි; දිබ්බං චක්කරතනං, දි
ව්‍යචක්‍රරත්නය; අන්තරධායි, අතුරුදන්වූයේය; අථ ඛො, ඉක්බිත්
තෙන්; භික්ඛවෙ, මහණෙනි; අඤ්ඤතරො පුරිසො, අන්‍යතර
පුරුෂයෙක්; මුද්ධාවසිත්තො, මූර්ධාභිෂික්තවූ, ඛත්තියො රාජා,(ක්ෂෙ
ත්‍රාධිපතිවූ) ක්ෂත්‍රියරජතෙම; යෙන, යම් තැනෙක්හිද, තෙන,
එතැන්හි; උපසංකමි, කරා එළඹියේය; උපසඞ්කමිත්වා, කරා එළ
ඹ; මුද්ධාවසිත්තං, මූර්ධාභිෂික්තවූ; ඛත්තියං රාජානං, ක්ෂත්‍රිය රජ්ජු
රුවන්ට; යග්ඝෙ දෙව, දෙවයන්වහන්ස; ජානෙය්‍යාසි; දැන වදාළ
මැනව; දිබ්බං චක්කරතනං, දිව්‍යචක්‍රරුවන; අන්තරහිතං ඉති,

අතුරුදන්වූයේය යන; එතදවොච, මේ වචනය සැලකොළේය; භික්ඛවෙ, මහණෙනි; අථඛො, ඉක්බිත්තෙන්; මුඪාවසිත්තස්ස, මූර්ධාවෂික්තවූ; ඛත්තියෝ රාජා, ක්ෂත්‍රියවංශොද්භූත රජතෙම; දිබ්බ චක්කරතනෙ, දිව්‍යසක්රුවන; අන්තරහිතෙ, අන්තර්ධාන වූකල්හි; අනත්තමනො අහොසි, නොසතුටුවූයේය; අනත්ත මනතඤ්ච, දෞර්මනස්‍ය්‍යවද; පටිසංවෙදෙසි, ප්‍රතිසංවෙදනාය කොළේ ය; රාජිසිං උපසඞ්කමිත්වා, රාජසෘෂීන් කරා එළඹ; අරියං චක්කව ට්ටිවත්තං, ආර්‍ය්‍යවූ දශවිධචක්‍රවර්තිබර්මයන්; නො ච ඛො පූච්ජි, නොවිචාළේය.

(ඒ ක්ෂත්‍රියවංශොද්භූත රජවනාහි රාජවංශයෙහි ප්‍රවෙනි රාජධ ර්මය හැර තමාගේ අභිප්‍රායෙහි පිහිටා ජනපදවාසීන්ට අනුශාස නා කරන්නේය මෙසේ මේ රජ්ජුරුවෝ මඛාදෙව වංශයට කාලා රජනක නම් රජමෙන් දළඹනෙමි නම් වංශය නැසීමට අන්තිම පූරුෂයෙක්ව ඉපද ජනපදවාසීන්ට ඡෙඥනෙඥවශයෙන් අනුශාස නාකෙළේය).

සො, ඒ ක්ෂත්‍රියවංශොද්භූතවූ රජතෙම; සමතෙන එව, තමා ගේ මතිමාත්‍රයෙම්ම, (සුදං, යන්නු පදපූරණාර්ථයෙහි නිපාතයක) ජනපදං, ජනපදය; පසාසති, (වරදවා) අනුශාසනාකරන්නේය; සමතෙන ජනපදං පසාසතො, (ගුරුපදෙශ රහිතව) සවබුඬින් ජනපදය අනුශාසනාකරන්නාවූ; තස්ස, ඒ රජහට, පුබ්බෙන අපරං, පූර්වකාලසදෘශව අපරකාලයට; ජනපදා, ජනපදයෝ; අරියෙ චක්කවට්ටිවත්තෙ වත්තමානානං,ආර්‍ය්‍යචක්‍රවර්තිරාජධර්ම ය පවත්නාවූ; පුබ්බකානං රාජූනං, පූර්වරජදරුවන්ට; යථාතං, (පූර්ව පශ්චිමපූරුෂයෝ)යම්සේ වැඩුනාහු වෙද්ද; න පබ්බන්ති,(එමෙන් ජනපදවාසීහු) අභිවෘඬියට නොපැමිණෙන්නාහුය; (හෙවත් කිසි තැනෙක්හි ජනපදවාසීහු ශූන්‍යවන්නාහුය එසේ ශූන්‍යව නැසෙ නලදකල්හි තෙල් මවු මී ආදියෙහිද යාගුභත්තාදියෙහිද රසඔජ පරිහානියට පැමිණෙන්නාහුය.)

අථඛො, ඉක්බිත්තෙන්; ස්කඛවෙ, මහණෙනි; අමච්චා, අම ත්‍යයෝද; පාරිසජ්ජා, පරිසාවචරයෝද, ගණකමහාමත්තා, (අ ලෙපවණ්ණාදි ගුණප්‍රකාශකරන්නාවූ) ගණකයන් හා මහා අමා ත්‍යයෝද; අණිකට්ඨා, හස්ත්‍යාවාරීන්හා අශ්වාවාරීහුද; දොවාරි කා, වාරපාලයෝද; (මන්තසජීවිනො, ප්‍රඥාව නිසා ජීවත්වන් නාවූ පණ්ඩිත මහාමාත්‍යයෝද, සන්නිපතිත්වා, රැසිභූතව; මු ඬාවසිත්තං ඛත්තියං රාජානං, රාජ්‍යපදප්‍රාප්ත ක්ෂත්‍රියවංශොද් භූත රජ්ජුරුවන් කරා; උපසඞ්කමිත්වා, එළඹ; එතදවොචුං, මෙ සේ කීවාහුය; දෙව, දෙවයන්වහන්ස; සමතෙන, සවබුඬිය

කරණකොට ගෙණ; ජනපදං පසාසනො, ජනපද පසාසනය කරන්නාවූ; පුබ්බෙනාපරං, පූර්වකාලයෙහි මෙන් අපරකාලයට; ජනපදා, ජනපදවාසීහු (නොහොත්) ජනපදයෙහි; (ශස්‍ය තලතෙල්මී සකුරුආදියෙහි ඔජරසයෝ) න බො පබ්බන්ති, නොම වැඩෙන්නාහුය; අරියෙ චක්කවත්තිවත්තෙ වත්තමානානං, උතුම්වූ දශරාජධම්මයෙහි පවත්නාවූ; පුබ්බකානං රාජූනං, පූර්වරජදරුවන්ට; යථාතං, (පූර්වපශ්චිම ජනපදවාසී මනුෂ්‍යයන් හා ශස්‍ය ඵලාදීයෙහි ඔජරසයෝ) යම්සේ පැවැත්තාහුද එමෙන් නොපවත්නාහුය; දෙව, දෙවයන්වහන්ස, අමච්චා, අමාත්‍යයෝද; පාරිසජ්ජා, පරිසාවචරයෝද; ගණකමහාමත්තා, (අලෙපවජ්ජාදිය ප්‍රකාශකරන්නාවූ) ගණකමහාමාත්‍යයන් හා සෙසු මහාඅමාත්‍යයෝද, අණීකට්ඨා, හස්ත්‍යාචාරීන් හා අශ්වාචාරීහුද; දොවාරිකා, වාරපාලයෝද; මන්තස්ස ආජීවිනො, ප්‍රඥාවෙන් ජීවත්වන්නාවූ පණ්ඩිත මහාමාත්‍යයෝද යන; තෙ විජිතෙ, තාගේ විජිතයෙහි; යෙ සංවිජ්ජන්ත බො, යම්බඳු කෙණෙක් ඇත්තාහුද; මයං ච එව, අපිද; අඤ්ඤෙච, අන්‍යයෝද; අරියං චක්කවත්තිවත්තං, උතුම්වූ දශරාජධම්මය; ධාරෙම, දරම්හ (හෙවත් දනුම්හ) ඉඩක, (දශරාජධම්මයන් අෂ්ටප්‍රගුණඇති) බැවින්; දෙව, දෙවයන්වහන්ස; තවං, නුඹවහන්සේ; අම්හෙ, අපගෙන්; අරියං චක්කවත්තිවත්තං පුච්ඡ, ආයසීවූ දශරාජධම්මයන් විචාරවදාළමැනව; තස්ස තෙ, ඒ නුඹවහන්සේ විසින්; අරියං චක්කවත්තිවත්තං පුට්ඨා, ආයසීචක්‍රවර්තිවත් විචාරණලද; මයං, අපි; ව්‍යාකරිස්සාම ඉති, ප්‍රකාශකරම්හයි කීවාහුය; අථ බො, ඉක්බිත්තෙන්; භික්ඛවෙ, මහණෙනි; මුද්ධාවසිත්තො ඛත්තියො රාජා, මූර්ධාභිෂික්තවූ ක්ෂත්‍රියරජතෙම; අමච්චෙ, (රාජමන්ත්‍රී) අමාත්‍යයන්ද; පාරිසජ්ජෙ, පරිසාවචරයන්ද; ගණකමහාමත්තෙ, ගණකමහාමාත්‍යයන්ද; අණීකට්ඨෙ, හස්ත්‍යාචාරීන් හා අශ්වාචාරීන්ද; දොවාරිකෙ, වාරපාලයන්ද; මන්තස්සාජීවිනො, ප්‍රඥාවෙන් ජීවත්වන්නාවූ පණ්ඩිත මහා අමාත්‍යයන්ද; සන්නිපාතාපෙත්වා, රැස්කරවා; අරියං චක්කවත්තිවත්තං, ආයසීවූ චක්‍රවර්තිව්‍රතයන්; පුච්ඡි, (ඔවුන් අතින්) විචාළේය; තස්ස, ඒ රජහු විසින්; අරියං චක්කවත්තිවත්තං, ආයසීදශරාජධම්මයන්; පුට්ඨා තෙ, විචාරණලද ඔහු; ව්‍යාකරිංසු, ප්‍රකාශකළාහුය; තෙසං සුත්වා, ඔවුන්ගේ ඒ වචනය අසා; ධම්මිකං රක්ඛාවරණගුත්තිං හි, ධාර්මිකවූ රක්ෂාවරණගුප්තිය පමණක්; සො, ඒ රජතෙම; සංවිදහි, පිහිටුවූයේය; අධනානං, නිර්ධනියවූ ජනයන්ට; ධනං, (හිරණ්‍යසුවර්ණාදි) ධනය; නො ච බො අනුප්පදාසි, (තමාගේ ප්‍රලුබ්ධතාවය කරණකොටගෙණ) නොම දුන්නේය.

අධනානං, නිර්ධනීවූ දිළිඳු ජනයන්ට; ධනෙ, (හිරණ්‍ය සුවර්ණ වස්ත්‍රාභරණාදිවූ) ධනයන්; අනනුප්පදියමානෙ, ("ලොභො අකුසලමූලං" යනාදීන් දෙශනාකර වදාරණලද ත්‍රිවිධවූ අකුශලධම්මයන්ට මූලිකවූ ලොභයෙන්) වස්තුප්‍රදානය නොකරණලද කල්හි; දාළිද්දියං, දිළිඳුබව; වෙපුල්ලං අගමාසි, මහත් බවට පැමිණියේය; දාළිද්දියෙ, වෙපුල්ලගතෙ, දිළිඳුබව විපුලභාවයට පැමිණි කල්හි; අඤ්ඤතරො පුරිසො, (දිළිඳු සත්වයන් අතුරෙන්) එක්තරා පුරුෂයෙක්; පරෙසං අදින්නං, අනුන් විසින් (කායවාක් ප්‍රයොගයෙන්) නොදෙනලද්දාවූ; ථෙය්‍යසඞ්ඛාතං, ථෙය්‍යසඞ්ඛ්‍යාතවූ හිරණ්‍යසුවර්ණාදි වස්තුව; ආදියි, (ථෙය්‍යාවහාර වශයෙන්) ග්‍රහණය කෙළේය; තමෙනං අග්ගහෙසුං, (පරිභාස බෙණෙමින් වාක්දණ්ඩයෙන් තර්ජනයකොට) ඔහු පැහැරගත්තාහුය; ගහෙත්වා, ග්‍රහණය කොට ගෙණ ගොස්; දෙව, දෙවයන්වහන්ස; අයං පුරිසො, මේ පුරුෂතෙම; පරෙසං, අනුන්සන්තකවූ; අදින්නං, නොම දෙනලද්දාවූ; ථෙය්‍යසඞ්ඛාතං, ථෙය්‍යසඞ්ඛ්‍යාතයයි කියනලද වස්තුව; ආදියි ඉති, සොරකම් කෙළේයයි; මුඩාවසිත්තස්ස ඛත්තියස්ස රඤ්ඤො, රාජ්‍යපදප්‍රාප්තවූ ක්‍ෂත්‍රියරජහට; දස්සෙසුං, දැක්වූවාහුය; භික්ඛවෙ, මහණෙනි, එවං වුත්තෙ, (මනුෂ්‍යයන් විසින්) මෙසේ දක්වාති කල්හි; මුඩාවසිත්තො ඛත්තියො රාජා, මූර්ධාභිෂික්තවූ ක්‍ෂත්‍රිය රජතෙම; තං පුරිසං, ඒ පුරුෂයා අතින්; එතං අවොච, මේ වචනය විචාළේය; අම්භො පුරිස, එම්බා පුරුෂය; ත්වං කිර, තෝ වනාහි; පරෙසං, අනුන්සන්තකවූ; අදින්නං ථෙය්‍යසඞ්ඛාතං, ථෙය්‍යසඞ්ඛ්‍යාතයයි කියනලද හිරණ්‍ය සුවර්ණාදි වස්තුව; ආදියී සච්චං ඉති, සොරකම්කොට ගත්තේ සැබෑදැයි විචාළේය; දෙව, දෙවයන්වහන්ස; සච්චං ඉති, සැබෑයයි සැලකෙළේය; කිං කාරණා?, (තාවිසින් වස්තු සොරකම් කෙළේ) කුමක් පිණිසදැයි විචාළේය; නහි දෙව ජීවාමීති, දෙවයන්වහන්ස (අනික්කාරණාවක් පිණිස) නොව (දරිද්‍රතාව කරණකොට ගෙණ සොරකම්කොට) ජීවත්වෙමියි සැලකෙළේය; අථඛො, ඉක්බිත්තෙන්; භික්ඛවෙ, මහණෙනි; මුඩාවසිත්තො ඛත්තියො රාජා, රාජ්‍යපදප්‍රාප්තවූ ක්‍ෂත්‍රිය රජතෙම; තස්ස පුරිසස්ස, ඒ (සොරකම්කළ) පුරුෂයාහට; ධනං අනුප්පදාසි, (හිරණ්‍ය සුවර්ණාදි) වස්තුව දුන්නේය; අම්භො පුරිස, එම්බා පුරුෂය; ත්වං, තෝ; ඉමිනා ධනෙන, මේ ධනයෙන්, අත්තනාච ජීවාහි, තාගේ ආත්මයද ජීවත් කරව; මාතාපිතරො ච පොසෙහි, (තා වඩනලද්දාවූ) දෙමව්පියන්ද පොෂ්‍යය කරව; පුත්තදාරඤ්ච පොසෙහි, (තට හිතවසයෙන් පවත්නා) පුත්‍රදාරවන්ද පොෂ්‍යය කරව; කම්මන්තෙ ච පයොජෙහි, තාගේ කෘෂිවාණිජ්‍ය කර්මාන්ත

යෙහිද ප්‍රයොජ්‍ය කරව, සොවග්ගිකං, ස්වර්ගයට හිතවූ; සුඛවිපාකං, (උපනුපන් තැන්හි) සැපවිපාක දෙන්නාවූ; සග්ගසංවත්තනිකං, අග්‍රදිව්‍යවර්ණාදි දශවිධශෙෂකාරණාවන් නිපදවන්නාවූ; උද්ධග්ගිකං, මනුමත්තෙහි (උපනුපන් භූමිවල)ඵලානිශංසදෙන්නාවූ; දක්ඛිණං, දක්ෂිණාවයයි කියනලද දශවිධදානවස්තුව, සමණෙසු බ්‍රාහ්මණෙසු, ශ්‍රමණබ්‍රාහ්මණයන්කෙරෙහි; පතිට්ඨාපෙහි ඉති, පිහිටුවවයි කියා (වසතුදුන්නේය;) භික්ඛවෙ, මහණෙනි; එවං දෙවාති බො, එසේය දේවයන්වහන්සැයි කියා; සො පුරිසො, (පරද්‍රව්‍යාදානය කළාවූ) ඒ පුරුෂතෙම; මුද්ධාවසිත්තස්ස ඛත්තියස්ස රඤ්ඤො, රාජ්‍යපදප්‍රාප්තවූ ක්ෂත්‍රියවංශ රජහුගේ; පච්චස්සොසි, වචනය මැනකයෙන් පිළිගත්තේය.

භික්ඛවෙ, මහණෙනි; අඤ්ඤතරොපි බො පුරිසො, අනිකුදු පුරුෂයෙක් වනාහි; පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං, ථෙය්‍යසඞ්ඛාතවූ (චෞරකොට්ඨාසයයි කියනලද) හිමියන් විසින් නොදෙනලද්දාවූ වස්තුවක්; ආදියි, (චෞරක්‍රියාවශයෙන්)ගත්තේය; තමෙනං අග්ගහෙසුං,(වාක්දණ්ඩයෙන් තර්ජනයකොට) ඔහු පැහැරගත්තාහුය; ගහෙත්වා, අල්වාගෙණ ගොස්; රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස, මූර්ධාභිෂික්තවූ ක්ෂත්‍රියරජ්පුරුවන්ට; දස්සෙසුං, දැක්වූවාහුය; දෙව, දෙවයන්වහන්ස; අයං පුරිසො, මේ පුරුෂතෙම; පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං, පරපරිග්‍රහවස්තුවක්; (ථෙය්‍යචිත්තයෙන්)ආදියි ඉති, ග්‍රහණය කෙළේයයි; එවං වුත්තෙ, මෙසේ කී කල්හි; භික්ඛවෙ, මහණෙනි; මුද්ධාවසිත්තො ඛත්තියො රාජා, මූර්ධාභිෂික්තවූ ක්ෂත්‍රියරජතෙම; අම්භො පුරිස, එම්බා පුරුෂය; ත්වං, තෝ; පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියි සච්චං කිර, පරපරිග්‍රහ වස්තුව ථෙය්‍ය චිත්තයෙන් ග්‍රහණය කෙළේ සැබෑදැයි යන; එතං, මේ වචනය; තං පුරිසං අවොච, ඒ පුරුෂයාගෙන් විචාළේය; දෙව, දෙවයන්වහන්ස; සච්චං ඉති, සැබෑයයි සැලකෙළේය; කිං කාරණා, කුමක්පිණිසදැයි විචාළේය; දෙව, දෙවයන්වහන්ස; නහි, (අනික්කාරණාවක් පිණිස) නොම වන්නේය; ජීවාමි ති, (දරිද්‍රතාවයෙන් සොරකම්කොට)ජීවත්වෙමියි සැලකෙළේය; අථ ඛො, ඉක්බිත්තෙන්, භික්ඛවෙ, මහණෙනි; රාජා ඛත්තියො මුද්ධාවසිත්තො, රාජ්‍යාභිෂෙකප්‍රාප්ත ක්ෂත්‍රියවංශොද්භූතවූ රජතෙම; අම්භො පුරිස, එම්බා පුරුෂය; ත්වං, තෝ; ඉමිනා ධනෙන,(මා විසින්දෙනලද්දාවූ) මේ ධනයෙන්; අත්තනාච උපජීවාහි, ආත්මයද රක්ෂාකරව; මාතාපිතරො ච පොසෙහි, (තා පොෂ්‍යයකොට වඩනාලද) මව්පියදෙදෙනාද පොෂ්‍යකරව; පුත්තදාරෙච පොසෙහි, (තට සුවච කීකරුවශයෙන් පවත්නාවූ) පුතුදරුවන්ද පොෂ්‍යකරව; කම්මන්තෙච පයොජෙහි, තාගේ කෘෂිවණික් ගෝ

කම්මාන්තාදියෙහිද වස්තුප්‍රයොගකරන්නෙහිය, උද්ධග්ගිකං, (ම
නුමත්තෙහි උපන්නුපන්නන්හි ඵලප්‍රදානය කරණහෙයින්) උද්ධ
ග්ගික නම්වූ; සොවග්ගිකං, (ස්වර්ගොත්පත්ති කරණ හෙයින්)
සොවග්ගික නම්වූ; සුඛවිපාකං, (නිර්වෘත්ත නිර්වෘත්තස්ථානයෙහි
සැපවිපාකදෙන හෙයින්) සුඛවිපාක නම්වූ; සග්ගසංවත්තනිකං,
(දිව්‍යවූ ආයුවර්ණාදි විශෙෂවත්වූ දශවිධකාරණවෙහි පවත්වන
හෙයින්) සග්ගසංවත්තනික නම්වූ; දක්ඛිණං, දක්ෂිණාවයයි කිය
නලද දශවිධ දානවස්තුව; සමණෙසු බ්‍රාහ්මණෙසු, ශ්‍රමණබ්‍රාහ්ම
ණයන් විෂයෙහි; පතිට්ඨාපෙති ඉති, මොනවට පිහිටුවවයි කියා;
තස්ස පුරිසස්ස, ඒ(චෞරක්‍රියාවෙහි යෙදුනාවූ)පුරුෂයාහට; ධනං
අනුප්පදාසි, (හිරණ්‍යසුවර්ණාදිවූ වස්තුව) පරිත්‍යාගකෙළේය; භි
ක්ඛවෙ, මහණෙනි; එවං දෙවාති බො සො පුරිසො, එසේය දෙ
වයන්වහන්සැයි කියා ඒ පුරුෂතෙම; රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාව
සිත්තස්ස, රාජ්‍යාභිෂෙකප්‍රාප්තක්ෂත්‍රිය රජ්ජුරුවන්ට; පච්චස්සොසි,
ප්‍රතිවචන දුන්නේය.

භික්ඛවෙ, මහණෙනි; මනුස්සා, මනුෂ්‍යයෝ; භො, පින්වත්
නි; පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං, චෞරකොට්ඨාසයයි කියන
ලද පරපරිග්‍රහවස්තුව; යෙ කිර ආදියන්ති, යම්කෙණෙක් වනා
හි වක්ඛාකොට ගණිද්ද; තෙසං, ඔවුන්ට; රාජා ධනමනුප්පදෙති
ඉති, රජ්ජුරුවන්වහන්සෙ වස්තුව පරිත්‍යාගකරන්නේයයි; අස්සො
සුං බො, ශ්‍රොත්‍රවිඥානයෙන් ශ්‍රවණය කළාහුය; සුත්වාන, ශ්‍රව
ණයකොට (ඉක්බිත්තෙන්;) මයම්පි; (වස්තුනැත්තාවූ) අපි සියල්
ලෝම; පරෙසං අදින්නං ථෙය්‍යසංඛාතං, හිමියන් විසින් නො
දෙනලද්දාවූ චෞරකොට්ඨාසය; ආදියෙය්‍යාම, සොරකම්කරන්
නෙමු නම්; යන්නූන ඉති, මැනවැයියන; තෙසං, ඒ දරිද්‍රජන
යන්ට; එතදහොසි, මෙබඳුවූ සිතක් පහළවූයේය—අථඛො, ඉක්
බිත්තෙන්; භික්ඛවෙ, මහණෙනි; අඤ්ඤතරො පුරිසො, (ඔවුන්
අතුරෙන්)එක්තරා පුරුෂයෙක්; පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං,
වස්තුහිමියන් නොදෙනලද චෞරකොට්ඨාසයක්; ආදියි, (ථෙය්‍ය
චෙතනාවෙන්) ග්‍රහණය කෙළේය; තමෙනං, ඒ චෞරපුරුෂයා;
අග්ගහෙසුං, (සොරාහයි තර්ජනය කොට) ග්‍රහණය කළාහුය; ග
හෙත්වා,(තර්ජනයකොට)ගෙණ ගොස්; රඤ්ඤො ඛත්තියස්ස මුද්ධා
වසිත්තස්ස, රාජ්‍යාභිෂෙකවූ ක්ෂත්‍රියරජහට; දස්සෙසුං, දැක්වූවාහුය;
දෙව, දෙවයන්වහන්ස;අයං පුරිසො,(සියල්ලන් විසින් පරිභූතවූ)
මේ පුරුෂයා;පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං,ථෙය්‍යසඞ්ඛ්‍යාතවූ ප
රපරිග්‍රහවස්තුවක්;ආදියි ඉති,(ථෙය්‍යචිත්තයෙන්)ග්‍රහණය කෙළේ
යයි; එවං වුත්තෙ, මෙසේ කී කල්හි; භික්ඛවෙ, මහණෙනි; රාජා ඛ
ත්තියො මුද්ධාවසිත්තො,මූර්ධාභිෂික්තවූ ක්ෂත්‍රියරජතෙම;තං පුරිසං,

ඒ පුරුෂයාගෙන්; එතදවොච, මේ වචනය විචාළේය; අම්භො පු
රිස, එම්බා (අවලක්ෂණ) පුරුෂය; ත්වං, තෝ; පරෙසං අදින්නං
ථෙය්‍යසඞ්ඛාතං, හිමියන් විසින් නොදෙනලද්දාවූ වස්තුව; සච්චං
කිර ආදියි ඉති, සොරකම්කොට ගත්තේසැබෑදැයි විචාළේය; දෙව,
දෙවයන්වහන්ස; සච්චං ඉති, සැබෑයයි සැලකෙළේය; කිං කාර
ණා?, කවර කාරණාවක් නිසා (සොරකම් කෙළේදැයි විචාළකල්හි;)
දෙව, දෙවයන්වහන්ස; නාහි ජීවාමි ඉති, (අන්‍යකාරණාවක් පිණිස)
නොමවන්නේය (වස්තුව නැතිබව කරණකොටගෙණ චෞරක
ර්මයෙන්) ජීවත්වෙමියි (සැලකෙළේය;) අථඛො, ඉක්බිත්තෙන්;
භික්ඛවෙ, මහණෙනි; රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස, මූර්ධාභි
ෂෙකවූ ක්ෂත්‍රියරජහට; එතදහොසි, මෙසේ සිතක් පහළවූයේය-
සචෙ ඛො, ඉදින් වනාහි; යො යො, යම් යම් පුරුෂයෙක්; පරෙසං
අදින්නං ථෙය්‍යසඞ්ඛාතං, පරපරිග්‍රහ වස්තුව ථෙය්‍යචිත්තයෙන්;
ආදියෙය්‍ය, සොරකම්කරන්නේ වීනම්; තස්ස තස්ස, ඒ ඒ සොරකම්
කරන්නාහට; අහං, මම; ධනමනුප්පදාමි, වස්තුප්‍රදානය කරන්නෙම්
නම්; එවං, මේ කාරණාවෙන්; ඉදං අදින්නාදානං, මේ අදත්තාදාන
ය; පවඩ්ඪිස්සති, වර්ධනය වන්නේය; අහං, මම; ඉමං පුරිසං, මේ පු
රුෂයා; සුනිසෙධං නිසෙධෙය්‍යං, විශෙෂයෙන් නැතිකෙළෙම්
නම්; මූලඝච්චං කරෙය්‍යං, මූලොත්ඝාතනය කරන්නෙම්නම්; අ
ස්ස, ඔහුගේ; සීසං ඡින්දෙය්‍යං, ශිර්ෂච්ඡෙදනයකරන්නෙම්නම්; ය
න්නූන ඉති, මැනවැයි (යන සිතක් පහළවූයේය;) අථඛො, ඉක්බිත්
තෙන්; භික්ඛවෙ, මහණෙනි; රාජා ඛත්තියො මුද්ධාවසිත්තො, රා
ජ්‍යාභිෂෙකවූ ක්ෂත්‍රියවංශොද්භූත රජතෙම; පුරිසෙ ආනාපෙසි,
රාජ පුරුෂයන්ට ආඥාකෙළේය; භණෙ, කොල පුරුෂයෙනි, තෙන
හි, එසේ වීනම්; ඉමං පුරිසං, (සියල්ලමද්දිනය වෙන පිණිස) මේ
පුරුෂයා; දළ්හාය රජ්ජුයා, දෘඪවූ රැහැනකින්; පච්ඡාබාහං, හ
ස්තයන් පිටතට හයා; ගාළ්හබන්ධනං බන්ධිත්වා, තිව්‍රවූ බන්ධන
යෙන් බැඳ; ඛුරමුණ්ඩං කරිත්වා, ශිරසමුණ්ඩනයකොට (හෙවත්) හිසමු
ඩු කොට; ඛරස්සරෙන පණවෙන, කඨොරධ්වනිඇති හෙරිවාද්‍යය
කෙරෙමින්; රථියාය රථියං, වීථියෙන් වීථියට; සිංඝාටකෙන සිංඝා
ටකං, සතරමංසන්ධියෙන් සතරමංසන්ධියට; පරිනෙත්වා, (වධබ
න්ධනය කරමින්) ගෙණ ගොස්; දක්ඛිණෙන ද්වාරෙන, දක්ෂිණද්වාර
යෙන්; නික්ඛාමෙත්වා, බහිනිෂ්ක්‍රමනය කොට; නගරස්ස දක්ඛිණ
තො, නුවරට දකුණුදිග්භාගයෙහි (ආඝාතස්ථානයෙහිලා;) සුනි
සෙධං නිසෙධෙථ, සර්වාකාරයෙන් විනාශයට පමුණුවව්; මූලඝ
ච්චං කරොථ, මූලොත්ඝාතනය කරව්; අස්ස, ඔහුගේ; සීසං ඡින්දථාති,
ශිර්ෂච්ඡෙදනය කරව් කියා (රාජආඥාකෙළේය) භික්ඛවෙ, මහණෙ
නි, එවං දෙවාති ඛො, එසේය දෙවයන්වහන්සැයි කියා; තෙ

පුරිසා, ඒ පුරුෂයෝ; රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස, ක්ෂත්‍රිය
වංශොද්භූතවූ රජහුගේ; පටිස්සුත්වා, අඬුව පිළිගෙණ; තං පුරිසං,
ඒ පුරුෂයා; දළ්හාය රජ්ජුයා, දැඩිවූ රැහැනකින්; පච්ඡාබාහං, හස්ත
යන් පිටතට හයා; ගාළ්හබන්ධනං බන්ධිත්වා, දැඩිවූ බන්ධනයෙන්
බැඳ; ඛුරමුණ්ඩං කරිත්වා, හිසමුඩුකොට; ඛරස්සරෙන පණවෙන, කු
ළුහඬ ඇති පණබෙරයක් හන්කරමින්; රථියාය රථියං, වීථියෙන්
වීථියට; සිංඝාටකෙන සිඞ්ඝාටකං, සතරමංසන්ධියෙන් සතර
මංසන්ධියට; පරිනෙත්වා, (බැගෑහඬින් හඬව හඬවා පහරදෙ
මින්) ගෙණ ගොස්; දක්ඛිණෙන වාරෙන, දකුණුවහසල් දොරින්;
නික්ඛාමෙත්වා, බහිනිෂ්ක්‍රමණය කොට; දක්ඛිණතො නගරස්ස,
නුවරට දකුණුදිශාවෙහි; (මෘතපුස්ථාන යෙහිලා;) සුනිසෙධං
නිසෙධෙසුං, මුඳුල්ලම විනාශකළාහුය; මූලඝච්චං අකංසු, මූ
ලොත්ඝාතනය කළාහුය; අස්ස සීසං ඡින්දිංසු, ඔහුගේ හිස කැපු
වාහුය.

භික්ඛවෙ, මහණෙනි; මනුස්සා කිර, මනුෂ්‍යයෝ වනාහි;
භො, එම්බල පුරුෂයෙනි; යෙ, යම් බඳුකෙණෙක්; පරෙසං අදි
න්නං ථෙය්‍යසඞ්ඛාතං, ථෙය්‍යසඞ්ඛ්‍යාතවූ පරපරිග්‍රහ වස්තුව;
ආදියන්ති, සොරකම්කොට ගණිද්ද; තෙ, ඔවුන්; රාජා, රජ්ජුරු
වන්වහන්සේ; සුනිධෙං නිසෙධෙති, සුනිසෙධනය කරණසේ
ක; මූලඝච්චං කාරෙති, මූලොත්ඝාතනය කරණසේක; තෙසං,
ඔවුන්ගේ; සීසානි ඡින්දන්ති, හිස්සිඳුවනසේක්වනැයි; අස්සොසුං
ඛො, ඇසුවාහුය; සුත්වාන, ශ්‍රවණය කොට; තෙසං, ඔවුන්ට; එ
තදහොසි, මෙසේ සිතක් පහළවූයේය; මයම්පි, අපිද; තිණ්හානි
සත්ථානි, තියුණු මුවහත්ඇති ආයුධයන්; කාරාපෙය්‍යාම, කරවන්න
මෝනම්; යන්නූන, ඉතා යෙහෙක; තිණ්හානි සත්ථානි, තීක්ෂණවූ
ශස්ත්‍රයන්; කාරාපෙත්වා, කරවාගෙණ; යෙසං අදින්නං ථෙය්‍යස
ඞ්ඛාතං, ථෙය්‍යසඞ්ඛ්‍යාතවූ යම් කෙණෙකුන්ගේ වස්තුව; ආදියිස්සා
ම, සොරකම්කරන්නමෝද; තෙ, ඒ චෞරවූ ජනයන්; සුනිසෙ
ධං නිසෙධෙස්සාම, විනාශයට පමුණුවම්හ; මූලඝච්චං කරිස්සාම,
(තීක්ෂණවූ ශස්ත්‍රයෙන්) මූලොත්ඝාතනය කරම්හ; තෙසං, ඔවුන්
ගේ; සීසානි ඡින්දිස්සාම ඉති, ආයුධයෙන් ශිර්ෂච්ඡෙදනය කරම්හයි
කියා (ඔවුන්ට සිතක් පහළවූයේය;) තෙ, ඔහු; තිණ්හානි සත්ථානි,
තීක්ෂණවූ ආයුධයන්; කාරාපෙසුං, කෙරෙව්වාහුය; තිණ්හානි සත්ථා
නි කාරාපෙත්වා, තීක්ෂණවූ ශස්ත්‍රයන් කරවාගෙණ; ගාමඝාතම්පි,
ගම්පැහැරීමද; කාතුං, කරන්නට; උපක්කමිංසු, උපක්‍රම කළාහු
ය; නිගමඝාතම්පි, නියංගම් පැහැරගැන්මද; කාතුං, කරන්නට; උ
පක්කමිංසු, උපක්‍රම කළාහුය, නගරඝාතම්පි, නුවරවල්පැහැරීමද,
කාතුං, කරන්නට, උපක්කමිංසු, උපක්‍රම කළාහුය; පන්ථඝාතම්පි,

මන්පැහැර ගැත්මද; කාතුං, කරන්නට; උපක්කමිංසු, උපක්‍රම කළාහුය; තෙ, ඔහු; යෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියන්ති, යම් කෙණෙකුන්ගේ වස්තුව සොරකම්කොට ගණිද්ද; තෙ, ඒ වස්තුව ඇති පුරුෂයන්; සුනිසෙධං නිසෙධෙන්ති, හාත්පසින් විනාශයට පමුණුවන්නාහුය; මූලඝච්චං කරොන්ති, මුලිම්ම නසන්නාහුය; තෙසං, ඒ වස්තු හිමියන්ගේ; සීසානි, හිස්වලුන්; ඡින්දන්ති, (තීක්ෂණවූ ආයුධයෙන්) කපන්නාහුය.

භික්ඛවෙ, මහණෙනි; ඉති ඛො, මෙසේ වනාහි; අධනානං, නිර්ධනවූ ජනයන්ට, ධනෙ අනනුප්පදියමානෙ, ධනප්‍රදානය නොකරණලද කල්හි; දාළිද්දියං, දරිද්‍රතාව; වෙපුල්ලං අගමාසි, මහත් බවට ගියේය; දාළිද්දියෙ වෙපුල්ලගතෙ, දරිද්‍රතාව විපුලභාවයට ගියකල්හි; අදින්නාදානං, (නානාප්‍රකාර ආදීනවයෙන් යුක්තවූ) අදත්තාදානය; වෙපුල්ලං අගමාසි, ප්‍රවුලභාවයට ගියේය; අදින්නාදානෙ වෙපුල්ලගතෙ, අදත්තාදානය මහත් බවටගිය කල්හි; සත්ථං වෙපුල්ලං අගමාසි, (ඛඩ්ගකුන්තතෝමරභින්දිවාලකරවාලාසිචක්‍රාදිවූ) ආයුධ මහත් භාවයට ගියේය; සත්ථෙ වෙපුල්ලගතෙ, ආයුධයන් බොහෝව ගියකල්හි; පාණාතිපාතො වෙපුල්ලං අගමාසි, ප්‍රාණඝාතය විපුලත්වයට ගියේය; පාණාතිපාතෙ වෙපුල්ලගතෙ, ප්‍රාණඝාතය විපුලභාවයට පැමිණි කල්හි; තෙසං සත්තානං, ඒ සත්වයන්ගේ; ආයුපි පරිහායි, ආයුෂයද පිරිහී ගියේය; වණ්ණොපි පරිහායි, ශරීරවර්ණයද පිරිහී ගියේය; ආයුනාපි පරිහායමානානං, (අසූදහසක්අවුරුදු) ආයුෂයෙන් පිරිහෙන්නාවූ; වණ්ණෙනපි පරිහායමානානං, ශරීරවර්ණයෙන් පිරිහෙන්නාවූ; අසීතිවස්සසහස්සායුකානං, අසූදහසක් අවුරුදු වයස්ඇත්තාවූ; තෙසං මනුස්සානං, එබඳු මනුෂ්‍යයන්ට; චත්තාරීසංවස්සසහස්සායුකා පුත්තා අහෙසුං, (අදත්තාදානයහා ප්‍රාණඝාතය කාරණකොට ගෙණ) සතළිස් දහසක්අවුරුදු ආයුෂයෙන් යුක්තවූ පුත්‍රයෝ උපන්නාහුය.

භික්ඛවෙ, මහණෙනි; චත්තාරීසංවස්සසහස්සායුකෙසු මනුස්සෙසු, සතළිස්දහසක් හවුරුදු ආයුෂයෙන් යුක්තවූ මනුෂ්‍යයන් ඇති කාලයෙහි; අඤ්ඤතරො පුරිසො, (ඔවුන් අතුරෙන්) එක්තරා පුරුෂයෙක්; පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං, පරපරිග්‍රහ වස්තුව සොරකමක්; ආදියි, සොරකම් කෙළේය; තමෙනං අග්ගහෙසුං, ඒ පුරුෂයා (සල්ව සල්වා) අල්වා බැඳගත්තාහුය; ගහෙත්වා, (සොරාහයි කියා) අල්වා බැඳගෙණ ගොස්; දෙව, දෙවයන්වහන්ස; අයං පුරිසො, මේ පුරුෂතෙම; පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං, අනුන් සන්තක වස්තුව ථෙය්‍යචිත්තයෙන්; ආදියි ඉති, සොරකම් කෙළේය යි; මුද්ධාවසිත්තස්ස ඛත්තියස්ස රඤ්ඤො, රාජ්‍යය කරන්නාවූ ක්ෂත්‍රිය රජහට; දස්සෙසුං, දැක්වූවාහුය; භික්ඛවෙ, මහණෙනි, එවං වුත්තෙ

මෙසේ දක්වා කී කල්හි; මුඛාවසිතො ඛත්තියො රාජා, රාජාභි
ෂික්ත ක්ෂත්‍රියරජතෙම; අම්භො පුරිස, කොල (කාලකන්නි) පුරු
ෂය; ත්වං, තෝ; පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං, පරපරිගෘහීතවූ
වස්තු සොරසිතින්; ආදියි, හැරගත්තේ; සච්චං කිර ඉති, සත්‍යයෙක්
දැයි යන; එතං, මේ වචනය; තං පුරිසං, ඒ පුරුෂයාගෙන්; අවො
ච, විචාළේය; දෙව, දෙවයන්වහන්ස; නහි ඉති, (මාවිසින් එබන්
දක්) නොකරණ ලද්දේයයි කියා; අවුච, රජහට සැලකෙළේය;
සම්පජානමුසා අභාසි, දැන දැන නැතැයි කියා බොරුකීය (මෙ
තෙම පළමුවෙන්ම මුසාවාදය ධනියරජහු මෙන් ලොකයාට
පහළකෙළේය.)

භික්ඛවෙ, මහණෙනි; ඉති ඛො, මෙසේ වනාහි; අධනානං ධ
නෙ අනනුප්පදියමානෙ, නිර්ධනීජනයන්ට වස්තුප්‍රදානය නොකර
ණලදකල්හි; දාළිද්දියං වෙපුල්ලමගමාසි, (කෘපණඩිකායාචකව
ණිබ්බක) දරිද්‍රසමූහයා විපුලභාවයට ගියේය; දාළිද්දියෙ වෙපුල්ල
ගතෙ, "දළිද්දියානං භාවො සමූහො දාළිද්දියං" යනාර්‍ථයෙන් දා
ළිද්දිය නම්වූ) දිළිඳු සමූහයා විපුලභාවයට ගියකල්හි; අදින්නා
දානං වෙපුල්ලමගමාසි, අදත්තාදානය මහත් වශයෙන් පැවැත්
තේය; අදින්නාදානෙ වෙපුල්ලගතෙ, අදත්තාදානය බහුලව පැ
වතිකල්හි; සත්‍ථං වෙපුල්ලමගමාසි, ආයුධ (සමූහය) විපුලත්වයට
පැමිණියේය; සත්‍ථෙ වෙපුල්ලගතෙ, ආයුධ (සමූහය) විපුලත්ව
යට ගියකල්හි; පාණාතිපාතො වෙපුල්ලමගමාසි, ප්‍රාණඝාතය
මහත්බවට ගියේය; පාණාතිපාතෙ වෙපුල්ලගතෙ, ප්‍රාණඝාතය
මහත්භාවයට ගියකල්හි; මුසාවාදො වෙපුල්ලමගමාසි, මුසාවාද
ය විපුලත්වයට පැමිණියේය; මුසාවාදෙ වෙපුල්ලගතෙ, මුසාවාද
ය විපුලත්වයට පැමිණිකල්හි; තෙසං සත්තානං, ඒ සත්වයන්ගේ;
ආයුපි පරිහායි, (සතළිස් දහසක් පමණ) ආයුෂයද පිරිහුනේය; ව
ණ්ණොපි පරිහායි, (ආරොහපරිනාහ ආදිවූ) ශරීරවර්ණයද පිරිහු
නේය; ආයුනාපි පරිහායමානානං, ආයුෂයෙනුදු පිරිහෙන්නාවූ; ව
ණ්ණෙනපි පරිහායමානානං, වර්ණයෙනුදු පිරිහෙන්නාවූ; ච
ත්තාරීසං වස්සසහස්සායුකානං, සතළිස් දහසක් හවුරුදු ආයුෂ
යෙන් යුක්තවූ; තෙසං මනුස්සානං, ඒ මනුෂ්‍යයන් සන්තකවූ
(ස්ත්‍රීන්ගේ කුක්ෂියෙහි;) වීසති වස්සසහස්සායුකා පුත්තා අහෙසුං,
විසිදහසක් හවුරුද්දට ආයුෂයඇති පුත්‍රයෝ පිළිසිඳගත්තාහුය.

භික්ඛවෙ, මහණෙනි, වීසති වස්සසහස්සායුකෙසු මනුස්සෙසු,
විසිදහසක් හවුරුදු ආයුෂයෙන් යුක්තවූ මනුෂ්‍යයන් ඇති සම
යෙහි; අඤ්ඤතරො පුරිසො, එක්තර පුරුෂයෙක්; පරෙසං අදි
න්නං ථෙය්‍යසඞ්ඛාතං, අනුන්අයිති වස්තුව සොරසිතින්; ආදියි, පැ
හැරගත්තේය; තමෙනං, ඔහු; අඤ්ඤතරො පුරිසො, (ඔවුන්

අනුරෙන්) එක්තරාපුරුෂයෙක්; මුඩාවසිතතසස ධනනියසස ර ඤො, රාජාභි ෂිතකපාපතවූ ක්‍ෂත්‍රියරජහට; දෙව, දෙවයන්ව හන්ස; ඉත්‍ථං නාමො පුරිසො, මෙනම් ඇති පුරුෂතෙම; පරෙ සං අදින්නං ථෙය්‍යසං ඛාතං ආදියි ඉති, ඒමියන් අසිතිවූ වසතුව සොරකම් කෙළේයයි; ආරොචෙසි, රජහට ආරෙවනා කෙළේ ය; පෙසුඤ්ඤං අකාසි, (මෙතෙම දෙදෙනාක්නුගේ නුගුණකියා බිඳුවා) පිය ශූන්‍යකෙළේය.

ඉතිකඛවෙ, මහණෙනි; ඉති ඛො, මෙසේද වනාහි; අධනානං ධනෙ අනනුප්පදියමානෙ, නිර්ධනීන්ට ධනප්‍රදානය නොකරණ කල්හි; දාළිද්දියං වෙපුල්ලමගමාසි, දරිද්‍රතාව විපුලත්වයට පැමිණි යේය; දාළිද්දියෙ වෙපුල්ලගතෙ, දරිද්‍රතාව විපුලත්වයට පැමිණි කල්හි; අදින්නාදානං වෙපුල්ලමගමාසි, අදත්තාදානය විපුලත්වය ට පැමිණියේය; අදින්නාදානෙ වෙපුල්ලගතෙ, අදත්තාදානය වි පුලත්වයට පැමිණිකල්හි; සත්‍ථං වෙපුල්ලමගමාසි, ශස්ත්‍ර විපුලත්ව යට පැමිණියේය; සත්‍ථෙ වෙපුල්ලගතෙ, ශස්ත්‍ර විපුලත්වයට පැමිණිකල්හි; පාණාතිපාතො වෙපුල්ලමගමාසි, ප්‍රාණඝාතය විපුලත්වයට පැමිණියේය; පාණාතිපාතෙ වෙපුල්ලගතෙ, ප්‍රාණ ඝාතය විපුලත්වයට පැමිණිකල්හි; මුසාවාදො වෙපුල්ලමගමාසි, මුසාවාදය විපුලභාවයට පැමිණියේය; මුසාවාදෙ වෙපුල්ලගතෙ, මුසාවාදය විපුලභාවයට පැමිණිකල්හි; පිසුනාවාචා වෙපුල්ලම ගමාසි, පෛශුන්‍යය විපුලභාවයට පැමිණියේය; පිසුනායවාචාය වෙපුල්ලගතාය, පෛශුන්‍යය විපුලභාවයට පැමිණිකල්හි; තෙ සං සත්තානං, ඒ සත්වයන්ගේ; ආයුපි පරිහායි, ආයුෂයද පිරිහුනේ ය; වණ්ණොපි පරිහායි, ශරීරවර්ණයද පිරිහුනේය; ආයුනාපි පරි හායමානානං, ආයුෂයෙන්ද පිරිහෙන්නාවූ; වණ්ණෙනපි පරිහා යමානානං, ශරීරවර්ණයෙන්ද පිරිහෙන්නාවූ; අසීතිවස්සසහ ස්සායුකානං, අසූදහසක් අවුරුදු ආයුෂඇත්තාවූ; තෙසං මනුස්සා නං, ඒමනුෂ්‍යයන් සම්බන්ධවූ (ස්ත්‍රීන්ගේ කුක්‍ෂියෙහි;) දසවස්ස ස හස්සායුකා පුත්තා අහෙසුං, දසදහසක් අවුරුදු ආයුෂඇති පුත්‍ර යෝ පිළිසිඳගත්තාහුය.

ඉතිකඛවෙ, මහණෙනි; දසවස්සසහස්සායුකෙසු මනුස්සෙසු, ද ශවර්ෂසහස්‍රායුෂ්කමනුෂ්‍යයන්ඇති සමයෙහි, (ඉදං, යනු නිපාතමා ත්‍රයක) එකෙ සත්තා, සමහර සත්වකෙණෙක්; වණ්ණවන්තා හො න්ති, වර්ණවත්වූවාහුය; එකෙ සත්තා, සමහර සත්වකෙණෙක්; දුබ්බණ්ණා, දුර්වර්ණවූවාහුය; තත්‍ථ, ඒ සත්වයන් අතුරෙන්; යෙ තෙ සත්තා දුබ්බණ්ණා, යම් ඒ සත්වකෙණෙක් දුර්වර්ණ යෝද; තෙ, ඒ දුර්වර්ණසත්වයෝද; වණ්ණවන්තෙ සත්තෙ, වර්ණවත් සත්වයන්ට; අභිජ්ඣායන්තා, ලොභය කරමින්; පරෙසං දාරෙසු, අනුන්සන්තක

කවූ දරුවන්කෙරෙහි; චාරිත්තං ආපජ්ජිංසු, සවරූප නොවන්නාවූ චාරිත්‍රයට පැමුණුනාහුය; (හෙවත් පරදාරක්‍රියාව කළාහුය.)

භික්ඛවෙ, මහණෙනි; ඉති ඛො, මෙසේ වනාහි; අධනානං ධනෙ අනනුප්පදියමානෙ, නිර්ධනයන්ට ධනප්‍රදානය නොකරණලදකල්හි; දාළිද්දියං වෙපුල්ලමගමාසි, දරිද්‍රතාව විපුලත්වයට පැමිණියේය; දාළිද්දියෙ වෙපුල්ලගතෙ, දරිද්‍රතාව විපුලත්වයට ගියකල්හි; අදින්නාදානං වෙපුල්ලමගමාසි, අදත්තාදානය විපුලත්වයට පැමිණියේය; අදින්නාදානෙ වෙපුල්ලගතෙ, අදත්තාදානය විපුලභාවයට ගියකල්හි; සත්ථං වෙපුල්ලමගමාසි, ශස්ත්‍ර විපුලභාවයට ගියේය; සත්ථෙ වෙපුල්ලගතෙ, ශස්ත්‍ර විපුලභාවයට ගියකල්හි; පාණාතිපාතො වෙපුල්ලමගමාසි, සත්වඝාතනය මහන්තභාවයට පැමිණියේය; පාණාතිපාතෙ වෙපුල්ලගතෙ, සත්වඝාතනය මහන්තභාවයට පැමිණිකල්හි; මුසාවාදො වෙපුල්ලමගමාසි, මුසාවාදය විපුලත්වයට පැමිණියේය; මුසාවාදෙ වෙපුල්ලගතෙ, මුසාවාදය විපුලත්වයට පැමිණිකල්හි; පිසුනාවාචා වෙපුල්ලමගමාසි, පෛශුන්‍යය විස්තාරවූයේය; පිසුනායවාචාය වෙපුල්ලගතාය, පෛශුන්‍යය විස්තාරවූ කල්හි; කාමෙසු මිච්ඡාචාරො වෙපුල්ලමගමාසි, කාමමිථ්‍යාචාරය විපුලත්වයට පැමිණියේය; කාමෙසු මිච්ඡාචාරෙ වෙපුල්ලගතෙ, කාම මිථ්‍යාචාරය විපුලත්වයට පැමිණිකල්හි; තෙසං සත්තානං, ඒ සත්වයන්ගේ; ආයුපි පරිහායි, ආයුෂයද පිරිහුණේය; වණ්ණොපි පරිහායි, වර්ණයද පිරිහුණේය; ආයුනාපි පරිහායමානානං, ආයුෂයෙනුදු පිරිහෙන්නාවූ; වණ්ණෙනාපි පරිහායමානානං, වර්ණයෙනුදු පිරිහෙන්නාවූ; දසවස්සසහස්සායුකානං තෙසං මනුස්සානං, දසදහසක් හවුරුදු ආයුෂඇති ඒ මනුෂ්‍යයන් සම්බන්ධවූ; (සතීන්ගේ කුක්ෂියෙහි) පඤ්චවස්සසහස්සායුකා පුත්තා අහෙසුං, පන්දහසක් අවුරුදු ආයුෂඇති පුත්‍රයෝ පිළිසිඳගත්තාහුය.

භික්ඛවෙ, මහණෙනි; පඤ්චවස්සසහස්සායුකෙසු මනුස්සෙසු, පන්දහසක් හවුරුදු ආයුෂයෙන් යුක්තවූ මනුෂ්‍යයන් ඇති සමයෙහි; ඵරුසාවාචා, පරුෂවාක්නම් අකුශලයද; සම්ඵප්පලාපොච, සම්ඵප්‍රලාප නම් අකුශලයද යන; වෙ ධම්මා, ඒප්‍රකාර අකුශලයෝ; වෙපුල්ලමගමංසු, මහත්භාවයට පැමුණුනාහුය; ඒසු ධම්මෙසු, ඒප්‍රකාර ධර්මයන්; වෙපුල්ලගතෙසු, විපුලවූකල්හි; තෙසං සත්තානං, ඒ සත්වයන්ගේ; ආයුපි පරිහායි, ආයුෂයද පිරිහුණේය; වණ්ණොපි පරිහායි, වර්ණයද පිරිහුණේය; ආයුනාපි පරිහායමානානං, ආයුෂයෙනුදු පිරිහෙන්නාවූ; වණ්ණෙනාපි පරිහායමානානං, වර්ණයෙනුදු පිරිහෙන්නාවූ; තෙසං පඤ්චවස්සසහස්සායුකානං මනුස්සානං, පන්දහසක් අවුරුදු ආයුෂඇති ඒ මිනිසුන් සම්බන්ධවූ

(ස්ත්‍රීන්ගේ කුක්ෂියෙහි) අපෙකච්චෙ, (ඔවුන් අතුරෙන්) සමහරකෙණෙක්; අඩ්ඪතෙය්‍යවස්සසහස්සායුකා, දෙදහස් පන්සියයක් අවුරුද්දට ආයුෂඇත්තාවූද; අපෙකච්චෙ, සමහරකෙණෙක්; වෙවස්සසහස්සායුකා, අවුරුදු දෙදහසකට ආයුෂය ඇත්තාවූද; පුත්තා අහෙසුං, පුත්‍රයෝවූවාහුය; භික්ඛවෙ, මහණෙනි; අඩ්ඪතෙය්‍යවස්සසහස්සායුකෙසු මනුස්සෙසු, අඩතිය දහස්අවුරුදු ආයුෂයෙන් යුක්තවූ මනුෂ්‍යයන් ඇතිසමයෙහි; අභිජ්ඣාව්‍යාපාදො, වෙපුල්ලමගමාසි, (අධිකලොභයයි කියනලද අභිධ්‍යාවද නවවිධආඝාත වස්තුවෙහි පැවැත්තාවූ ක්‍රොධයද යනමේ) අභිධ්‍යාව්‍යාපාදය විපුලත්වයටගියේය; අභිජ්ඣාව්‍යාපාදෙ වෙපුල්ලගතෙ, බලවත්වූ ලොභද්වෙෂය විපුලත්වයට ගියකල්හි; තෙසං සත්තානං, ඒ සත්වයන්ගේ; ආයුපිපරිහායි, ආයුෂයද පිරිහුනේය, වණ්ණොපි පරිහායි, වර්ණයද පිරිහුනේය; ආයුනාපි පරිහායමානානං වණ්ණෙනාපි පරිහායමානානං, ආයුෂයෙන් හා වර්ණයෙන්ද පිරිහෙන්නාවූ; අඩ්ඪතෙය්‍යවස්සසහස්සායුකානං, අඩතියදහස් අවුරුදු ආයුෂඇත්තාවූ; තෙසං මනුස්සානං, ඒ මිනිස්නට; වස්සසහස්සායුකා පුත්තා අහෙසුං, දහසක් අවුරුදු ආයුෂඇති පුත්‍රයෝ වූවාහුය.

භික්ඛවෙ, මහණෙනි; වස්සසහස්සායුකෙසු මනුස්සෙසු, වර්ෂසහස්‍රායුෂ්කමනුෂ්‍යයන් ඇති කල්හි; මිච්ඡාදිට්ඨි වෙපුල්ලමගමාසි, මිථ්‍යාදෘෂ්ටිය විස්තාරවූයේය; මිච්ඡාදිට්ඨියා වෙපුල්ලගතාය, මිථ්‍යාදෘෂ්ටිය විපුලභාවයට ගියකල්හි; තෙසං සත්තානං, ඒ සත්වයන්ගේ; ආයුපි පරිහායි වණ්ණොපි පරිහායි, ආයුවර්ණය පිරිහුනේය; ආයුනාපි පරිහායමානානං වණ්ණෙනාපි පරිහායමානානං, ආයුෂයෙන්හා වර්ණයෙන්ද පිරිහෙන්නාවූ; වස්සසහස්සායුකානං, දහසක් අවුරුදු ආයුෂය ඇත්තාවූ; තෙසං මනුස්සානං, ඒ මනුෂ්‍යයන් සම්බන්ධිවූ; (ස්ත්‍රීන්ගේ කුක්ෂියෙහි) පඤ්චවස්සසතායුකා පුත්තාඅහෙසුං, පන්සියයක් අවුරුදු ආයුෂඇති පුත්‍රයෝ වූවාහුය.

භික්ඛවෙ, මහණෙනි; පඤ්චවස්සසතායුකෙසු මනුස්සෙසු, පන්සියගණන් අවුරුදු ආයුෂඇති මනුෂ්‍යයන් සමයෙහි, අධම්මරාගො, (මවුබුහුනනියන් පියබුහුනනියන් කෙරෙහි උපදින්නාවූ) අධර්මරාගයද, විසමලොභො, (යුක්තස්ථානයෙහි කරණලද බලවත්) විෂමලොභයද, මිච්ඡාධම්මො, (පුරුෂයන්කෙරෙහි පුරුෂයන්ට ස්ත්‍රීන්කෙරෙහි ස්ත්‍රීන්ට බලවත්ව උපදින්නාවූ) ඡන්දරාගයද යන; තයො ධම්මා වෙපුල්ලමගමංසු, මේ ත්‍රිවිධධර්මයෝ මහත් වශයෙන් පැවැත්තාහුය; තීසු ධම්මෙසු වෙපුල්ලගතෙසු, ත්‍රිවිධ ධර්මයන් විපුලභාවොපගතකල්හි; තෙසං සත්තානං, ඒ සත්වයන්ගේ; ආයුපි පරිහායි වණ්ණොපි පරිහායි, ආයුෂය හා වර්ණයද පිරිහුනේය; ආයුනාපි පරිහායමානානං වණ්ණෙනාපි පරිහාය

මානානං, ආයුෂයෙන්හා වර්ණයෙන්ද පිරිහෙන්නාවූ; පඤ්චවස්ස සතායුකානං, පන්සියයක් අවුරුදු ආයුෂඇත්තාවූ; තෙසං මනු ස්සානං, ඒ මිනිස්නට; අප්පෙකච්චෙ, (ඔවුන් අතුරෙන්) සමහර කෙනෙක්; අඩ්ඪතෙය්‍යවස්සසතායුකා, දෙසියපණස් හවුරුද්දට ආයුෂඇත්තාවූද; අප්පෙකච්චෙ, සමහර කෙනෙක්; ද්වෙවස්සස තායුකා පුත්තා අහෙසුං, දෙසියයක් හවුරුද්දට ආයුෂඇත්තාවූද පුත්‍රයෝ වූවාහුය; භික්ඛවෙ, මහණෙනි; අඩ්ඪතෙය්‍ය වස්සසතායු කෙසු මනුස්සෙසු, අඩනියසියක් හවුරුදු ආයුෂයෙන් යුක්තමනුෂ්‍ය යන් ඇතිසමයෙහි; අමත්තෙය්‍යතා, මවුන්ට හිතනොවනබවද; අපෙත්තෙය්‍යතා, පියන්ට හිතනොවනබවද; අසාමඤ්ඤතා, මහ ණදම් නොකරණබවද; අබ්‍රහ්මඤ්ඤතා, බඹසරවස් නොකරණ බවද; න කුලෙජෙට්ඨාපචායිතා, කුලදෙටුවන් නොපුදනබවද යන; ඉමෙ ධම්මා, මේ (අසම්‍යක් ප්‍රතිපත්ති) ධර්මයෝ, වෙපුල්ල මගමංසු, විපුලභාවයට ගියාහුය.

භික්ඛවෙ, මහණෙනි, ඉති ඛො, මෙසේ‍වනාහි, අධනානං ධනෙ අනනුප්පදීයමානෙ, නිර්ධනීන්ට වස්තුපරිත්‍යාග නොකරණ ලදකල්හි; දාළිද්දියං වෙපුල්ලමගමාසි, දිළිඳුබව මහත්වූයේය; දාළිද්දියෙ වෙපුල්ලංගතෙ, දිළිඳුබව මහත්වූකල්හි; අදින්නාදානං වෙපුල්ලමගමාසි, අදත්තාදානය මහත්වූයේය; අදින්නාදානෙ වෙපුල්ලංගතෙ, අදත්තාදානය මහත්වූකල්හි; සත්ථං වෙපුල්ලම ගමාසි; ආයුධ විපුලත්වයට පැමිණියේය; සත්ථෙ වෙපුල්ලංගතෙ, ආයුධ විපුලත්වයට පැමිණිකල්හි, පාණාතිපාතො වෙපුල්ලම ගමාසි, ප්‍රාණඝාතය විපුලත්වයට පැමිණියේය; පාණාතිපාතෙ වෙපුල්ලංගතෙ, ප්‍රාණඝාතය විපුලත්වයට පැමිණිකල්හි; මුසාවා දො වෙපුල්ලමගමාසි, මුසාවාදය විපුලත්වයට පැමිණියේය; මුසා වාදෙ වෙපුල්ලංගතෙ, මුසාවාදය විපුලත්වයට පැමිණිකල්හි; පිසු ණාවාචා වෙපුල්ලමගමාසි, පෛශුන්‍යය විපුලත්වයට පැමිණි යේය; පිසුණාය වාචාය වෙපුල්ලංගතාය, පෛශුන්‍යය විපුලත්ව යට ගියකල්හි; කාමෙසු මිච්ඡාචාරො වෙපුල්ලමගමාසි, කාමමි ථ්‍යාචාරය විපුලත්වයට පැමිණියේය; කාමෙසු මිච්ඡාචාරෙ වෙ පුල්ලංගතෙ, කාමමිථ්‍යාචාරය විපුලත්වයට පැමිණිකල්හි; ඵරු සාවාචා, පරුෂවචනයද; සම්ඵප්ඵලාපො ච, සම්ප්‍රලාපයද යන; ඉමෙ ධම්මා වෙපුල්ලමගමංසු, ඒප්‍රකාරධර්මයෝ විපුලත්වයට පැමි ණියාහුය; ඒසු ධම්මෙසු වෙපුල්ලංගතෙසු, ඒප්‍රකාරධර්මයන් විපු ලත්වයට පැමිණිකල්හි; අභිජ්ඣා ව්‍යාපාදො, වෙපුල්ලමගමාසි, අභිධ්‍යාව්‍යාපාදය විපුලත්වයට පැමිණියේය; අභිජ්ඣාව්‍යාපාදෙ වෙපුල්ලංගතෙ, අභිධ්‍යාව්‍යාපාදය විපුලත්වයට පැමිණිකල්හි; මිච්ඡාදිට්ඨි වෙපුල්ලමගමාසි, මිථ්‍යාදෘෂ්ටිය විපුලත්වයට පැමිණි

ය්‍ය; මිච්ඡාදිට්ඨියා වෙපුල්ලගතාය, මිථ්‍යාදෘෂ්ටිය විපුලත්වයට පැමිණිකල්හි; අධම්මරාගො, (අස්ථානයෙහි උපදින්නාවූ) අධර්මරාගයද; විසමලොභො, විෂමලොභයද; මිච්ඡාධම්මො, මිථ්‍යාධර්මයද යන; තයො ධම්මා වෙපුල්ලමගමංසු, ත්‍රිවිධධර්මයෝ විපුලත්වයට පැමිණියාහුය; තිසු ධම්මෙසු වෙපුල්ලගතෙසු, ත්‍රිවිධ ධර්මයන් විපුලත්වයට පැමිණිකල්හි; අමත්තෙය්‍යතා, අමත්තෙය්‍යතාවද; අපෙත්තෙය්‍යතා, අපෙත්තෙය්‍යතාවද; අසාමඤ්ඤතා, අශ්‍රාමණ්‍යතාවද; අබ්‍රහ්මඤ්ඤතා, අබ්‍රහ්මණ්‍යතාවද; න කුලෙ ජෙට්ඨාපචායිතා, න කුලෙජෙට්ඨාපචායිතාවද යන; ඉමෙ ධම්මා වෙපුල්ලමගමංසු, මේ ධර්මයෝ විපුලත්වයට පැමිණියාහුය; ඉමෙසු ධම්මෙසු වෙපුල්ලගතෙසු, මේ ධර්මයන් විපුලත්වයට පැමිණිකල්හි; තෙසං සත්තානං, ඒ සත්වයන්ගේ; ආයුපි පරිහායි, ආයුෂයද පිරිහීන; වණ්ණොපි පරිහායි, ශරීරවර්ණයද පිරිහීන; ආයුනාපි පරිහායමානානං, ආයුෂයෙන්ද පිරිහෙන්නාවූ; වණ්ණෙනපි පරිහායමානානං, වර්ණයෙන්ද පිරිහෙන්නාවූ; අඩ්ඪතෙය්‍ය වස්සසතායුකානං, දෙසියපණස් හවුරුද්දට ආයුෂඇත්තාවූ; තෙසං මනුස්සානං, ඒ මනුෂ්‍යයන් සම්බන්ධවූ (ස්ත්‍රීන්ගේ කුක්ෂියෙහි,) වස්සසතායුකා පුත්තා අහෙසුං, සියක් අවුරුද්දට ආයුෂඇති පුත්‍රයෝ පිළිසිඳගත්තාහුය.

භික්ඛවෙ, මහණෙනි; යං, යම්බඳුවූ; ඉමෙසං මනුස්සානං, මේ මනුෂ්‍යයන්ට; දසවස්සායුකා පුත්තා භවිස්සන්ති, දසඅවුරුදු ආයුෂ ඇතිපුත්‍රයෝ වෙද්ද; සො සමයො, එබඳු කාලයකුත්; භවිස්සති, ඇතිවන්නේය, භික්ඛවෙ, මහණෙනි; දසවස්සායුකෙසු මනුස්සෙසු, දසහවුරුදු වයස්වූ මනුෂ්‍යයන් ඇති සමයෙහි; පඤ්චමාසිකා කුමාරිකා, පස්මැසිකුමාරිකාවෝ; අලම්පතෙය්‍යා භවිස්සන්ති, (පස්මැසි කුමාරවරුන්ට) අනුරූපවන්නාහුය; භික්ඛවෙ මහණෙනි; දසවස්සායුකෙසු මනුස්සෙසු, දශවර්ෂායුෂ්ක මනුෂ්‍යයන් ඇති සමයෙහි; ඉමානි රසානි, මේ රසයෝ; අන්තරධායිස්සන්ති, අතුරුදහන්වන්නාහුය; සෙය්‍යථීදං? ඒ (රසයෝ නම්) කවරේද?; සප්පි, ගිතෙල් රසය; නවනීතං, වෙඬරුරසය, තෙලං, තෙල්රසය, මධු, මීරසය; ඵාණිතං පැණිරසය; ලොණං ඉති, ලවණරසයයි (යන මේ රසයෝ අතුරුදහන්වන්නාහුය.)

භික්ඛවෙ, මහණෙනි; දසවස්සායුකෙසු මනුස්සෙසු, දසහවුරුදු මනුෂ්‍යයන් ඇති කාලයෙහි; අග්ගභොජනානං, අග්‍රභොජනය (අනුභවකරන්නාවූ රජදරුවන්ට;) කුද්‍රූසකො භවිස්සති, හමුසාල් වරුසාල් (අග්‍රභොජන) වන්නේය:-භික්ඛවෙ, මහණෙනි; එතරහි, දැන් (මේ සමයෙහි;) අග්ගභොජනානං, අග්‍රාහාර අනුභවකරන්නාවූන්ට; සාලිමංසොදනො සෙය්‍යථාපි, හැල්මස් භොජනය

යම්සේද; භික්ඛවෙ මහණෙනි; එවමෙව ඛො, එපරිද්දෙන්ම, දසවස්සායුකෙසු මනුස්සෙසු, දශවර්ෂායුෂකමනුෂ්‍යයන් ඇතිකාලයෙහි; අග්ගභොජනානං, අග්‍රභොජනය (අනුභවකරණ රජදරුවන්ට;) කුද්‍රූසකො භවිස්සති, කුද්‍රූසකනම් භොජනය වන්නේය—

භික්ඛවෙ, මහණෙනි, දසවස්සායුකෙසු මනුස්සෙසු, දශවර්ෂායුෂක මනුෂ්‍යයන් ඇති සමයෙහි; දසකුසලකම්මපථා, දශකුශල මාර්ගධර්මයෝ; සබ්බෙන සබ්බං, සියල්ලෙන් සියල්ල; අන්තරධායිස්සන්ති, විනාශවන්නාහුය; දසඅකුසලකම්මපථා; (ප්‍රාණඝාතකිරීම්ආදිවූ) දශඅකුශලමාර්ගධර්මයෝ, අතිවිය දිප්පිස්සන්ති, අතිශයින් බබලන්නාහුය; භික්ඛවෙ, මහණෙනි; දසවස්සායුකෙසු මනුස්සෙසු, දශවර්ෂායුෂක මනුෂ්‍යයන් ඇතිසමයෙහි; කුසලන්තිපි න භවිස්සති, කුශලයයි යන නාමමාත්‍රයකුදු නැත්තේය; කුසලස්ස කාරකො, කුසල් කරන්නෙක් නම්; කුතො පන, කැලම නොවන්නේය.

භික්ඛවෙ, මහණෙනි; දසවස්සායුකෙසු මනුස්සෙසු, දශවර්ෂායුෂක මනුෂ්‍යයන් ඇති සමයෙහි; යෙ තෙ අමත්තෙය්‍යා භවිස්සන්ති, යම් ඒ කෙණෙක් මවුන්ට හිතවශයෙන් නොපවතිද්ද; අපෙත්තෙය්‍යා, පියන්ට හිතවශයෙන් නොපවතිද්ද; අසාමඤ්ඤා, මහණදම් නොකෙරෙද්ද; අබ්‍රහ්මඤ්ඤා, බඹසරවස් නොකෙරෙද්ද; න කුලෙජෙට්ඨාපචායිනො, කුලදෙටුවන් නොපුදද්ද; තෙ, ඒ අසත්පුරුෂජනයෝ; පූජා ච භවිස්සන්ති, (මහත්වශයෙන්) ප්‍රසිද්ධවන්නාහුය; පාසංසා ච, (මහත්වූ) ප්‍රශංසාද ඇතිවන්නාහුය; භික්ඛවෙ, මහණෙනි; එතරහි, දැන් (මේ වර්තමානකාලයෙහි;) සෙය්‍යථාපි, යම්සේ; මත්තෙය්‍යා, මවුන්කෙරෙහි සම්‍යක් ප්‍රතිපත්ති ඇත්තාහුද; පෙත්තෙය්‍යා, පියන්කෙරෙහි සම්‍යක් ප්‍රතිපත්ති ඇත්තාහුද; සාමඤ්ඤා, මහණදම් කරන්නාහුද; බ්‍රහ්මඤ්ඤා, බඹසරවස් රකින්නාහුද, කුලෙජෙට්ඨාපචායිනො, කුලදෙටුවන් කෙරෙහි සම්‍යක් ප්‍රතිපත්ති ඇත්තාහුද, තෙ, (මවුපියමහණබමුණු කුලදෙටුවන්ට උපස්ථානකරන්නාවූ) ඒ සත්පුරුෂයෝ; පූජා ච හොන්ති, (බුද්ධාදි මහොත්තමයන්විසින්) පූජ්‍ය වෙද්ද; පාසංසා ච, (බුද්ධාදි මහොත්තමයන්විසින්) ප්‍රශංසාවට පැමිණෙනු ලැබෙද්ද; භික්ඛවෙ, මහණෙනි; එවමෙව ඛො, එපරිද්දෙන්ම; දසවස්සායුකෙසු මනුස්සෙසු, දශවර්ෂායුෂක මනුෂ්‍යයන් ඇති සමයෙහි (හෙවත් එනදවස;) යෙ තෙ අමත්තෙය්‍යා භවිස්සන්ති, යම් ඒ කෙණෙක් මවුන්ට අසත්පුරුෂකම් කරන්නාහු වෙද්ද; අපෙත්තෙය්‍යා, (යම්කෙණෙක්) පියන්කෙරෙහි පවත්වනලද අසත්පුරුෂකම් ඇත්තාහු වෙද්ද; අසාමඤ්ඤා, (යම්කෙණෙක්) ශ්‍රමණ

යන්කෙරෙහි පවත්වනලද අසත්පුරුෂ ධම්ම ඇත්තාහු වෙද්ද;
අබ්‍රහ්මඤ්ඤ, (සම්‍යක් බාහිතපාපී) බ්‍රාහමණයන්කෙරෙහි
පවත්වනලද අසත්පුරුෂධම්ම ඇත්තාහු වෙද්ද; න කුලෙජෙට්ඨා
පචායිනො, (එසේම) කුලජ්‍යෙෂ්ඨයන්කෙරෙහි අසත්පුරුෂධම්ම
ඇත්තාහු වෙද්ද, තෙ, ඒ අසත්පුරුෂයෝ, පූජ්‍යාච භවිස්සන්ති;
ලොකප්‍රසිද්ධ වන්නාහුය; පාසංසාච, (යහපත යනාදීන්) ප්‍රශංසා
වටද පැමිණෙන්නාහුය.

භික්ඛවෙ, මහණෙනි; දසවස්සායුකෙසු මනුස්සෙසු, දශව
ර්ෂායුෂ්ක මනුෂ්‍යයන් ඇති සමයෙහි; මාතාති වා න භවිස්සති,
මවයයි යන සංඥාවක් නොවන්නේය; මාතුච්ඡාති වා, මවගේ
බුහුනනියෝයයි යන සංඥාවක් නැත්තේය; මාතුලානීති වා,
නැන්දනියෝයයි යන සංඥාවක් නැත්තේය; ආචරියභරියාති
වා, ආචාර්‍ය්‍යභාර්‍ය්‍යාවෝයයි යන සංඥාවක් නැත්තේය; ගරූනං
දාරාති වා, ගුරුන්ගේ අඹුදරුවෝයයි යන සංඥාවක් නැත්තේය;
(තමන්ගේ ඇඹෙනියන්ට මෙන් නානාප්‍රකාරවූ අසභ්‍යතෙපුල් කි
යන්නාහු අගෞරව වශයෙන් ඔවුනොවුන්කෙරේ එලඹ ග්‍රාම්‍යවූ
නින්දිතධම්මයෙහි හැසිරෙන්නාහුය) ලොකො, ලෝවැසිතෙම;
සම්භෙදං ගමිස්සති, මිශ්‍රභාවයට පැමිණෙන්නේය; අජෙළකා
යථා, තිරළුවෝ පලෙළුවෝ යම්සේද; කුක්කුටසූකරා යථා, කුක්
කුටසූකරයෝ යම්සේද; යථා සොණසිගාලා, බලුතැණිහිළුන් යම
සේද; (එමෙන් ලොකයා නිර්ලජ්ජාවට පැමිණෙන්නේය.)

භික්ඛවෙ, මහණෙනි; දසවස්සායුකෙසු මනුස්සෙසු, දශවර්ෂා
යුෂ්ක මනුෂ්‍යයන් ඇති කාලයෙහි; තෙසං සත්තානං, ඒ සත්ව
යන්ට; අඤ්ඤමඤ්ඤම්හි, අන්‍යොන්‍යයන්කෙරෙහි; තිබ්බො ආඝා
තො, බලවත්වූ ක්‍රොධය; පච්චුපට්ඨිතො භවිස්සති, (නැවත නැව
ත උත්පත්තිවශයෙන්) එලඹ සිටින්නේය; තිබ්බො ව්‍යාපාදො, තීව්‍ර
වූ ව්‍යාපාදයද (නැවත නැවත උත්පත්තිවශයෙන්) එලඹ සිටින්
නේය; තිබ්බො මනොපදොසො, තීව්‍රවූ මනඃප්‍රද්වේෂයද (නැවත
නැවත උත්පත්තිවශයෙන්) එලඹ සිටින්නේය; තිබ්බං වධකචි
ත්තං, තීව්‍රවූ මරණසිතද (ඔවුනොවුන්කෙරෙහි) එලඹ සිටින්නේ
ය; මාතුපි, මවගේ මරණසිතද; පුත්තම්හි, පුත්‍රයාකෙරෙහි පවත්
නේය; පුත්තස්සපි මාතරි, පුත්‍රයාගේ මරණවෙදනාවද මවුන්කෙ
රෙහි ලා පවත්නේය; පිතුපි පුත්තම්හි, පියාගේ ක්‍රොධචිත්තයද
පුත්‍රයාකෙරෙහි ලා එලඹසිටින්නේය; පුත්තස්සපි පිතරි, පුත්‍රයා
ගේ ක්‍රොධචිත්තයද පිතෘන් කෙරෙහි ලා පවත්නේය; භාතුපි
භාතරි, වැඩිමල්බෑයාගේ ක්‍රොධචිත්තයද මල්බෑයා කෙරෙහි ප
වත්නේය; භාතුපි භගිනියා, බෑයාගේ ක්‍රොධචිත්තයද බුහුනනි
යන් කෙරෙහි පවත්නේය; භගිනියාපි භාතරි, බුහුනනියන්ගේ

ක්‍රොධචිත්තයද බෑයාකෙරෙහි පවත්නේය; තිබ්බො ආඝාතො, (මෙසේ) බලවත්වූ ක්‍රොධය; පච්චුපට්ඨිතො භවිස්සති, (නැවත නැවත උත්පත්තිවශයෙන් ඔවුනොවුන්කෙරෙහි) ප්‍රත්‍යුපස්ථිත වන්නේය; තිබ්බො ව්‍යාපාදො, තීව්‍රවූ ව්‍යාපාදයද (එසේම ප්‍රත්‍යුපස්ථිතවන්නේය,) තිබ්බො මනොපදොසො, බලවත් චිත්තදූෂ්‍යයද (එසේම වන්නේය;) තිබ්බං වධකචිත්තං, තීව්‍රවූ මරණචෙතනාවද (ඔවුනොවුන්කෙරෙහි) පවත්නේය, සෙය්‍යථාපි, භික්ඛවෙ, මහණෙනි; මිගං දිස්වා, මෘගයෙක් දැක; සෙය්‍යථාපි මාගවිකස්ස, යම්සේ මුවදඩ වැද්දාට; තිබ්බො ආඝාතො පච්චුපට්ඨිතො භවිස්සති, බලවත්වූ කොපය (නැවත නැවත උත්පත්තිවශයෙන්) එළඹ සිටීද; තිබ්බො ව්‍යාපාදො, තීව්‍රවූ ව්‍යාපාද (ද්‍රොහ) චිත්තය එළඹ සිටීද; තිබ්බො මනොපදොසො, තීව්‍රවූ මනඃ ප්‍රදූෂ්‍යය වේද, තිබ්බං වධකචිත්තං, බලවත්වූ මරණසිත එළඹ සිටීද; භික්ඛවෙ, මහණෙනි; එවමෙව ඛො, ඒ (මෘගයන් මරණ මුවදඩ වැද්දනුට) මෙන්; දසවස්සායුකෙසු මනුස්සෙසු, දශවර්ෂායුෂ්ක මිනිසුන් ඇති සමයෙහි (හෙවත් මෘග සංවර්තනය පවත්නාකල්හි;) තෙසං සත්තානං, ඒ සත්වයන්ට; අඤ්ඤමඤ්ඤම්හි, ඔවුනොවුන් කෙරෙහි; තිබ්බො ආඝාතො, බලවත්වූ කොපය; පච්චුපට්ඨිතො භවිස්සති, (නැවත නැවත උත්පත්තිවශයෙන්) ප්‍රත්‍යුපස්ථිත වන්නේය; තිබ්බො ව්‍යාපාදො, තීව්‍රවූ ව්‍යාපාද චිත්තයද; තිබ්බො මනොපදොසො, තීව්‍රවූ මනඃ ප්‍රදූෂ්‍යයද; තිබ්බං වධකචිත්තං, බලවත්වූ මරණසිතද (ඔවුනොවුන්කෙරෙහි අවිච්ඡින්නප්‍රවෘත්තිවශයෙන්) පවත්නේය; මාතුපි පුත්තම්හි, මවගේ මරණසිතද පුත්‍රයාකෙරෙහි පවත්නේය; පුත්තස්සපි, පුත්‍රයාගේ කොපයද; මාතරි, මවකෙරෙහි පවත්නේය; පිතුපි, පියාන්ගේ බලවත්වූ කොපයද; පුත්තම්හි, පුත්‍රයාකෙරෙහි පවත්නේය; පුත්තස්සපි, පුත්‍රයාගේ බලවත්වූ කොපයද; පිතරි, පියාකෙරෙහි පවත්නේය; භාතුපි, බෑයාගේ බලවත්වූ කොපයද; භාතරි, බෑයාකෙරෙහි පවත්නේය; භාතුපි, බෑයාගේ බලවත්වූ කොපයද; භගිනියා, බුහුනනියන්කෙරෙහි පවත්නේය; භගිනියාපි, බුහුනනියන්ගේ බලවත් කොපයද; භාතරි, බෑයාකෙරෙහි පවත්නේය; තිබ්බො ආඝාතො, (මෙසේ) තීව්‍රවූ කොපයද; පච්චුපට්ඨිතො භවිස්සති, (නැවත නැවත උත්පත්තිවශයෙන් අන්‍යොන්‍යයන්කෙරෙහි) එළඹ සිටින්නේය; තිබ්බො ව්‍යාපාදො, තීව්‍රවූ ව්‍යාපාදයද; තිබ්බො මනොපදොසො, තීව්‍රවූ මනඃ ප්‍රදූෂ්‍යයද; තිබ්බං වධකචිත්තං, බලවත්වූ මරණසිතද (ඔවුනොවුන් කෙරෙහි පවත්නේය.)

භික්ඛවෙ, මහණෙනි; දසවස්සායුකෙසු මනුස්සෙසු, දශවර්ෂායුෂ්ක මනුෂ්‍යයන් ඇති සමයෙහි; සත්තාහං, සත්දවසක් (මුළුල්ලෙහි පවත්නාවූ); සත්ථන්තරකප්පො භවිස්සති, (රොගාන්තඃ



ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

කල්පය දුර්භික්ෂාන්තඃකල්පය ශස්ත්‍රාන්තඃකල්පය යන ත්‍රිවිධ අ
න්තඃකල්පයන්අතුරෙන්) ශස්ත්‍රාන්තඃකල්ප නම්වූ සත්වවිනාශයක්
වන්නේය; තෙ, ඒදසඅවුරුදු ආයුෂඇති සත්වයෝ; අඤ්ඤමඤ්ඤං මි
ගසඤ්ඤං පටිලභිස්සන්ති, (කොල තෙල මුවා ගණුව හනුව මරව
හසුකරව යන මෘගසංඥ ඔවුනොවුන්ට පහළවන්නාහුය; තෙසං,
ඒ මනුෂ්‍යයන්ගේ; හත්ථෙසු, හස්තසමූහයෙහි; තිණ්හානි සත්ථා
නි, තියුණුවූ (ඛඩ්ගකුන්තාදි) ආයුධසමූහයෝ; පාතුභවිස්සන්ති,
පහළවන්නාහුය; තෙ, ඒ මනුෂ්‍යයෝ; තිණ්හෙන සත්ථෙන, තී
ක්ෂණවූ ආයුධයෙන්; එසමිගො එසමිගොති, මේ මෘගයෙක මේ
මෘගයෙක යන සංඥවෙන්; අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්; ජීවිතා
වොරොපෙස්සන්ති, දිවි නසාගන්නාහුය.

අථඛො, ඉක්බිත්තෙන්; භික්ඛවෙ, මහණෙනි; තෙසං සත්තා
නං, ඒ සත්වයන් අතුරෙන්; එකච්චානං, (මේ ලොකවිනාශය අ
සා) සමහරකෙණෙකුන්ට; එවං භවිස්සති, මෙසේ සිතිවිල්ලෙක්
පහළවන්නේය; මයං, අපි; මා ච කඤ්චි, කිසිවෙක් නොබලම්හ;
අම්හෙ, අප; මා ච කොචි, කිසිවෙක් නොදකිවා; (හෙවත් දෙන්
නෙකු එක් තැනෙක්හි හිඳ ජීවත්වන්නට නොපිළිවන් වන්නේ
යයි සිතා; ) තිණගහණං වා, තෘණලතාගුම්බාදියෙන් ගහණස්ථා
නයකට හෝ; වනගහණං වා, වනයෙන් ගහණවූ ස්ථානයකට
හෝ (හෙවත් මනුෂ්‍යයන්ගෙන් ශූන්‍යවූ ගැඹුරු ආරණ්‍යයකට
හෝ;) රුක්ඛගහණං වා, (නොයාහැකි) වෘක්ෂගහණස්ථානයකට
හෝ; නදීවිදුග්ගං වා, ගඞ්ගාවන්ගේ අතුරුදිපයකට හෝ; පබ්බ
තවිසමං වා, (නොයාහැකිවූ) පර්වතවිෂමයකට හෝ (හෙවත් ප
ර්වතගුහා ගල්ගුහා ආදියකට හෝ; ) පවිසිත්වා, ප්‍රවිෂ්ටව; සත්තාහං,
සතියක්(මුළුල්ලෙහි සැඟවීසිට); වනමූලඵලාහාරා, වනමූල් ඵල අ
හාරයෙන්; යාපෙයාම, ජීවිකා වෘත්තිය කරන්නමෝනම්; යනානූ
න ඉති, මැනවැයි යන සිතක් (සමහරනුවනැති මනුෂ්‍යයන්ට) ප
හළවන්නාහුය; තෙ, ඒ මනුෂ්‍යයෝ; තිණගහණං, තෘණගහණ
යකට හෝ; වනගහණං, වනගහණයකට හෝ; රුක්ඛගහණං,
වෘක්ෂගහණයකට හෝ; නදීවිදුග්ගං, ගඞ්ගාවන් අතුරේ ද්වීපයකට
හෝ; පබ්බතවිසමං, පර්වතවිෂමයකට හෝ (හෙවත් පර්වතගුහා
ගල්ගුහා ආදියකට හෝ;) පවිසිත්වා, ප්‍රවිෂ්ටව; සත්තාහං, සතියක්
මුළුල්ලෙහි; වනමූලඵලාහාරා, වනමූල්ඵල ආහාරයෙන්; යාපෙ
ස්සන්ති, යපෙන්නාහුය; තෙ, ඒ මනුෂ්‍යයෝ; තස්ස සත්තාහස්ස
අච්චයෙන, ඒ සත්වෙනි දවස් ඉකුත්වූ කල්හි; තිණගහණා, තෘ
ණගහණස්ථානයෙන්; වනගහණා, වනගහණස්ථානයෙන්; රු
ක්ඛගහණා, වෘක්ෂගහණස්ථානයෙන්; නදීවිදුග්ගා, දුර්ගමනීය
ස්ථානයෙන්; පබ්බතවිසමා, පර්වතවිෂමස්ථානයෙන් (හෙවත්

දිවයින්හා පබ්බතගුහා ගල්ගුහා ආදියෙන්;) නික්ඛමිත්වා, නික්ම; හො සත්ත, පින්වත් සත්වය (යම්සේ ජීවත්උන හෙයින්;) දිට්ඨා, (තොප විසින් අපි) දක්නාලද්දහුද; (එපරිද්දෙන් නොයිත්;) ජීවසි, ජීවත්වන්නෙහිය; හො සත්ත, පින්වත් සත්වය; දිට්ඨා, (යම්සේ ජීවත්උන හෙයින් අපවිසින් තොපි) දක්නාලද්දහුද; (එපරිද්දෙන්ම) ජීවයි ඉති, ජීවත්ව උන් හෙයින් දක්නාලද්දෙහිවේදැයි; අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්; ආලිඞ්ගිත්වා, (මෙසේ සමගිසතුටුවන්නාවූ කථාවෙන් සුවදුක් කියා) ආලිඞ්ගනය කොට; සභාගායිස්සන්ති; සමග කථාකරන්නාහුය; සමස්සාසිස්සන්ති, (ඔවුනොවුන්) අස්වසන්නාහුය, (හෙවත් නොමිය උන් හෙයින් ඔවුනොවුන් ඇසදැකපුමෝ වේදැයි සමගිසතුටුවන්නාහුය) අථ ඛො, ඉක්බිත්තෙන්; භික්ඛවෙ, මහණෙනි; තෙසං සත්තානං, ඒසත්වයන්ට;එවං භවිස්සති, මෙසේ සිතිවිල්ලක් පහළවන්නේය; මයං ඛො, (සත්වයෙනි) අපි වනාහි; අකුසලානං ධම්මානං, (අධිකවූ) අකුශලධර්මයන්ගේ; සමාදානහෙතු, සමාදානය හෙතු කොටගෙණ, ආයතං, මහත්වූ; ඤාතික්ඛයං පත්තා, ඤාතිව්‍යසනයට පැමිණියම්හ; මයං, අපි; කුසලං කරෙය්‍යාම,(එහෙයින්) කුසල් කරන්නමෝනම්; යහපත්වන්නේමය; කිං කුසලං කරෙය්‍යාම, කවරනම් කුසලයක් කරන්නමෝද; මයං, අපි; පාණාතිපාතා විරමෙය්‍යාම, ප්‍රාණඝාතයෙන් වැළකුම්හ; ඉදං කුසලං ධම්මං, මේ කුශලකර්මය; සමාදාය, සමාදන්ව; වත්තෙය්‍යාම, පවත්නමෝනම්; යහපත්වන්නාහුයයි; (යන සිතක් ඔවුන්ට පහළවන්නාහුය;) තෙ, ඒ මනුෂ්‍යයෝ; පාණාතිපාතා විරමිස්සන්ති, ප්‍රාණඝාතයෙන් වළක්නාහුය; ඉදං කුසලං ධම්මං සමාදාය, මේ කුශලධර්මය සමාදන්ව; වත්තිස්සන්ති, වාශය කරන්නාහුය; තෙ, ඔව්හු; කුසලානං ධම්මානං සමාදානහෙතු, කුශලධර්මයන් සමාදන්වීම හෙතුකොට ගෙණ; ආයුනාපි වඩ්ඪිස්සන්ති, ආයුෂයෙන්ද වැඩෙන්නාහුය;වණ්ණෙනාපි වඩ්ඪිස්සන්ති, ශරීරවර්ණයෙන්ද වැඩෙන්නාහුය; ආයුනාපි වඩ්ඪමානානං, ආයුෂයෙනුදු වැඩෙන්නාවූ; වණ්ණෙනාපි වඩ්ඪමානානං, වර්ණයෙනුදු වැඩෙන්නාවූ; දසවස්සායුකානං, දසහවුරුද්දට ආයුෂය ඇත්නාවූ;තෙසං මනුස්සානං, ඒ මනුෂ්‍යයන්ට; වීසති වස්සායුකා, විසිහවුරුද්දට ආයුෂය ඇත්නාවූ; පුත්තා භවිස්සන්ති, පුත්‍රයෝ උපදනාහුය—

අථඛො, ඉක්බිත්තෙන්; භික්ඛවෙ, මහණෙනි; තෙසං සත්තානං, ඒ සත්වයන්ට; එවං භවිස්සති, මෙසේ සිතක් පහළවන්නේය; මයං ඛො, අපි වනාහි; කුසලානං ධම්මානං, කුශලධර්මයන්ගේ; සමාදාන හෙතු, සමාදන්වීම හෙතුකොට ගෙණ; ආයුනාපි වඩ්ඪාම, ආයුෂයෙන්ම වැඩෙම්හ, වණ්ණෙනාපි වඩ්ඪාම, වර්ණයෙන්ම

වැඩෙම්හ, මයං, අපි; භියො සොමත්තාය, බොහෝසෙසින්; කුස
ලං කරෙය්‍යාම, කුසල් කරන්නමෝ නම්; යන්නූන ඉති, යහපත්
වන්නේයයි යන (සිතක් පහළවන්නේය;) මයං, අපි; අදින්නාදා
නා විරමෙය්‍යාම, අදත්තාදානයෙන් වැළැක්කමෝ නම්; කාමෙසු
මිච්ඡාචාරා විරමෙය්‍යාම, කාමමිථ්‍යාචාරයෙන් වැළැක්කමෝ නම්;
මුසාවාදා විරමෙය්‍යාම, මුසාවාදයෙන් වැළැක්කමෝ නම්; පිසු
නාවාචාය විරමෙය්‍යාම, පෛශුන්‍යවචනයෙන් වැළැක්කමෝ
නම්; ඵරුසාවාචාය විරමෙය්‍යාම, පරුෂවචනයෙන් වැළැක්කමෝ
නම්; සම්ඵප්පලාපා විරමෙය්‍යාම, සම්ඵප්‍රලාපයෙන් වැළැක්ක
මෝ නම්; අභිජ්ඣං පජහෙය්‍යාම, (ප්‍රියවස්තූවෙහි ඉතා බලවත්ව
පවත්නාවූ) ලොභය හැරියමෝ නම්; ව්‍යාපාදං පජහෙය්‍යාම, (ස
ත්වයන්කෙරෙහි ගැටීම් ලක්‍ෂණකොට ඇත්තාවූ) ව්‍යාපාදය හැරි
යමෝ නම්; මිච්ඡාදිට්ඨිං පජහෙය්‍යාම, විපරීතදෘෂ්ටිය හැරියමෝ
නම්; අධම්මරාගඤ්ච, (අයුක්තස්ථානයෙහි උපදින්නාවූ අධර්මරා
ගයද; විසමලොභඤ්ච, (අනුභවකටයුතු ප්‍රියවස්තූවෙහි ඉතා බ
ලවත්ව උපදින්නාවූ) විෂමලොභයද; මිච්ඡාධම්මඤ්ච, (පුරුෂ
යන්ට පුරුෂයන්කෙරෙහි ස්ත්‍රීන්ට ස්ත්‍රීන්කෙරෙහි බලවත්ව උප
දින්නාවූ) ඡන්දරාගයද යන; තයො ධම්මෙ පජහෙය්‍යාම, ත්‍රිවිධවූ
අකුශලධර්මයන් හැරියමෝ නම්; යන්නූන, යහපත් වන්නේය;
මයං, අපි; මත්තෙය්‍යා අස්සාම, මවුන්ට උපස්ථානකරන්නමෝනා
ම්; පෙත්තෙය්‍යා, පියන්ට උපස්ථාන කරන්නමෝ නම්; සාමඤ්ඤා,
මහණදම් පුරන්නමෝ නම්; බ්‍රහ්මඤ්ඤා, බමුණනට උපස්ථානක
රන්නමෝ නම්; කුලෙජෙට්ඨාපචායිනො, කුලදෙටුවන්ට උපස්ථා
න කරන්නමෝ නම්; ඉදං කුසලං ධම්මං සමාදාය, මේ කුශලධර්ම
යන් සමාදන්ව; වත්තෙය්‍යාම ඉති, වාසය කරන්නමෝ නම්.(මෑ
නවැයි යන සිතක් ඔවුන්ට පහළවන්නාහුය; ) තෙ, ඒ මනුෂ්‍යයෝ;
මත්තෙය්‍යා භවිස්සන්ති, මවුන්ට හිතවශයෙන් පවත්නාහුය; පෙ
ත්තෙය්‍යා, පියන්ට හිතවශයෙන් පවත්නාහුය; සාමඤ්ඤා, මහණ
දම් පුරන්නාහුය; බ්‍රහ්මඤ්ඤා, බමුණන්ට හිතවශයෙන් පවත්නා
හුය; කුලෙජෙට්ඨාපචායිනො, කුලදෙටුවන් පුදන්නාහුය; ඉ
දං කුසලං ධම්මං, මේ යථොක්තවූ කුශලධර්මසමූහය; සමාදාය,
සමාදන්ව; වත්තිස්සන්ති, පවත්නාහුය; තෙ, ඒ සත්වයෝ; කුසලා
නං ධම්මානං, කුශලධර්මයන්ගේ; සමාදානහෙතු, සමාදන්වීම
හෙතුකොටගෙණ; ආයුනාපි වඩ්ඪිස්සන්ති, ආයුෂයෙන්ද වැඩෙන්
නාහුය; වණ්ණෙනපි වඩ්ඪිස්සන්ති, වර්ණයෙන්ද වැඩෙන්නාහුය;
ආයුනාපි වඩ්ඪමානානං, ආයුෂයෙන්ද වැඩෙන්නාවූ; වණ්ණෙන
පි වඩ්ඪමානානං, වර්ණයෙන්ද වැඩෙන්නාවූ; වීසතිවස්සායුකා
නං තෙසං මනුස්සානං, විසිහවුරුද්දට ආයුෂඇති ඒ මනුෂ්‍යයන්ට,

චත්තාරීසං වස්සායුකා පුත්තා භවිස්සන්ති, සතළිස් හවුරුද්දට ආයුෂඇති පුත්‍රයෝ උපදනාහුය; චත්තාරීසං වස්සායුකානං තෙසං මනුස්සානං, සතළිස් හවුරුද්දට ආයුෂයඇති ඒ මනුෂ්‍යයන්ට; අසීතිවස්සායුකා පුත්තා භවිස්සන්ති, අසූඅවුරුද්දට ආයුෂයඇති පුත්‍රයෝ උපදනාහුය; අසීතිවස්සායුකානං, අසූහවුරුද්දට ආයුෂය ඇති; තෙසං මනුස්සානං, ඒ මනුෂ්‍යයන්ට; සට්ඨිවස්සසතායුකා පුත්තාභවිස්සන්ති, එක්සිය සැටහවුරුද්දට ආයුෂයඇති පුත්‍රයෝ උපදනාහුය; සට්ඨිවස්සසතායුකානං, එක්සිය සැට හවුරුද්දට ආයුෂයඇත්තාවූ; තෙසං මනුස්සානං, ඒ මනුෂ්‍යයන්ට, වීසං තිනිවස්සසතායුකා පුත්තා භවිස්සන්ති, තුන්සිය විසිහවුරුද්දට ආයුෂය ඇතිපුත්‍රයෝ උපදනාහුය; වීසං තිනිවස්සසතායුකානං, තුන්සිය විසිහවුරුද්දට ආයුෂය ඇත්තාවූ; තෙසං මනුස්සානං, ඒ මනුෂ්‍යයන්ට; චත්තාරීසං ජබ්බස්සසතායුකා පුත්තා භවිස්සන්ති, සසිය සතළිස්හවුරුද්දට ආයුෂයඇති පුත්‍රයෝ උපදනාහුය; චත්තාරීසං ජබ්බස්සසතායුකානං, සසිය සතළිස්හවුරුද්දට ආයුෂය ඇත්තාවූ; තෙසං මනුස්සානං, ඒ මනුෂ්‍යයන්ට; වෙවස්සසහස්සායුකා පුත්තා භවිස්සන්ති, දෙදහසක් හවුරුද්දට ආයුෂය ඇති පුත්‍රයෝ උපදනාහුය; වෙවස්සසහස්සායුකානං, දෙදහස් හවුරුද්දට ආයුෂය ඇත්තාවූ; තෙසං, මනුස්සානං, ඒ මනුෂ්‍යයන්ට; චත්තාරිවස්සසහස්සායුකා පුත්තා භවිස්සන්ති, සාරදහසක් හවුරුද්දට ආයුෂය ඇති පුත්‍රයෝ උපදනාහුය; චත්තාරි වස්සසහස්සායුකානං, සාරදහසක් හවුරුද්දට ආයුෂය ඇත්තාවූ; තෙසං මනුස්සානං, ඒ මනුෂ්‍යයන්ට, අට්ඨවස්සසහස්සායුකා පුත්තා භවිස්සන්ති, අටදහසක් හවුරුද්දට ආයුෂය ඇති පුත්‍රයෝ උපදනාහුය, අට්ඨවස්සසහස්සායුකානං, අටදහසක් හවුරුද්දට ආයුෂය ඇත්තාවූ; තෙසං මනුස්සානං, ඒ මනුෂ්‍යයන්ට; වීසතිවස්සසහස්සායුකා පුත්තා භවිස්සන්ති, විසිදහසක් හවුරුද්දට ආයුෂය ඇති පුත්‍රයෝ උපදනාහුය; වීසතිවස්සසහස්සායුකානං, විසිදහසක් හවුරුද්දට ආයුෂය ඇත්තාවූ, තෙසං මනුස්සානං, ඒ මනුෂ්‍යයන්ට; චත්තාරීසං වස්සසහස්සායුකා පුත්තා භවිස්සන්ති, සතළිස්දහසක් හවුරුද්දට ආයුෂය ඇති පුත්‍රයෝ උපදනාහුය; චත්තාරීසං වස්සසහස්සායුකානං, සතළිස්දහසක් හවුරුද්දට ආයුෂය ඇත්තාවූ; තෙසං මනුස්සානං, ඒ මනුෂ්‍යයන්ට; අසීතිවස්සසහස්සායුකා පුත්තා භවිස්සන්ති, අසූදහසක් හවුරුද්දට ආයුෂය ඇති පුත්‍රයෝ උපදනාහුය.

භික්ඛවෙ, මහණෙනි; අසීතිවස්සසහස්සායුකෙසු මනුස්සෙසු, අසූදහසක් හවුරුද්දට ආයුෂයෙන් යුක්තවූ මනුෂ්‍යයන් ඇති කාලයෙහි; පඤ්චවස්සසතිකා කුමාරිකා, පන්සියයක් හවුරුදු ආයුෂ ඇති කුමාරිකාවන්; අලම්පතෙය්‍යා භවිස්සන්ති, පන්සියයක් හවුරුදු

ආයුෂඇති කුමාරයන්හා ආවාහවිවාහ එත්නාහුය; භික්ඛවෙ,
මහණෙනි, අසීතිවස්සසහස්සායුකෙසු මනුස්සෙසු, අඩ්ඪදහසක්
හවුරුද්දට ආයුෂයෙන් යුක්තවූ මනුෂ්‍යයන් ඇති කාලයෙහි; ඉච්ඡා,
(මුතුමැණික්ආදි උපභොගපරිභොගවස්තු පැතීමක් නැතිගෙ
සිත් බත් අනුභවකරණ වේලෙහි බත අනුභවකරන්නට උපද
නාවූ තෘෂ්ණාවයයි කියනලද) ඉච්ඡාවද; අනසනං, (ආහාර අනු
භවකිරීමෙන් කුක්ෂිය සම්පූර්ණවූකල නැවත අනුභව නොකෙ
රෙමියිකියා උපදනාවූ දුර්වල චෙතනාවයයි කියනලද) අනසන
යද; (හෙවත්) ආහාර අනුභවකරන්නට බැරිබවද; ජරා, (මහළුවී
මෙන් උපදනාවූ ප්‍රකට) ජරාවද;(යන)තයො ආබාධා භවිස්සන්ති,
මේ රොගතුනෙක් වන්නේය — භික්ඛවෙ,මහණෙනි;අසීතිවස්සස
හස්සායුකෙසු මනුස්සෙසු, අඩ්ඪදහසක්අවුරුද්දට ආයුෂයඇත්තාවූ
මනුෂ්‍යයන් ඇති කාලයෙහි; අයං ජම්බුදීපො, මේ ජම්බුද්වීපයතෙම,
ඉද්ධොචෙව භවිස්සති, (ස්ථූලභාවූ ආහාරපානවර්ණාදියෙන්) සමෘද්ධ
වන්නේය; ඵීතො ච, (හිරණ්‍යසුවර්ණාදි වස්තුවෙන්) සම්පූර්ණ
වන්නේය; ගාමනිගමරාජධානියො, ගම් නියංගම් රාජධානීහු; කු
ක්කුටසම්පාදිකා, කුකුලන්ගේ පාගමන් ඇත්තාහ; භික්ඛවෙ, මහ
ණෙනි; අසීතිවස්සසහස්සායුකෙසු මනුස්සෙසු, අශීතිවර්ෂසහස්‍රා
යුෂ්ක මනුෂ්‍යයන් ඇතිකාලයෙහි; අයං ජම්බුදීපො,මේ ජම්බුද්වීපය
තෙම, අවීචිමඤ්ඤෙ,(නිරිසතුන්ගෙන් නිරන්තරයෙන් පරිපූර්ණවූ)
අවීචිමහානරකයමෙන්; මනුස්සෙහි, මනුෂ්‍යයන්ගෙන්; ඵුටො භ
විස්සති, (සම්පූර්ණව) ස්ඵුටවන්නේය; නළවනං වා, නළව
නය හෝ; සරවනං වා, සරවනය හෝ; සෙය්‍යථාපි, යම්සේද;
(එපරිද්දෙන් මනුෂ්‍යයන් ගෙන් ජම්බුද්වීපය සම්පූර්ණවන්නේය)භි
ක්ඛවෙ, මහණෙනි; අසීති වස්සසහස්සායුකෙසු මනුස්සෙසු, අඩ්ඪ
දහසක් හවුරුද්දට ආයුෂයෙන් යුක්තවූ මනුෂ්‍යයන් ඇති කාලයෙ
හි; අයං බාරාණසී,මේ බරණැස්නුවර(නම්පෙරළී;) කෙතුමතී නා
ම රාජධානී භවිස්සති, කෙතුමතීනම් රාජධානියෙක් වන්නීය; ඉ
ද්ධාචෙව (ස්ථූලභ අන්නපානයෙන්) සමෘද්ධවන්නීය; ඵීතා ච, (හිර
ණ්‍යසුවර්ණාදිවස්තුවෙන්) පිරුණී වෙයි; බහුජනා ච, බො
හෝජනයන් ඇත්තීය; ආකිණ්ණ මනුස්සා ච, (අත්‍යන්ත සුඛසම
ජීපිතමනුෂ්‍යයන්ගෙන් නළවනසරවනසෙයින්) ගහණ වන්නීය;
සුභික්ඛා ච, (ශාලිව්‍රීහිආදි ධනධාන්‍යයෙන් උතුරුකුරුදිවඉන සෙ
යින්) සුභික්ෂවන්නීය; භික්ඛවෙ, මහණෙනි; අසීතිවස්සසහස්සා
යුකෙසු මනුස්සෙසු, අඩ්ඪදහසක්හවුරුද්දට ආයුෂයෙන් යුක්තවූ ම
නුෂ්‍යයන් ඇතිකාලයෙහි; ඉමස්මිං ජම්බුදීපෙ, මේ දඹදිව්තෙලෙ
හි; කෙතුමතී රාජධානී පමුඛානි, (දිගදෙලොස්යොදුන් පළල
සත්යොදුන් ඇත්තාවූ)කෙතුමතීනම් රාජධානියප්‍රමුඛකොට ඇති;

චතුරාසීති නගරසහස්සානි භවිස්සන්ති, (අත්‍යන්තසුඛ සම්ප්‍රාප්
ත මනුෂ්‍යයන්ගෙන් නළවනසරවනසෙයින් ගහණවූ දශවිධ
ශබ්දයෙන් එකනින්නාදවන්නාවූ) සුවාසූදහසක් නගරයන් ඇ
තිවන්නාහුය—භික්ඛවෙ, මහණෙනි; අසීතිවස්සසහස්සායුකෙසු
මනුස්සෙසු, අශීතිවර්ෂසහස්‍රායුෂ්කමනුෂ්‍යයන් ඇතිසමයෙහි; කෙ
තුමතී රාජධානියා, (ප්‍රවාලෙන්ද්‍රනීලස්ඵටිකමණිමකුටකූටාගාරස
හස්‍රයෙන් ඉන්ද්‍රායුධසහස්‍ර නැගීකලක්සෙයින් දිලිහෙන්නාවූ ප්‍රා
සාදසමූහයෙන් සමන්නාගතවූ) කෙතුමතී රාජධානියෙහි; ධම්මි
කො, (දශවිධ රාජධර්මයෙන් යුක්තවූ හෙයින්) ධාර්මිකවූ; ධම්මරා
ජා,(ධර්මයෙන්ම ලබනලද රාජ්‍යය ඇතිහෙයින්) ධර්මරාජ නම්වූ; චා
තුරන්තො, (චාතුර්මහාද්වීපයට ඊශ්වරහෙයින්) චාතුරන්තවූ; විජි
තාවී, (සක්වළ විජය කරණහෙයින්) විජිතාවීනම්වූ; ජනපදත්ථා
වරියප්පත්තො, (ධනදණ්ඩාදි දණ්ඩනයක් නැතිසෙයින්) ජනපදස්ථා
වරත්වප්‍රාප්තවූ; සත්තරතනසමන්නාගතො, සප්තවිධරත්නයෙන්
සමන්නාගතවූ; සඞ්ඛොනාම චක්කවත්තිරාජා, (පූර්වයෙහි දිඹුල්ද
ඹුආදියෙන් පසේබුදුන්ට ආවාසයක් කරදුන්නාවූ) සඞ්ඛනම් චක්‍ර
වර්තිරජෙක්; උප්පජ්ජිස්සති, උපදනේය; තස්ස, ඒ සඞ්ඛනම් ච
ක්‍රවර්තිරජහට; ඉමානි සත්තරතනානි, මේ සප්තවිධරත්නයෝ;
භවිස්සන්ති, පහළවන්නාහුය; සෙය්‍යථිදං?, ඒ (සප්තවිධරත්න
යෝ නම්) කවරේද?, චක්කරතනං, (ඉන්ද්‍රනීලමාණික්‍යප්‍රභාවැනිවූ
අරදහසකින් යුක්තවූ) චක්‍රරත්නය; හත්ථිරතනං, (නොයෙක් හ
ස්ත්‍යාලඞ්කාරයෙන් සරහනලද්දාවූ සුවාසූදහසක් හස්තීන්විසින්
පිරිවරණලද ආකාශගාමීවූ) හස්තිරත්නය; අස්සරතනං, (අශ්වා
ලඞ්කාරප්‍රභාස්වරවූ සුවාසූදහසක් අශ්වයන්විසින් පිරිවරණලද
රජතපර්වතයක්මෙන් දීප්‍රහෙනලද ආකාශයෙහි ගමන්ගන්නාවූ)
අශ්වරත්නය; මණිරතනං, (සතරගව්වෙක පමණතන්හි අන්ධ
කාර විධ්වංශනය කිරීමට සමර්ථවූ සුවාසූදහසක් මාණික්‍යයන් පි
රිවරණලද) මාණික්‍යරත්නය; ඉත්ථිරතනං, (නොයෙක් බිසෝව
රුන්විසින් පිරිවරණලද සූසැටක් පමණ අඟපලඳනාවෙන් දිව්‍ය
කන්‍යාවකමෙන් බබලන්නාවූ) ස්ත්‍රීරත්නය; ගහපතිරතනං, එසේ
ම සුවාසූදහසක් සිටුවරුන්විසින් පිරිවරණලද) ගෘහපතිරත්නය; ප
රිණායකරතනමෙව සත්තමං, (සතිස්යොදනෙක පැතිරපවත්නා
වූ චතුරඞ්ගිනීසෙනාවගේ සිත්ගන්නට සමර්ථවූ) පුත්‍රරත්නය සත්
වෙනිකොටඇති මේ සප්තවිධරත්නයෝ වන්නාහුය; අස්ස,
ඒ සඞ්ඛනම් චක්‍රවර්තිරජහුගේ; සූරවීරඞ්ගරූපා, ශෞර්‍යවීර්‍ය ස්වරූ
පඇත්තාවූ; පරසෙනප්පමද්දනා, පරශත්‍රූන් ප්‍රමර්දනයට සම
ර්ථවූ; පරොසහස්සං ඛො පන, සහස්‍රයකට අධිකවූ; පුත්තා භවිස්ස
න්ති, පුත්‍රයෝ පහළවන්නාහුය; සො, ඒ සඞ්ඛනම් චක්‍රවර්තිරජ

නෙමි, සාගරපරියන්තං, සාගරපර්‍යන්තවූ; ඉමං පඨවිං, මේ චක්‍ර වාඩාභ්‍යන්තරය; අදණ්ඩෙන, (ධනදණ්ඩාදි) දණ්ඩනයක් නැත්තාවූ; අසත්ථෙන, වධදණ්ඩනයක් නැත්තාවූ; ධම්මෙන, ධාර්මිකයෙන්; අභිවිජිය, දිග්විජයකොට; අජ්ඣාවසිස්සති, වාසයකරන්නේයයි වදාළසේක—

භික්ඛවෙ, මහණෙනි; අරහං, (සර්වක්ලේශයන්කෙරෙන් දුරුවූ බැවින්ද රාගාදික්ලේශනැමැති ශත්‍රූන් මාර්ගඥානයෙන් සමූලඝාතව නැසූහෙයින්ද සංසාරචක්‍රයාගේ අර කැසූහෙයින්ද දිව්‍යබ්‍රහ්ම නාගසුපර්ණ ගරුඩගන්ධර්ව සිද්ධවිද්‍යාධරාදීන්විසින් කරණලබන උදාරතර ආමිසප්‍රතිපත්තිපූජාවට යෝග්‍යහෙයින්ද ලෝභද්වේෂාදි පාපහේතූන් සුප්‍රහීනබැවින්ද රහසත් පව් නොකරණහෙයින්ද යනමෙතෙක් කාරණයෙන්) අර්හත්නම්වූ; සම්මාසම්බුද්ධො, (අවිපරීතකොට පරප්‍රත්‍යය නොවී ස්වලක්ෂණ සාමාන්‍යලක්ෂණවශයෙන් විශිෂ්ටඥානයෙන් දතයුතු චතුස්සත්‍යධර්මයන් පූර්වභාගයෙහි විදර්ශනඥානයෙන්ද අධිගමක්ෂණයෙහි මාර්ගඥානයෙන්ද අපරභාගයෙහි සර්වඥතාඥානයෙන්ද අවබොධකෙළේය යන මෙතෙක් කාරණයෙන්) සම්‍යක්සම්බුද්ධ නම්වූ; විජ්ජාචරණසම්පන්නො, (සර්වවිෂයවිදිතකරණයෙන් විද්‍යා නම්වූ විදර්ශනාඥාන මනොමයඍද්ධි ඍද්ධිවිධදිව්‍ය ශ්‍රොත්‍රපරචිත්ත විජානන පූර්වෙනිවාසානුස්මෘතිඥානදිව්‍යචක්ෂුරභිඥානාදි අෂ්ටවිද්‍යාවෙන්ද ශීලසංවරය ඉන්ද්‍රියගුප්තද්වාරබවය භොජනයෙහි මාත්‍රඥබවය ජාගර්‍යානුයොගය ශ්‍රද්ධා හ්‍රී අපත්‍රපාබාහුශ්‍රැත්‍යවීර්‍යස්මෘති ප්‍රඥා යන මේ එකොළොස් චරණධර්මයන්හා රූපාවචරධ්‍යානසතරය යන පසළොස් චරණධර්මයෙන් යුක්තහෙයින්) විද්‍යාචරණසම්පන්න නම්වූ; සුගතො, (ශොභනගමන සඞ්ඛ්‍යාතවිශුද්ධාර්‍යමාර්ගයෙන් නිර්වාණයට ක්ෂිප්‍රාභිඥාවශයෙන් ගියහෙයින්ද (නොහොත්) දීපඞ්කරපාදමූලයෙහි පටන් බොධිමූලය දක්වා සමතිංශත් පාරමිධර්මයන් පූරන්නාහු අවිපරීත ප්‍රතිපත්තියෙන් සියලු සත්වයන්ට හිතසැප එලවමින් ශාස්වතොච්ඡෙද කාමසුඛඅත්තකිලමථය යන චතුරාන්තයට නොගොස් ආර්‍යමාර්ගගතියෙන් ගියහෙයින්ද සකලසංස්කාර ප්‍රවෘත්තීන් අභාවයෙන් ඒකාන්තසුන්දරවූ අමෘතමහානිර්වාණයට ගියහෙයින්ද තත් තත් මාර්ගයෙන් ප්‍රහීන ක්ලේශයන්ගේ අපුනරාවෘත්ති කරණවශයෙන් මනාකොට ගියහෙයින්ද යුක්තවචනයක් නිෂ්පාදකාල්හි සත්‍යසාර්ථප්‍රියවචනයන් කථනයකරණහෙයින්ද ද්වාත්‍රිංශත්වර මහාපුරුෂලක්ෂණ අශීත්‍යනුව්‍යඤ්ජන ව්‍යාමප්‍රභාකෙතුමාලානුරඤ්ජිතරූපකාය සම්පත්තියන් ඇතිහෙයින්ද අනවිලම්බිතසඛලිතානුකර්ෂණනිෂ්පීඩනොත්කුටිකාකුලතාදි දෙෂරහිතව අපහසිතරාජහංසවෘෂභවරවාරණමෘගරාජගමනවිලාසඇති ශොභනවූ කායගමනින්හා විමල විපුල කරුණා ස්මෘති වීර්‍යාදි

ගුණවිශෙෂසහිතවූ ඤාණගමනින් සුගතහෙයින්ද යන මෙතෙක් කාරණයෙන්) සුගත නම්වූ; ලොකවිදූ, ("එකො ලොකො සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා ද්වෙ ලොකා නාමඤ්ච රූපඤ්ච තයො ලොකා තිස්සො වෙදනා චත්තාරො ලොකා චත්තාරො ආහාරා පඤ්චලොකා පඤ්චුපාදානක්ඛන්ධා ඡ ලොකා ඡ අජ්ඣත්තිකානි ආයතනානි සත්තලොකා සත්තවිඤ්ඤාණට්ඨිතියො අට්ඨලොකා අට්ඨලොකධම්මා නවලොකා නවසත්තාවාසා දසලොකා දසආයතනානි ද්වාදසලොකා ද්වාදසායතනානි අට්ඨාරසලොකා අට්ඨාරසධාතුයො" යනාදීන් දක්වනලද ඉන්ද්‍රියානින්ද්‍රියප්‍රතිබද්ධ ස්කන්ධයන්ගේ සමූහ සඞ්ඛ්‍යාත සංස්කාරලොකයද "සබ්බෙසම්පි සත්තානං ආසයං ජානාති අනුසයං ජානාති චරිතං ජානාති අධිමුත්තිං ජානාති අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ භබ්බාභබ්බෙ" යනාදීන් දක්වනලද ඉන්ද්‍රිය ප්‍රතිබද්ධ ස්කන්ධයන්ගේ සමූහසඞ්ඛ්‍යාත සත්වලොකයද "යාවතා චන්දිමසූරියා පරිහරන්ති දිසාභන්ති විරොචනා" යනාදීන් දක්වනලද අනන්තාපර්යන්ත ලොකධාතුයයි කියනලද අනින්ද්‍රියප්‍රතිබද්ධ රූපයන්ගේ සමූහසඞ්ඛ්‍යාත අවකාශලොකයද යන ත්‍රිවිධලොකය සර්වප්‍රකාරයෙන් අවබොධකෙළේය යන මෙතෙක් කාරණයෙන්) ලොකවිදූ නම්වූ; අනුත්තරො පුරිසදම්මසාරථි, ("ඉමස්මිං ලොකෙ පරස්මිං වා පන බුද්ධෙන සෙට්ඨො සදිසො නවිජ්ජති" යනාදීන් ශීලසමාධිප්‍රඥාවිමුක්ති විමුක්තිඥානදර්ශනාදිවූ ගුණවිශෙෂයෙන් ආත්මසදෘශාධික පුද්ගලාන්තර යන්නූ නැතිහෙයින්ද අදම්‍යහයි කියනලද අපලාලනාගරාජවූ ලොදර මහොදර අග්ගිසිඛ ධනපාලාදිවූ තිරශ්චීන පුරුෂයන්ද සච්චක නිගණ්ඨපුත්‍ර අම්බට්ඨ මාණවක පුෂ්කරසාති සොණදණ්ඩ කූටදන්ත ඝොටමුඛ උපාලි ගෘහපතිආදිවූ මනුෂ්‍යපුරුෂයන්ද ආලවක සූචිරොම ඛරරොම යක්ෂ ශක්‍රදෙවරාජ බකබ්‍රහ්මාදිවූ අමනුෂ්‍යපුරුෂයන්ද යන කායවාක් සංයමාදියෙහි යෙදියයුතු පුරුෂයන් සුදුසු සුදුසු පරිද්දෙන් තදඞ්ගවිනයාදියෙහි පිහිටුවනහෙයින්ද යන මෙතෙක් කාරණයෙන්) අනුත්තරපුරිසදම්මසාරථි නම්වූ; සත්ථා දෙවමනුස්සානං, (උත්කෘෂ්ටසත්වභව්‍යපුද්ගල පරිච්ඡෙදවශයෙන්) දිව්‍යමනුෂ්‍යයන්ට (හා උපනිශ්‍රය සම්පත්තිප්‍රදානයෙන් තිර්යග්ගතයන්ටද යථාර්හයෙන් ඓහිකාමුෂ්මික පරමපුරුෂාර්ථය යන මෙයින් අනුශාසනාකරණහෙයින්ද චොරකාන්තාරාදියෙන් සත්වයන් අතික්‍රමනයකොට නිරුපද්‍රවස්ථානයට පමුණුවන්නාවූ සාර්ථවාහකයෙක් සෙයින් ජාතිකාන්තාරාදියෙන් සත්වයන් තරණයකොට නිර්වාණක්ෂෙමභූමියට පමුණුවන්නේය යන මෙතෙක් කාරණයෙන්) ශාස්තෘ නම්වූ; බුද්ධො, (භූතභවිෂ්‍යත්

වර්‍තමානස්ථාවරජඞ්ගමනිත්‍යානිත්‍යාදි සකලඥෙය මණ්ඩලය කරතලාමලකක්‍රමයෙන් අවබොධකළ හෙයින්ද (නොහොත්) "සම්මාසම්බුද්ධ" යන පදයෙන් ප්‍රතිවෙධඥානානුභාවය ප්‍රකාශිතබැවින්ද නානානයනිපුණඅනෙකාධ්‍යාසසමුත්ථානාර්ථව්‍යඤ්ජනසම්පන්නාවිවිධප්‍රාතිහාර්‍ය්‍යයෙන්යුක්ත සද්ධර්‍මදෙශනාඥානානුභාවසමායොගයෙන්ද යන මෙතෙක් කාරණයෙන්) බුද්ධ නම්වූ; භගවා, (ලෞකික ලොකොත්තරහිතසුඛාභි නිර්‍වෘත්තක දානශීලාදි පාරප්‍රාප්ත භාග්‍යයෙන් යුක්තබැවින්ද ලොභ ද්වෙෂ මොහ විපරීත මනසිකාරාදි කෙලශ ශතසහස්‍රයන්හා සඞ්ක්‍ෂෙපයෙන් කෙලශ ස්කන්ධාභිසංස්කාරමෘත්‍යුදෙවපුත්‍රමාරයන් භග්න කළහෙයින්ද ඓශ්වර්‍ය්‍යපූර්‍ණ්‍යයශඃශ්‍රීසර්‍වාඞ්ගප්‍රසිද්ධිප්‍රයත්නය යන ෂාඩ්ගුණ්‍යයෙන් පරිපූර්‍ණ හෙයින්ද කුශලාදි ධර්‍මයන් පඤ්චස්කන්ධද්වාදශායතනඅෂ්ටාදශධාතුචතුස්සත්‍යද්වාවිංශතීන්ද්‍රිය ද්වාදශාඞ්ගප්‍රතීත්‍යසමුත්පාද ස්මෘතිප්‍රස්ථානසම්‍යක්ප්‍රධානාදි වශයෙන් විභාගකළහෙයින්ද දිව්‍යබ්‍රහ්මාර්‍ය්‍යවිහාරකාය චිත්තොපධිවිවෙකශූන්‍යතාප්‍රණිහිතානිමිත්තවිමොක්‍ෂපක්‍ෂාභිඥාදිවූ ලෞකික ලොකොත්තරඋත්තරිමනුෂ්‍යධර්‍මයන් භජනය කළහෙයින්ද කාමරූපාරූපසඞ්ඛ්‍යාත භවත්‍රයෙහි තෘෂ්ණාගමනය අර්හත්මාර්‍ගඥාන මුඛයෙන් වාන්තකළහෙයින්ද යන මෙතෙක් කාරණයෙන්) භගවත් නම්වූ; සෙය්‍යථාපි අහං, (තථාගත ගෞතම සම්‍යක්සම්බුද්ධවූ) මම යම්සේ; එතරහි, දැන් (මේ වර්‍තමාන කාලයෙහි;) ලොකෙ, ලොකයෙහි; උප්පන්නො, පහළවූයෙම්ද (එපරිද්දෙන්) අසීතිවස්සසහස්සායුකෙසු මනුස්සෙසු, අසූදහසක් හවුරුදු ආයුෂයෙන් යුක්තවූ මනුෂ්‍යයන් ඇති සමයෙහි; අරහං, (සර්‍වකෙලශයන්කෙරෙන් දුරුවනබැවින්ද රාගාදි කෙලශනැමැති ශත්‍රූන් මාර්‍ගඥානයෙන් සමූලඝාතව නසනබැවින්ද සංසාරචක්‍රයාගේ අර කපන හෙයින්ද දිව්‍යබ්‍රහ්මනාග සුපර්‍ණ ගරුඩගන්ධර්‍වසිද්ධවිද්‍යාධරාදීන්විසින් කරණුලබන උදාරතර ආමිසප්‍රතිපත්තිපූජාවට යොග්‍යවනබැවින්ද ලොභද්වෙෂාදි පාපහෙතූන් සුප්‍රහීනකරණබැවින්ද රහසත් පව්නොකරණ හෙයින්ද යන මෙතෙක් කාරණයෙන්) අරහත් නම්වූ; සම්මාසම්බුද්ධො, අවිපරීතකොට පරප්‍රත්‍යයනොවිස්වලක්‍ෂණ සාමාන්‍ය ලක්‍ෂණවශයෙන් විශිෂ්ටඥානයෙන් දතයුතු චතුස්සත්‍යධර්‍මයන් පූර්‍වභාගයෙහි විදර්‍ශනාඥානයෙන්ද අධිගමක්‍ෂණයෙහි මාර්‍ගඥානයෙන්ද අපරභාගයෙහි සර්‍වඥතාඥානයෙන්ද අවබොධකරන්නේය යන මෙතෙක් කාරණයෙන්) සම්‍යක්සම්බුද්ධ නම්වූ; විජ්ජාචරණසම්පන්නො, (සවිෂයවිදිතකරණාර්ථයෙන් විද්‍යා නම්වූ විදර්‍ශනාඥානමනොමයඍද්ධිඍද්ධිවිධදිව්‍යශ්‍රොත්‍රපරචිත්තවිජානනපූර්‍වෙනිවාසානුස්මෘති

ඥානදිව්‍යචක්ඛුරභිඥානාදි අෂ්ටවිද්‍යාවෙන්හා ශීලසංවරය ඉන්ද්‍රිය
යෙහි ගුප්තද්වාරබවය භොජනයෙහි මාත්‍රඥබවය ජාගර්‍ය්‍යානුයො
ගය ශ්‍රද්ධා හ්‍රී අපත්‍රපාබහුශ්‍රැත්‍යවීර්‍ය්‍යස්මෘතිප්‍රඥ යන මේ එකො
ළොස් චරණධම්මයන්හා රූපාවචරධ්‍යානසතරය යන පසළොස්
චරණධම්මයන් යුක්තහෙයින්) විජ්ජාචරණසම්පන්න නම්වූ; සුග
තො, (ශොභනගතිසඞ්ඛ්‍යාත විශුද්ධාර්‍ය්‍යමාර්ගයෙන් නිර්වාණයට
ක්ෂිප්‍රාභිඥාවශයෙන් යනහෙයින්ද (නොහොත්) සමත්‍රිංශත් පාර
මිධම්මයන් පූරන්නාවූ අවිපරීත ප්‍රතිපත්තියෙන් සියලු සත්වයන්ට
හිතසැපඑලවමින් ශාශ්වතොච්ඡෙදකාමසුඛාත්මක්ලමථය යන
චතුරන්තයට නොගොස් ආර්‍ය්‍යමාර්ගගතියෙන් යනහෙයින්ද
සකලසංස්කාරප්‍රවෘත්තීන්ගේ අභාවයෙන් ඒකාන්තසුන්දරවූ අමෘ
තමහානිර්වාණයට යනහෙයින්ද තත්තත්මාර්ගයෙන් ප්‍රහීන
ක්ලෙශයන්ගේ අපුනරාවෘත්තිකරණවශයෙන් මනාකොට යන
හෙයින්ද යුක්තවචනයක් නිෂ්පාද්‍යකල්හි සත්‍යසාර්ථප්‍රියවචන
යන් කථනය කරණ හෙයින්ද ද්වාත්‍රිංශත්වර මහාපුරුෂලක්ෂණ අ
ශීත්‍යනුව්‍යඤ්ජනව්‍යාමප්‍රභාකෙතුමාලානුරඤ්ජිත රූපකාය සම්ප
ත්තියක් ඇතිහෙයින්ද ද්‍රැතවිලම්බිතස්ඛලිතානුරඤ්ජිත නිෂ්පීඩ
නොත්කුටිකාකුලතාදිදොෂරහිතව අපහසිතරාජහංසවෘෂභවර
වාරණමෘගරාජගමනවිලාසඇති ශොභනවූ කායගමනින්හා විපු
ලවිමලකරුණාස්මෘතිවීර්‍ය්‍යාදි ගුණවිශෙෂසහිත ඥානගමනින් යු
ක්තවනහෙයින්ද යන මෙතෙක් කාරණයෙන්) සුගතනම්වූ;
ලොකවිදූ, ("එකො ලොකො සබ්බෙසත්තා ආහාරට්ඨිතිකා ද්වෙ
ලොකා නාමඤ්ච රූපඤ්ච තයො ලොකා තිස්සො වෙදනා ච
ත්තාරො ලොකා චත්තාරො ආහාරා පඤ්චලොකා පඤ්චුපාදාන
ක්ඛන්ධා ඡ ලොකා ඡ අජ්ඣත්තිකානි ආයතනානි සත්තලොකා
සත්තවිඤ්ඤාණට්ඨිතියො අට්ඨලොකා අට්ඨලොක ධම්මා නව
ලොකා නවසත්තාවාසා දසලොකා දසආයතනානි ද්වාදස
ලොකා ද්වාදසායතනානි අට්ඨාරසලොකා අට්ඨාරසධාතුයො" ය
නාදීන් දක්වනලද ඉන්ද්‍රියානින්ද්‍රියප්‍රතිබද්ධස්කන්ධයන්ගේ සමූ
හසඞ්ඛ්‍යාත සංස්කාරලොකයද "සබ්බෙසම්පි සත්තානං ආසයං
ජානාති අනුසයං ජානාති චරිතං ජානාති අධිමුත්තිං ජානාති අප්ප
රජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකා
රෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ භබ්බාභබ්බෙ" යනාදීන්
දක්වනලද ඉන්ද්‍රියප්‍රතිබද්ධ ස්කන්ධයන්ගේ සමූහසඞ්ඛ්‍යාත සත්ව
ලොකයද "යාවතා චන්දිම සූරියා පරිහරන්ති දිසා භන්ති විරොච
නා" යනාදීන් දක්වනලද අනන්තාපර්‍ය්‍යන්ත ලොකධාතුයයි කි
යනලද අනින්ද්‍රිය ප්‍රතිබද්ධ රූපයන්ගේ සමූහසඞ්ඛ්‍යාත අවකාශ
ලොකයද යන මේ ත්‍රිවිධලොකය සර්වප්‍රකාරයෙන් අවබොධ

කරන්නේය යන මෙතෙක් කාරණයෙන්) ලොකවිදූ නම්වූ; අනුත්තරො පුරිසදම්මසාරථි, ("ඉමස්මිං ලොකෙ පරස්මිං වා පන බුද්ධෙන සෙට්ඨො සදිසො න විජ්ජති" යනාදීන් ශීලසමාධි ප්‍රඥාවිමුක්ති විමුක්තිඥාන දර්ශනාදිවූ ගුණවිශෙෂයෙන් ආත්මසදෘශාධික පුද්ගලාන්තරයක්හු නැතිහෙයින්ද අදම්‍යහයි කියනලද ප්‍රමාණාතික්‍රාන්ත නෙකකොටිශතසහස්‍රසුරනරනාගශ්‍රමණබ්‍රාහ්මණාදිවූ සත්වයන් කායවාක්සංයමාදියෙහි සුදුසු සුදුසු පරිද්දෙන් තදඞ්ගවිනයාදියෙහි පිහිටුවනහෙයින්ද යන මෙතෙක් කාරණයෙන්) අනුත්තරපුරිසදම්මසාරථි නම්වූ; සත්ථා දෙවමනුස්සානං, (උත්කෘෂ්ටසත්ව භව්‍යපුද්ගල පරිච්ඡෙද වශයෙන්) දිව්‍ය මනුෂ්‍යයන්ට (හා උපනිශ්‍රයසම්පන්නනිදර්ශනයෙන් තිර්‍යග්ගතයන්ටද යථාර්හයෙන් ඓහිකාමුෂ්මිකපරමාර්ථය යන මෙයින් අනුශාසනාකරණහෙයින්ද චොරකාන්තාරාදියෙන් සත්වයන් අතික්‍රමණයකොට නිරුපද්‍රවස්ථානයට පමුණුවන්නාවූ සාර්ථවාහකයෙක් සෙයින් ජාතිකාන්තාරාදියෙන් සත්වයන් තරණයකොට නිර්වාණක්ෂෙමභූමියට පමුණුවන්නේය යන මෙතෙක් කාරණයෙන්) ශාස්තෘ නම්වූ; බුද්ධො, (භූතභවිෂ්‍යත් වර්තමානස්ථාවරජඞ්ගමනිත්‍යානිත්‍යාදි සකලඥෙයමණ්ඩලය කරතලාමලකක්‍රමයෙන් අවබොධකරණ හෙයින්ද (නොහොත්) "සම්මාසම්බුද්ධ" යන පදයෙන් ප්‍රතිවෙධඥානානුභාවය ප්‍රකාශිත බැවින්ද නානානයනිපුණඅනෙකාධ්‍යාශයසමුත්ථානාර්ථව්‍යඤ්ජනසම්පන්නවිවිධප්‍රාතිහාර්‍ය්‍යයෙන් යුක්ත සද්ධර්මදෙශනාඥානානුභාවසමායොගයෙන්ද යන මෙතෙක් කාරණයෙන්) බුද්ධනම්වූ; භගවා, (ලෞකිකලොකොත්තරහිතසුඛාග්නිර්වෘත්තක දානශීලාදි පාරප්‍රාප්තභාග්‍යයෙන් යුක්තබැවින්ද ලොභවෙෂමොහ විපරීත මනස්කාරාදි ක්ලෙශ ශතසහස්‍රයන්හා සංක්ෂෙපයෙන් ක්ලෙශස්කන්ධාභිසංස්කාරමෘත්‍යුදෙවපුත්‍රමාරයන් භග්නකරණහෙයින්ද ඓශ්වර්‍ය්‍යපූර්ණ්‍යයශඃශ්‍රීසංකල්පසිද්ධිප්‍රයත්නය යන ෂාඩ්ගුණ්‍යයෙන් පරිපූර්ණ හෙයින්ද කුශලාදිධර්මයන් පඤ්චස්කන්ධ ද්වාදශායතන අෂ්ටාදශධාතු චතුස්සත්‍ය ද්වාවිංශතීන්ද්‍රිය ද්වාදශාඞ්ග ප්‍රතීත්‍යසමුත්පාද ස්මෘතිප්‍රස්ථාන සම්‍යක්ප්‍රධානාදි වශයෙන් විභාගකරණහෙයින්ද දිව්‍යබ්‍රහ්මාර්‍ය්‍ය විහාරකාය චිත්තොපධිවිවෙකශූන්‍යතාප්‍රණිහිතානිමිත්තවිමොක්ෂපඤ්චාභිඥාදිවූ ලෞකිකලොකොත්තරඋත්තරිමනුෂ්‍යධර්මයන් භජනය කරණ හෙයින්ද කාමරූපාරූපසඞ්ඛ්‍යාත භවත්‍රයෙහි තෘෂ්ණාගමනය අග්‍රමාර්ගඥානමුඛයෙන් වාන්තකරණහෙයින්ද යන මෙතෙක් කාරණයෙන්) භගවත් නම්වූ; මෙත්තෙය්‍යො නාම භගවා, මෛත්‍රෙය නම් භගවත් අභීත් සම්‍යක්සම්බුද්ධ දිපදෝත්තම

කොණෙක්; ලොකෙ, ලොකයෙහි (හෙවත් කෙතුමතීනම් රාජධානියෙහි;) උප්පජ්ජිස්සති, (හිරුදහස් සඳදහස් නැංගාක්මෙන් ලොකය බබුලුවමින්) පහළවනසේක.

අහං, මම; සෙය්‍යථාපි, යම්සේ; එතරහි, දැන්; සදෙවකං, (පඤ්චකාමාවචර) දෙවියන් සහිතවූ; සමාරකං, සවෙතිකාමාවචර දෙවියන් සහිතවූ; සබ්‍රහ්මකං, (බ්‍රහ්මකායිකාදි) බ්‍රහ්මයන් සහිතවූ; සස්සමණබ්‍රාහ්මණිං, (ශාසන ප්‍රතිපක්ෂ මහණබමුණන්හා සමිතපාප බාහිතපාප) ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිතවූ; සදෙවමනුස්සං, සම්මුතිදෙවියන්හා පූර්වොක්තශ්‍රමණබ්‍රාහ්මණයන්හැර අවශෙෂ දිව්‍යමනුෂ්‍යයන්සහිතවූ; පජං, සත්වලොකයද යන; ඉමං ලොකං, ("සදෙවකං සමාරකං සබ්‍රහ්මකං" යන පදත්‍රයෙන් සඞ්ගෘහීතවූ අවකාශලොකයද "සස්සමණබ්‍රාහ්මණිං සදෙවමනුස්සං" යන පදද්වයෙන් සඞ්ගෘහීතවූ සත්වලොකයද යන) මේ සියලු ලොකය; සයං අභිඤ්ඤාය, තමාවිසින්ම (පරොපදෙශරහිතව විශිෂ්ටඥානයෙන්) දැන; සච්ඡිකත්වා, සාක්ෂාත් කොට; පවෙදෙමි; (ලොකයාහට) ප්‍රකාශකෙරෙම්ද; (එපරිද්දෙන්) සො, ඒ මෛත්‍රෙය සර්වඥතෙම; සදෙවකං, අරූපාවචර ලොකයන්සහිතවූ; සමාරකං, කාමාවචර දිව්‍යලොකයන් සහිතවූ; සබ්‍රහ්මකං, රූපීබ්‍රහ්මලොකයන් සහිතවූ; සස්සමණබ්‍රාහ්මණිං, ශ්‍රමණබ්‍රාහ්මණපක්ෂීන් සහිතවූ; සදෙවමනුස්සං, අවශෙෂදෙවියන්හා ක්ෂත්‍රියගෘහපති පක්ෂීන් සහිතවූ; පජං, (මේ චතුර්විධ පක්ෂීන් සඞ්ඛ්‍යාතවූ) ප්‍රජාව; (නොහොත්) පජං, (නාග ගරුඩාදිවශයෙන් අවශෙෂ) ප්‍රජාවයයි කියනලද; ඉමං ලොකං, (දිව්‍යබ්‍රහ්මමනුෂ්‍යාදිවසයෙන් විභාගකළාවූ) මේ සියලු ලොකය; සයං අභිඤ්ඤාය, තමාවිසින්ම (පරොපදෙශරහිතව විශිෂ්ටඥානයෙන්) දැන; සච්ඡිකත්වා, ප්‍රත්‍යක්ෂකොට; පවෙදෙස්සති (සියලු ලොකයාහට) ප්‍රකාශකරන්නේය.

සෙය්‍යථාපි, යම්සේ; අහං, මම; එතරහි, දැන්; ආදිකල්‍යාණං, පටන්ගැන්ම යහපත්වූ; (නොහොත් ශීලයෙන් ආදියෙහි ශොභනවූ) මජ්ඣෙකල්‍යාණං, මධ්‍යය යහපත්වූ; (නොහොත් සමථවිදර්ශනාමාර්ගයෙන් මධ්‍යයෙහි සුන්දරවූ) පරියොසානකල්‍යාණං, කෙළවර යහපත්වූ; (නොහොත් ඵලනිර්වාණයෙන් පර්යවසානයෙහි ශොභනවූ) ධම්මං, ධර්මය; දෙසෙමි, දෙශනාකෙරෙම්ද; සාත්ථං, අර්ථසම්පන්නවූ; සබ්‍යඤ්ජනං, (සිථිලධනිතාදි දශවිධව්‍යඤ්ජනයෙන් සම්පූර්ණබැවින්) ව්‍යඤ්ජනසම්පූර්ණවූ; කෙවලපරිපුණ්ණං, (අනුකතව්‍යවදානාර්ථයක් නැතිබැවින්) සර්වභාගයෙන් පරිපූර්ණවූ; පරිසුද්ධං, (පරිත්‍යජ්‍යවූ සංකෙලශිකධර්මයක්හුගේ අභාවයෙන් නිර්දොෂබැවින්) පරිශුද්ධවූ; බ්‍රහ්මචරියං, ශික්ෂාත්‍රය සඞ්ගෘහීතවූ සකලශාසනමාර්ගීය බ්‍රහ්මචර්‍ය්‍යය; පකාසෙමි, ප්‍රකාශකෙරෙම්ද; (එපරිද්දෙන්)

සො, ඒ මෛත්‍රෙය සර්වඥතෙම; ආදිකල්‍යාණං ආදිය යහපත්වූ; (නොහොන් ශීලයෙන් ආදියෙහි ශොභනවූ;) මජ්ඣෙකල්‍යාණං, මැද යහපත්වූ; (හෙවත් සමථවිදර්ශනාමාර්ගයෙන් මධ්‍යයෙහි සුන්දරවූ;) පරියොසානකල්‍යාණං, කෙළවර යහපත්වූ; (හෙවත් ඵලනිර්වාණයෙන් පර්‍ය්‍යවසානයෙහි ශොභනවූ) ධම්මං, ධර්මය; දෙසෙස්සති, දෙශනාකරන්නේය; සාත්ථං, (අනුමානාපගම උපමානාර්ථ දෙශනාව පවත්වනහෙයින්) අර්ථසම්පන්නවූ; සබ්‍යඤ්ජනං, (සිථිලධනිතාදිවූ දශවිධව්‍යඤ්ජනයෙන් සම්පූර්ණබැවින්) ව්‍යඤ්ජනසම්පූර්ණවූ; කෙවලපරිපුණ්ණං, (ප්‍රක්ෂෙප්‍යවූ අනුක්තව්‍යවදනාර්ථයක් නැතිබැවින්) සර්වභාගයෙන් පරිපූර්ණවූ; පරිසුද්ධං, (පරිත්‍යජ්‍යවූ සංක්ලෙශිකධර්මයන්හුගේ අභාවයෙන් නිර්දොෂබැවින්) පරිශුද්ධවූ; බ්‍රහ්මචරියං, (ශික්ෂාත්‍රය සංග්‍රහීතවූ සකලශාසනමාර්ග) බ්‍රහ්මචර්‍ය්‍යය; පකාසෙස්සති, (එකත්වනයාදිවූ විවිධවිශෙෂනය සහස්‍රාලඞ්කෘතකොට) ප්‍රකාශකරන්නේය.

සෙය්‍යථාපි, යම්සේ; අහං, මම; එතරහි, දැන්; අනෙකසතං, නොයෙක් සියගණන්; භික්ඛුසඞ්ඝං, භික්ෂුසඞ්ඝයා; පරිහරාමි, පරිහරණයකෙරෙම්ද, (හෙවත්) රක්ෂාකෙරෙම්ද; (එපරිද්දෙන්) සො, ඒ මෛත්‍රෙයසර්වඥතෙම; අනෙකසහස්සං, නොයෙක් දහස්ගණන්; භික්ඛුසඞ්ඝං පරිහරිස්සති, භික්ෂුසඞ්ඝයා පරිහරණය කරන්නේය; (හෙවත් රක්ෂාකරන්නේයයි වදාළසේක.)

අථඛො, ඉක්බින්තෙන්, භික්ඛවෙ, මහණෙනි, සඞ්ඛොරාජා, සඞ්ඛනම් චක්‍රවර්ත්තිරජතෙම; යෙන මහාපණාදෙන රඤ්ඤා, යම්බඳුවූ මහාපණාද නම් රජෙකුගේ හෙතුවෙන්; කාරාපිතො, (ශක්‍රදිව්‍යරජයාවිසින් විශ්වකර්ම නම් දිව්‍යපුත්‍රයා ලවා) කරවනලද්දාවූ; යූපො අස්ස, (ප්‍රවාලෙන්ද්‍රනීලස්ඵටිකමණිමකුටකූටාගාරසහස්‍රයෙන් ඉන්ද්‍රාසූබසහස්‍ර නැඟීකලක්සෙයින් දිළිහෙනලද පස්විසි යොදුන් උසඇත්තාවූ) රුවන් ප්‍රාසාදයෙක් ඇද්ද; තං යූපං, (වෙරළුමිණිපලගින් මිණිමුවුසේසතින් සිරියහනින් රුවන්කොතින් මිණිපහන්රැසින් සැදුම්ලද්දාවූ) ඒ ප්‍රාසාදය; උස්සාපෙත්වා, (ගඞ්ගානම් ගඟින්) ඔසවා; අජ්ඣාවසිත්වා, (කිංකිණීකාරවයෙන් කන්කලුවූ ඒ ප්‍රාසාදයෙහි) වාසයකොට; සමණබ්‍රාහ්මණකපණද්ධිකවණිබ්බකයාචකානං, ශ්‍රමණ බ්‍රාහ්මණ කෘපණද්ධික වණිබ්බක යාචකයන්ට; දදිත්වා, (සත්රුවන් ප්‍රාසාදය දානවශයෙන්) ප්‍රදානය කොට; විස්සජ්ජෙත්වා, (නිරපෙක්ෂාපරිත්‍යාගවශයෙන්) විසර්ජ්ජනය කොට; දානං දත්වා, දන්දී; භගවතො, (භග්නරාගාද්‍යර්ථයෙන්) භගවත් නම්වූ; අරහතො, (දිව්‍යබ්‍රහ්මනාගසුපර්ණගරුඩගන්ධර්වාදීන්විසින් කරණලද උදාරතර පූජාවන්ට යොග්‍යබැවින්) අර්හත් නම්වූ; මෙත්තෙය්‍යස්ස සම්මාසම්බුද්ධස්ස, මෛත්‍රෙය නම්

සම්‍යක්සම්බුද්ධ සර්වඥයන් වහන්සේගේ; සන්තිකෙ, සමීපයෙහි; කෙසමස්සුං ඔහාරෙත්වා, කෙස්රැවුලු කපා හැර; කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා, කාසාවසත්‍රයන් හැඳ පෙරව; අගාරස්මා, ගිහිගෙයින් නික්ම; අනගාරියං, අනගාරිය සඞ්ඛ්‍යාතවූ ප්‍රව්‍රජ්‍යාවට; පබ්බජිස්සන්ති, පැමිණෙන්නේය; එවං පබ්බජිතො සමානො, මෙසේ ප්‍රව්‍රජ්‍යාවෙන් සමන්නාගතවූයේ; එකො වූපකට්ඨො, එකලාව විවේකවූයේ; අප්පමත්තො, (ස්මෘතියගේ අවිප්‍රවාසයයි කියනලද) අප්‍රමාදයෙන් යුක්තවූයේ; ආතාපී, සම්‍යක්ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුක්තවූයේ; පහිතත්තො, නිර්වාණයට මෙහෙයනලද සිත්ඇතිව; විහරන්තො, (ස්ථානගමන නිෂද්‍යාදිවශයෙන්) වාසයකරන්නේ; කුලපුත්තා, (ක්ෂත්‍රියබ්‍රාහ්මණාදිවූ) කුලපුත්‍රයෝ; න චිරස්සෙව, නොබෝකලකින්ම; යස්ස අත්ථාය, යම් නිර්වාණයක් පිණිස; සම්මදෙව, මනාකොට; අගාරස්මා, ගිහිගෙයින් නික්ම; අනගාරියං, (කෘෂිවණික් ගොකර්මාන්තාදියක් නැතිහෙයින්) අනගාරිය සඞ්ඛ්‍යාතවූ ප්‍රව්‍රජ්‍යාවට; පබ්බජන්ති, පැමිණෙත්ද; තදනුත්තරං, ඒ උතුම්වූ; බ්‍රහ්මචරිය පරියොසානං, මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යයාගේ කෙළවර; දිට්ඨෙව ධම්මෙ, ඉහාත්මභාවයෙහිම; සයං අභිඤ්ඤාය, තමාගේඥාන චක්ෂුසයෙන්ම දැන; සච්ඡිකත්වා, සාක්ෂාත්කොට; උපසම්පජ්ජ විහරිස්සති, පැමිණ වාසයකරන්නේය; (හෙවත් අර්හත්ඵලයට පැමිණෙන්නේයයි) සර්වධර්මයෙහි අප්‍රතිහතවප්‍රඥාසඞ්ඛ්‍යාතවූ අනාගතඥානයෙන් වදාළසේක – මෙපමණකින් සංසාරගාමීවූ කුසලයට අනුසන්ධිදක්වා ශාන්තප්‍රණීතවූ නිර්වාණගාමීවූ කුශලධර්මයට අනුසන්ධිදක්වා වදාරන්නාවූ ත්‍රෛලොක්‍ය ප්‍රදීපායමානවූ ත්‍රිලොගුරු සම්‍යක්සම්බුද්ධ සර්වඥරාජොත්තමයානන් වහන්සේ නැවත "අත්තදීපා භික්ඛවෙ විහරථ අත්තසරණා අනඤ්ඤසරණා" යනාදි පාලිය වදාළසේක—

භික්ඛවෙ, මහණෙනි; අත්තදීපා, (සමුද්‍රමධ්‍යගත දුර්ගමනීයවූ දිපයක්මෙන්) ආත්මය පිහිටකොට; අත්තසරණා, ආත්මගතිකව; අනඤ්ඤසරණා, (මෙයින් පිටත්) අන්සරණක් නැතිව; ධම්මදීපා, ධර්මය පිහිටකොට; ධම්මසරණා, ධර්මගතිකව; අනඤ්ඤසරණා, (මෙයින් පිටත්) අන්‍යශරණයක් නැතිව (සතිපට්ඨානයම ශරණකොටගෙණ;) විහරථ, වාසයකරව්; භික්ඛවෙ, මහණෙනි; භික්ඛු, (යොගාවචර) භික්ෂුතෙම; අත්තදීපො, ආත්මගතිකව; අත්තසරණො, ආත්මගතිකව; අනඤ්ඤසරණො, අන්‍යශරණරහිතව; ධම්මදීපො, ධර්මය පිහිටකොට; ධම්මසරණො, ධර්මගතිකව; අනඤ්ඤසරණො, අන්‍ය ශරණයක් නැතිව; (සතරසතිපට්ඨාන භාවනාවෙන් යුක්තව,) කථඤ්ච විහරති, වාසයකිරීම නම් කවරේද?; භික්ඛවෙ, (ධර්මප්‍රතිග්‍රාහකවූ) මහණෙනි; ඉධ, මේ සර්වඥ ශාසන

යෙහි; ආතාපී, කෙලෙසුන් තවන වීර්‍ය්‍යඇත්තාවූ; සම්පජානො සතිමා භික්ඛු, සම්‍යක්ප්‍රඥාවෙන්හා සම්‍යක් සිහියෙන් යුක්තවූ මහණතෙම; ලොකෙ, පඤ්චුපාදානස්කන්ධයෙහි; අභිජ්ඣාදොමනස්සං, (බලවත්වූ) අභිධ්‍යාදෞර්මනස්‍ය යන දෙක; විනෙය්‍ය, (තදඞ්ගවිෂ්කම්භන යන ද්විප්‍රකාරවූ විනයෙන්) විනයනයකොට; කායෙ, (දෙතිස්කුනපකොට්ඨාසයයි කියනලද) කයෙහි; කායානුපස්සී, (අනිත්‍යදුඃඛඅනාත්මයෙන් යුක්තවූ දෙතිස්කුණපකොට්ඨාසයන්) අනුපස්සනා ප්‍රඥාවෙන් බලමින්; විහරති, සතරඊරියව්ව පවත්වන්නේය; වෙදනාසු, (නවවිධවූ) වෙදනාස්කන්ධයෙහිද; චිත්ත, (ෂොඩශප්‍රකාරවූ) චිත්තසමූහයෙහිද; ධම්මෙසු, (අභිධ්‍යාව්‍යාපාදාදිවූ) ධර්මසමූහයෙහිද; ආතාපී, සම්‍යක්ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුක්තවූ; සම්පජානො සතිමා භික්ඛු, සම්පජඤ්ඤසඞ්ඛ්‍යාතවූ ප්‍රඥාවෙන්හා සම්‍යක්ස්මෘතිමත්වූ මහණතෙම; ලොකෙ, පඤ්චුපාදානස්කන්ධයෙහි; අභිජ්ඣාදොමනස්සං, (දුරුකොටගතනොහැක්කාවූ) අභිධ්‍යාදෞර්මනස්‍ය දෙක; විනෙය්‍ය, (තදඞ්ගවිෂ්කම්භන ප්‍රහානයෙන්) දුරුකොට; ධම්මානුපස්සී විහරති, (පඤ්චනීවරණාදි) ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය; භික්ඛවෙ, මහණෙනි; භික්ඛු, (යොගාවචර) මහණතෙම, අත්තදීපො, ආත්මප්‍රතිෂ්ඨාවෙන්යුක්තව; අත්තසරණො, ආත්මගතිකයෙන් යුක්තව, අනඤ්ඤසරණො, අන්‍යශරණරහිතව; ධම්මදීපො, ධර්මය දිවයිනක් මෙන් ආධාරකොට; ධම්මසරණො, ධර්මශරණයෙන් යුක්තව; අනඤ්ඤසරණො, අන්‍යශරණරහිතව; එවං ඛො, මෙසේ වනාහි; විහරති, (යථොක්තප්‍රකාර සතරසතිපට්ඨාන භාවනාවෙන් යුක්තව) වාසය කරන්නේය; භික්ඛවෙ, මහණෙනි; සකෙ, ස්වකීයවූ; පෙත්තිකෙ විසයෙ, පිතෘස්ථානීයවූ (බුද්ධාදිඋත්තමයන්විසින් සෙවනාය කරණලද්දාවූ;) ගොචරෙ, (හැසිරෙන්නට යුක්තස්ථානවූ) ගොචරයෙහි; චරථ, හැසිරෙව්; භික්ඛවෙ, මහණෙනි; සකෙ. ස්වකීයවූ; පෙත්තිකෙ විසයෙ, පියපරම්පරාගතවූ විෂයෙහි; ගොචරෙ, (ෂඩාලම්බනවිරහිතවූ) ගොචරයෙහි; චරන්තා, හැසිරෙන්නාවූ තෙපි; ආයුනාපි වඩ්ඪිස්සථ, ආයුෂයෙනුදු වැඩෙන්නෙව්; වණ්ණෙනාපි වඩ්ඪිස්සථ, ශරීරවර්ණයෙනුදු වැඩෙන්නෙව්; සුඛෙනාපි වඩ්ඪිස්සථ, සැපයෙනුදු වැඩෙන්නෙව්, භොගෙනාපි වඩ්ඪිස්සථ, භොගයෙනුදු වැඩෙන්නෙව්; බලෙනාපි වඩ්ඪිස්සථ, බලයෙනුදු වැඩෙන්නෙව්:—

භික්ඛවෙ, මහණෙනි; භික්ඛුනො, භික්ෂූන්ගේ; කිඤ්ච ආයුස්මිං, ආයුෂයෙන් වැඩීම නම් කවරේද;? භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේ සර්වඥ ශාසනයෙහි; භික්ඛු, (ධ්‍යානයෙහි යෙදෙන්නාවූ) මහණතෙම, ඡන්දසමාධි, ඡන්දය අධිපතිකොට පැවැත්මෙන් ප්‍රතිලබ්ධ

වූ සමාධියෙන්හා; පධානසඞ්ඛාරසමන්නාගතං, චතුරසෘත්‍යසාධ
ක සම්‍යක්ප්‍රධාන වීර්‍ය්‍යයෙන් සමන්නාගතවූ; ඉද්ධිපාදං භාවෙති,
ඍද්ධිපාදය වඩන්නේය; විරියසමාධි, වීර්‍ය්‍යය අධිපතිකොට ප්‍රතිල
බ්ධවූ සමාධියෙන්හා; පධානසඞ්ඛාරසමන්නාගතං, චතුෂ්කෘත්‍යසා
ධක සම්‍යක්ප්‍රධානවීර්‍ය්‍යයෙන් සමන්නාගතවූ; ඉද්ධිපාදං භාවෙති,
ඍද්ධිපාදය වඩන්නේය; චිත්තසමාධි, චිත්තය අධිපතිකිරීමෙන්
ප්‍රතිලබ්ධවූ සමාධියෙන්හා; පධානසඞ්ඛාරසමන්නාගතං, සම්‍යක්
ප්‍රධානවීර්‍ය්‍යයෙන් සමන්නාගතවූ; ඉද්ධිපාදං භාවෙති, ඍද්ධිපාදය
වඩන්නේය; වීමංසාසමාධි, ප්‍රඥාව අධිපතිකිරීමෙන් ප්‍රතිලබ්ධ
වූ සමාධියෙන්හා; පධානසඞ්ඛාරසමන්නාගතං, චතුෂ්කෘත්‍යසා
ධක සම්‍යක්ප්‍රධානවීර්‍ය්‍යයෙන් සමන්නාගතවූ; ඉද්ධිපාදං භාවෙ
ති, ඍද්ධිපාදය වඩන්නේය; සො, ඒ යොගාවචර භික්ෂුතෙම, ඉ
මෙසං චතුන්නං ඉද්ධිපාදානං, (මාරබලප්‍රධ්වංසනය කිරීමට ස
මර්ථවූ) චතුර්විධ මේ ඍද්ධිපාදයන්ගේ; භාවිතත්තා, වඩවඩා භාවි
තාකළබැවින්; බහුලීකතත්තා, නැවත නැවත බහුලීකෘතබැ
වින්; ආකඞ්ඛමානො, කැමැත්තවන්නේවිනම්; කප්පං වා තිට්ඨෙය්‍ය,
කල්පය මුලුල්ලෙහි හෝ සිටින්නේය; කප්පාවසෙසං වා, කල්පාව
ශෙෂයක් හෝ සිටින්නේය, භික්ඛවෙ, මහණෙනි; ඉදං ඛො භික්ඛු
නො ආයුස්මිං වදාමි, (මම යම් ආයුෂයකින් තොපි වැඩෙන්නෙව්
යයි කීම්දගේ) මේ භික්ෂූන්ගේ ආයුෂයයි කියම්යි (වදාළසේක.)

භික්ඛවෙ, මහණෙනි; භික්ඛුනො, භික්ෂූන්ගේ; කිඤ්ච වණ්ණ
ස්මිං, (මහණෙනි තොපි යම් වර්ණයකින් වැඩෙන්නෙව්යයි පළ
මුවෙන් මාවිසින්දක්වනලදද ඒ මේ භික්ෂූගේ)වර්ණයෙන් වැඩීම
නම් කවරේද ?; භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේ ශාසනයෙහි; භි
ක්ඛු, මහණතෙම; සීලවා හොති, සිල්ඇත්තේ වේද; පාතිමො
ක්ඛ සංවරසංවුතො, ප්‍රාතිමොක්ෂ සංවරයෙන් යුක්තවූයේ; විහර
ති, වාසය කෙරේද; ආචාරගොචරසම්පන්නො, ආචාරශීලයෙන්
හා ඉන්ද්‍රියසංවරශීලයෙන් යුක්තවූයේ; අනුමත්තෙසු වජ්ජෙසු, අ
නුප්‍රමාණවූ වරදෙහි; භයදස්සාවී, භයදක්නාසුලුවූයේ; සමාදාය,
මනාකොටගෙණ; සික්ඛාපදෙසු, ශික්ෂාපදයන්හි; සික්ඛති, හික්
මේද; භික්ඛවෙ, මහණෙනි; ඉදං ඛො, මේ වනාහි; භික්ඛුනො,
භික්ෂූන්ගේ; වණ්ණස්මිං, ගුණකීර්ති ශරීරවර්ණ යයි (ප්‍රකාශකො
ට දක්වා කියම්යි වදාළසේක.)

භික්ඛවෙ, මහණෙනි; භික්ඛුනො,භික්ෂූන්ගේ; කිඤ්ච සුඛස්මිං,
ධ්‍යානප්‍රීතිසුඛ අනුභවකිරීම නම් කවරේද?; භික්ඛවෙ, මහණෙ
නි; ඉධ, මේ ශාසනයෙහි; භික්ඛු, (යොගාවචර) මහණතෙම;
කාමෙහි, වස්තුකාමක්ලෙශකාමයන්කෙරෙන්; විවිච්චෙව, වෙන්
වම, අකුසලෙහි ධම්මෙහි, (පඤ්චනීවරණාදිවූ) අකුශලධර්මයන්

කෙරෙන්; විවිච්ච, වෙන්වම, සවිතක්කං, විතර්කසහිතවූ; සවිචාරං, විචාරසහිතවූ; පීතිසුඛං, ප්‍රීතිහාසැපඇති; පඨමජ්ඣානං, ප්‍රථමධ්‍යානයට, උපසම්පජ්ජ, පැමිණ; විහරති, වාසයකරන්නේය. විතක්කවිචාරානං, විතර්කවිචාරදෙදෙනාගේ; වූපසමා, ව්‍යපසමනය කිරීම හෙතුකොටගෙණ, අජ්ඣත්තං සම්පසාදනං, ආධ්‍යාත්මිකසංස්කාරධර්මයන් පැහැදීම කරන්නාවූ, චෙතසො, චිත්තයසම්බන්ධවූ (හෙවත්) චිත්තයාගේ; එකොදිභාවං, එකාග්‍රභාවඇති; අවිතක්කං, විතර්කරහිතවූ; අවිචාරං, විචාරරහිතවූ; සමාධිජං, සමාධියෙන් උපන්නාවූ; පීතිසුඛං, ප්‍රීතිහාසැපඇති; දුතියජ්ඣානං, ද්විතීයධ්‍යානයට; උපසම්පජ්ජ, පැමිණ, විහරති, වාසයකරන්නේය; පීතියා ච විරාගා, ප්‍රීතියගේද විරාගය හෙතුකොටගෙණ, උපෙක්ඛකො ච, උපෙක්ෂාවෙන් යුක්තවූයේද; විහරති, වාසයකෙරේ; සතො ච, සම්‍යක්ස්මෘතියෙන් යුක්තවූයේද; සම්පජානො, ප්‍රඥාවෙන් යුක්තවූයේද; සුඛංච, සැපයද; කායෙන, කයින්; පටිසංවෙදෙති, විඳී. යං, යම්ධ්‍යානයක් හෙතුකොටගෙණ; තං, ඒ (තෘතීය ධ්‍යාන සමන්විතභික්ෂුතෙම,) උපෙක්ඛකො, උපෙක්ෂාඇත්තේය; සතිමා, සිහි ඇත්තේය; සුඛවිහාරී ඉති, සැපවිහරණ ඇත්තේයයි; අරියා, ආර්‍යයෝ; ආචික්ඛන්ති, කියද්ද; ! තං තතියජ්ඣානං, ඒ තෘතීයධ්‍යානය; උපසම්පජ්ජ, උපදවා; විහරති, වාසයකරන්නේය; සුඛස්සච පහාණා, සුඛයාගේප්‍රහාණයෙන්ද; දුක්ඛස්සච පහාණා, දුඃඛයාගේ ප්‍රහාණයෙන්ද; පුබ්බෙව, පළමුකොටම; සොමනස්සදොමනස්සානං, සොම්නස් දොම්නස් දෙදෙනාගේ, අත්ථගමා, විනාශකිරීම හෙතුකොටගෙණ, අදුක්ඛං, දුක්නැත්තාවූ; අසුඛං, සුඛරහිතවූ; උපෙක්ඛාසතිපාරිසුද්ධිං, උපෙක්ෂාසිහියෙන් පිරිසිදුවූ; චතුත්ථජ්ඣානං, චතුර්ථධ්‍යානයට; උපසම්පජ්ජ, සමවැද; විහරති, වාසයකරන්නේය; භික්ඛවෙ, මහණෙනි; ඉදංඛො, (මහණෙනි තොපි සැපයෙන් වැඩෙන්නෙව්යයි මාවිසින් පළමුවෙන් කියනලදද යේ) මේ වනාහි, භික්ඛුනො, භික්ෂුහුගේ; සුඛස්මිං වදාමි, ප්‍රීතිසැපයයි කියමියි වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි; භික්ඛුනො භොගස්මිං කිඤ්ච, (මහණෙනි තොපි සම් භොගයකින් වැඩෙන්නෙව්යයි පළමුවෙන් මා විසින් දක්වනලදද යේ මේ) භික්ෂුහුගේ භොගය නම් කවරේද?; භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේ සර්වඥශාසනයෙහි, භික්ඛු, (යොගාවචර) මහණතෙම; මෙත්තාසහගතෙන, මෛත්‍රීසහගතවූ; චෙතසා, (ෂට්විධදිශාස්ඵරණය කරන්නාවූ) චිත්තයෙන්; එකං දිසං, එක්තරා දිශාවක්; ඵරිත්වා, (සකලසත්වයන්කෙරෙහි මෛත්‍රීචෙතනා පතුරුවා) විහරති, වාසය කරන්නේය; තථා දුතියං, (යම්සේ පළමුවෙනි දිශාවද) එමෙන් දෙවෙනි දිශාවෙහිද (මේ

ත්‍රීපතුරුවන්නේය;) තථා තතියං, (දෙවෙනි දිශාවෙහි මෙන්) එ
සේම තෘතීය දිශාවෙහිද (මෛත්‍රීපතුරුවන්නේය;) තථා චතුත්ථිං,
(තෘතීයදිශාවෙහි මෙන්) එසේම සතරවෙනි දිශාවෙහිද (මෛත්‍රී
පතුරුවන්නේය;) ඉති, මෙම ක්‍රමයෙන්; උද්ධං (සත්වයන් ඇත්තා
වූ) ඌර්ධ්වදිශාවෙහිද (මෛත්‍රීපතුරුවන්නේය,) අධො, (ඌර්ධ්වදි
ශාවෙහි මෙන්) අධොදිශාභාගයෙහිද (මෛත්‍රී පතුරුවන්නේය,)
තිරියං, (අධොදිශාභාගයෙහි මෙන්) තීර්‍යග්දිශාවෙහිද; සබ්බධි,
හැමතන්හි; සබ්බත්තතාය, සියලු ආත්මයන් ඇතිබැවින්; සබ්බාව
න්තං, සියල්ලඇත්තාවූ; ලොකං, ලොකය; විපුලෙන, උදාරතර
වූ; මහග්ගතෙන, එහෙයින්ම මහත්වූ; අප්පමාණෙන, ප්‍රමාණාති
ක්‍රාන්තවූ; අවෙරෙන, (සකලසත්වයන් කෙරෙහි) වෛරයක් නැත්
තාවූ; අබ්‍යාපජ්ඣෙන, නිර්දුඃඛවූ; මෙත්තාසහගතෙන චෙතසා,
මෛත්‍රීසහගතවූ චිත්තයෙන්; ඵරිත්වා, දිගුත්පතුරුවා; විහරති, වාස
යකරන්නේය; කරුණාසහගතෙන චෙතසා, කරුණාසහව ගියාවූ
චිත්තයෙන්; එකං දිසං, (පළමුවෙන්) එක්තරාදිශාවෙක්; ඵරිත්වා, ප
තුරුවා; විහරති, වාසයකරන්නේය; තථා දුතියං, එසේම දෙවෙනි
දිශාස්ඵරණයකරන්නේය; තථා තතියං, එසේම තුන්වෙනිදිශා
ස්ඵරණයකරන්නේය; තථා චතුත්ථිං, එමෙන් සතරවෙනිදිශා ස්ඵ
රණයකරන්නේය; ඉති, මෙම ක්‍රමයෙන්; උද්ධං, ඌර්ධ්වදිශාස්ඵරණ
යකරන්නේය; අධො, (එසේම) අධොදිශා ස්ඵරණයකරන්නේය,
තිරියං, (එසේම) තීර්‍යග්දිශාස්ඵරණයකරන්නේය; සබ්බධි, හැම
තන්හි; සබ්බත්තතාය, සර්වාත්මයන් ඇතිබැවින් (මෛත්‍රීචිත්ත
ස්ඵරණයකරන්නේය;) සබ්බාවන්තං, සියලු සත්වයන් ඇත්තාවූ;
ලොකං, ලොකය; විපුලෙන, මහත්වූ; මහග්ගතෙන, එහෙයින්
මහත්බවටගියාවූ; අප්පමාණෙන, ප්‍රමාණාතික්‍රාන්තවූ; අවෙරෙ
න, වෛරරහිතවූ; අබ්‍යාපජ්ඣෙන, නිර්දුඃඛවූ; (හෙවත් සකලස
ත්වයන්කෙරෙහි දුඃඛජනනයක්නැත්තාවූ;) කරුණාසහගතෙන
චෙතසා, කරුණාසහව ගියාවූ චිත්තයෙන්; ඵරිත්වා, දිශාස්ඵරණය
කොට; විහරති, වාසයකරන්නේය; මුදිතාසහගතෙන, සියලු ස
ත්වයන්කෙරෙහි මුදිතාසහවගියාවූ; චෙතසා, චිත්තයෙන්; එකං
දිසං, (ප්‍රථමයෙන්) එක්තරාදිශාවක්; ඵරිත්වා, ප්‍රීතිචිත්ත ස්ඵරණය
කොට; විහරති, වාසයකරන්නේය; තථා දුතියං, එසේම ද්විතීයදි
ශාවද; තථා තතියං, එසේම තෘතීයදිශාවද; තථා චතුත්ථිං, එසේ
ම සතරවෙනිදිශාවද, (මුදිතාව පතුරුවන්නේය;) ඉති, මේ යථො
ක්තක්‍රමයෙන්; උද්ධං, උපරිම දිශාවද (ප්‍රීතිස්ඵරණය කරන්නේ
ය;) අධො, හෙට්ඨිමදිශාවද (ප්‍රීතිස්ඵරණයකරන්නේය;) තිරියං,
තීර්‍යග් දිශාවද (ප්‍රීතිස්ඵරණයකරන්නේය,) සබ්බධි, හැමතන්හි;
සබ්බත්තතාය, සියලුසත්වයන් ඇතිබැවින් (මුදිතාවපතුරුවන්නේය,)

සබ්බාවන්තං, සියලු සත්වයන් ඇත්තාවූ; ලොකං, ලොකය; විපුලෙන, විපුලවූ, මහග්ගතෙන, මහත්බවට ගියාවූ; අප්පමාණෙන, ප්‍රමාණාතික්‍රාන්තවූ, අවෙරෙන, අවෛරවූ; අබ්‍යාපජ්ජෙන, නිදුක්ඛවූ; මුදිතාසහගතෙන, මුදිතාසහගතවූ; චෙතසා, නිර්මලවූ චිත්තයෙන්, ඵරිත්වා, ඵරණයකොට; විහරති, වාසයකරන්නේය; උපෙක්ඛාසහගතෙන, උපෙක්ෂාසහගතවූ, චෙතසා, (අතිපරිශුද්ධවූ) චිත්තයෙන්; එකං දිසං, (ප්‍රථමයෙන්) එක්තරා දිශාවක්; ඵරිත්වා, ඵරණයකොට; විහරති, වාසයකරන්නේය; තථා දුතියං, එමෙන් ද්විතීයදිශාවද පතුරුවන්නේය, තථා තතියං, එමෙන් තෘතීයදිශාස්ඵරණයකරන්නේය; තථා චතුත්ථං, එමෙන් සතරවෙනි දිශාස්ඵරණයකරන්නේය; ඉති, මෙසේ (යථොක්තක්‍රමයෙන්;) උද්ධං, උපරිමදිශාවද එසේමය, අධො, හෙට්ඨිමදිශාවද එසේමය; තිරියං, තිර්යග්දිශාවද එසේමය; සබ්බධි, හැමතන්හි; සබ්බත්තාය, සර්වාත්ම ඇත්බැවින් (උපෙක්ෂාව පතුරුවන්නේය;) සබ්බාවන්තං ලොකං, සර්වසත්වලොකය; විපුලෙන, විපුලවූ; මහග්ගතෙන, මහග්ගතවූ; අප්පමාණෙන, අප්‍රමාණවූ, අවෙරෙන, අවෛරවූ; අබ්‍යාපජ්ජෙන, නිදුක්ඛවූ; උපෙක්ඛාසහගතෙන, උපෙක්ෂාසහගතවූ; චෙතසා, (අතිපරිශුද්ධවූ) චිත්තයෙන්; ඵරිත්වා, පතුරුවා; විහරති, චතුර්විධඊර්යාපථය පවත්වන්නේය; භික්ඛවෙ, මහණෙනි; භික්ඛුනො, (යොගාවචර) භික්ෂුහුගේ; ඉදං ඛො, මේවනාහි; භොගසම්පං වදාමි, භොගයයි කියම්හි වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි; භික්ඛුනො, භික්ෂුහුගේ; කිඤ්ච බලස්මිං, බලය නම් කිමෙක්ද ? භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේ සර්වඥශාසනයෙහි, භික්ඛු, (යොගාවචර) මහණතෙම; ආසවානං ඛයා, චතුරාශ්‍රවයන් ක්ෂයකිරීමෙන්; අනාසවං, ආශ්‍රවයන් රහිතවූ; චෙතොවිමුත්තිං, (චතුරාශ්‍රවයන්ගෙන් විනිර්මුක්තවූහෙයින් චෙතොවිමුක්තිනම්වූ) චිත්තයාගේමිදීමද; පඤ්ඤාවිමුත්තිං, ප්‍රඥාවිමුක්තියයි කියනලද අර්හත්ඵලඥානයද; දිට්ඨෙව ධම්මෙ, ඉහාත්මභාවයෙහිම; සයං අභිඤ්ඤාය, තමාවිසින්ම දැන; සච්ඡිකත්වා, සාක්ෂාත්කොට; උපසම්පජ්ජ, රහත්බවඋපදවා; විහරති, වාසයකරන්නේය; භික්ඛවෙ, මහණෙනි; ඉදං ඛො, මේ වනාහි; භික්ඛුනො, භික්ෂුහුගේ; බලස්මිං වදාමි, (අර්හත්ඵලසඞ්ඛ්‍යාත ශ්‍රෙෂ්ඨවූ) බලය (ප්‍රකාශකරන්නෙමියි වදාළසේක— භික්ඛවෙ, මහණෙනි; ඉදං මාරබලං, (දෙවපුත්‍ර මාරමෘත්‍යු මාර ක්ලෙශමාර ස්කන්ධමාර අභිසංස්කාර මාරයන පඤ්චමාරයන්ගේබලය; යථා, යම්සේ; දුප්පසහං, මැඬීනය නොකොටහැක්කේද; භික්ඛවෙ, මහණෙනි; අඤ්ඤං එකබලම්පි, (අර්හත්ඵලසඞ්ඛ්‍යාත ශ්‍රෙෂ්ඨවූ බලයහැර) අනිකුදු අසහායවූ බලයක්; අහං, මම; න සමනුපස්සාමි, (මාගේ සර්වඥතාඥාන

යෙන්) නොදක්නෙමි; භික්ඛවෙ, මහණෙනි; කුසලානං ධම්මානං, කුශලධර්මයන්ගේ; සමාදානහෙතු, සමාදන්වීම හෙතුකොටගෙණ; එවං, මෙසේ; ඉදං පුඤ්ඤං, (ලෞකික ලොකොත්තරවූ) මේ කුශලධර්මය; පවඩ්ඪති, වර්ධනයවන්නේයයි වදාළසේක.

භගවා ඉදං අවොච, (සකලජනපතලකරුණානිධානවූ චාතුරක බාහුවන්දිතවරණාරවින්දුමනොඥපශොභිතලොකාලොකදිවාකරවූ තිලොගුරු) සම්‍යක්සම්බුද්ධරජානන්වහන්සේ මෙසේ (මේ අතීත්ඵල ඥානයෙන් දෙශනාව කුළුගන්වා ලෞකිකලොකොත්තර සම්පත්නැමැති නානාවිධ රත්නසමූහයෙන් වශීකරන්නාවූ මේ උනම්වූ සර්වඥබල ප්‍රකාශිතවූ විසිතුරු ධර්මදෙශනාවෙන් යුක්තවූ "චක්‍රවර්තිසිංහනාද" සූත්‍රාන්තධර්මදෙශනාව නිෂ්ටාව ටපමුණුවා) වදාළසේක්--අත්තමනා තෙ භික්ඛු, (සර්වඥගතප්‍රීතීන්) ඔදවැඩුනාවූ ඒ භික්ෂූහු; භගවතො භාසිතං, විචිත්‍රනය දෙශනාවිලාශයෙන්යුක්තවූ චක්‍රවර්ති දශරාජධර්මයන්ගේ විපාකානිසංසයයි කියනලද ලෞකිකධර්මයන්ද ශීලසමාධි ප්‍රඥාවිමුක්ති විමුක්ති ඥානදර්ශන නිර්වාණයයිකියනලද ලොකොත්තර ධර්මයන්ද යන මේ ලෞකිකලොකොත්තර ත්‍රිසද්ධර්මනැමැති නානාවිධවූ රත්නයෙන් අලඞ්කෘත ආකාර ශ්‍රෙනින් සමලඞ්කෘතවූ මේ ඒ "චක්‍රවර්ති සිංහනාදසූත්‍රාන්ත" ධර්මදෙශනාව කුරවීකමධුරනාදයක්මෙන් කර්ණරසායනවූ පණ්ඩිතජනයන්ගේ හෘදයට අමෘතාභිෂෙකයක්හා සදෘශවූ බ්‍රහ්මස්වරයෙන් දෙශනාකරවූ රත්නාව දිව්‍ය බ්‍රහ්මාර්‍ය විහාරකායචිත්තොපධිවිවෙකපූර්ණ්‍යතාප්‍රණීතිතානිමිත්තවිමොක්ෂ පඤ්චාභිඥාදිවූ ලෞකිකලොකොත්තරඋත්තමමනුෂ්‍යධර්මයන් භජනයකළහෙයින් භාග්‍යවත්නම්වූ) සම්‍යක්සම්බුද්ධසර්වඥරාජොත්තමයානන්වහන්සේගේ වචනය; අභිනන්දුංති, සන්තොෂයෙන් අනුමොදන්ව (සුභාසිතය සුලපිතය සාධුසාධුයි කියා) මස්තකයෙන් පිළිගත්තාහුය:—

මේ චක්‍රවර්ති සිංහනාද සූත්‍රාන්තධර්මදෙශනාවගේ කෙළවර පුන්සඳමඬල පිරිවැරූ තරුපෙළක් වැනිවූ බුදුන් පිරිවරා සිටි විසිදහසක් පමණ භික්ෂූහු පොළවහා සමානව සිටි කෙලෙස්නැමැති ශත්‍රූන් අර්හත්මාර්ගඥාන නමැති ඛඩ්ගයෙන් කපා හැර සිව්පිළිසිඹියාපත් රහත්වූවාහුය සූවාසූදහසක් ප්‍රාණීහු අමාමහ නිවන් දුටුවාහුය:—

චක්‍රවර්තිසිංහනාද සූත්‍රසන්නය

නිමි.

# දැ න් වී ම යි.

## ච ක්‍ර ව ර්ති සිං හ නා ද සූ ත්‍ර ස න් න ය.

අනාගතවංශ ප්‍රකාශකවූ මේ සූත්‍රාන්තධම්මදෙශනාවෙන් මාතුලානම්නුවරවාසීන් ඇතුළුවූ දෙව්මිනිසුන් සහිත අසූසාරදහසක් ප්‍රාණීන්ට ධම්මාභිසමයවනබව සම්‍යක්සම්බුද්ධසර්වඥරාජෝත්තමයානත්වහන්සේවිසින් දැකවදාරා විසිදහසක්පමණ භික්ෂුසංඝයාවහන්සේ පිරිවරාගෙණ මාතුලානම්නුවරට වැඩවදාරා දිව්‍යමනුෂ්‍යයන් සහිත මහපිරිස්මැද මාතුලනම් වෘක්ෂමූලයෙහිදී දෙශනාකරණ ලද්දේය.

මෙහි චක්‍රවර්ත්ති දශරාජධම්මය මනුෂ්‍යයින්ගේ ආයුවර්ණාදි සම්පත් අඩුවැඩිවීමේ හෙතුව මිථ්‍යාදෘෂ්ටිආදි අකුශලධම්මයන් විපුලභාවයට පැමිණි කාලපරිච්ඡෙද යනාදිය විස්තරයෙන් ප්‍රකාශවූ වට්ටගාමී කුශලාකුශලයද “අත්තදීපා භික්ඛවෙ විහරථ” යනාදීන් සතරසතිපට්ඨානය චතුර්විධසෘද්ධිපාදය ශීලය චතුර්ධ්‍යානය බ්‍රහ්මවිහාරය ආශ්‍රවක්ෂය යන විවට්ටගාමී කුශලයද මේ දෙශනාවෙහි විස්තරයෙන් ප්‍රකාශිතයි.

ලොකස්වභාව ආයුවර්ණාදීන්ගේ විපරිනාම ස්වභාව ලෞකික ලොකොත්තර සැප යනාදි ධම්මයන් පහසුවෙන් අවබොධකළ හැකිවූ මේ උතුම් සූත්‍රදෙශනාව විජානනාභිලාෂී සියල්ලන්විසින් සමාදරයෙන් භාවිතාකිරීමෙන් ලෞකිකලොකොත්තරසැප සිද්ධ කටයුතුයි.

මේ සූත්‍රය දීඝ නිකායෙහි (දික්සඟියෙහි) පාථිකවර්ගයට ඇතුළත් තුන්වෙනි සූත්‍රය වේ.

මෙහි සන්න කර්තෘවිසින් සන්නලියනලද්දේ භාවාර්ථයම ගරුකොටබව හැඟෙනබැවින් යම් යම් දෙස් ඇතත් එය අර්ථාවබොධයට බාධානොමැතිසේසි සැලකියයුතුයි.